ජනතා අදහස් මතින් පණ පෙවුණු
ශ්‍රී ලංකාවේ ප්‍රථම

# ජාතික උපාය මාර්ගික සැලැස්ම

ජනාධිපතිවරණය - 2024



සර්වජන බලය

சர்வசன அதிகாரம் • SARVAJANA BALAYA

# පටුන


ජාතික ප්‍රමුඛතා ලෙස අත්‍යවශ්‍ය නිවැරැදි කිරීම් 3

ප්‍රවේශය 5

ව්‍යවසායකත්ව රාජ්‍යයක් 8

සමානාත්මතාවය සහ සෞභාග්‍යය මඟින් සතුටු දැයක් නිර්මාණය කිරීම 9

ඒකාබද්ධ ආණ්ඩුකරණය සහ එකිනෙකට බැඳුණු උපාය මාර්ග 10

මානව සම්පත් අභිප්‍රේරණ චක්‍රය 12

අපේ භෞතික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතය 14

මූල්‍ය සම්පත් සඳහා පිටුබලය 16

ව්‍යවසායකත්ව රාජ්‍යයේ මූලිකාංග 18

අධ්‍යාපනය - 'විශිෂ්ටයෝ' 20

සෞඛ්‍යය - 'සුවපත් මිනිසුන්' 22

පරිසරය - 'හරිත දිගන්තය' 24

රාජ්‍ය පරිපාලනය සහ කළමනාකරණය - 'සුහුරු පාලනයක්' 26

ජාතික ආරක්ෂාව - 'රන්වැට' 28

ආර්ථිකය - 'පොහොසත්' 30

නූතන මූල්‍ය සම්පත් කළමනාකරණය පිළිබඳ දැක්ම - 'ධනවත්' 33

විදේශ සබඳතා - 'බහු බැඳි නිදහස' 36

සමාජ සුබසාධනය - 'හිතේ හයිය' 37

තාරුණ්‍යය - 'පළමුව තාරුණ්‍යය' 39

සංස්කෘතිය හා කලාව - 'පහන් පැල' 41

යුක්තිය - 'සැමට සම සේ' 43

ක්‍රීඩාව - 'ගතට සිතට' 45

තාක්ෂණය - 'බිසෝකොටුවෙන් ඔබ්බට' 47

ජාතික සමගිය - 'එකම මුතු' 49

වැව්ලි, කෘෂිකර්මය සහ පශු සම්පත් - 'ගොවිවරු' 50

නීල ආර්ථිකය - 'නිල්වන්' 52

කර්මාන්ත - 'පන්නරය' 53

නාවික, ගුවන් සහ අභ්‍යන්තර ප්‍රවාහන යටිතල පහසුකම් - 'ජීව නාලිකා' 55

ප්‍රවාහනය - 'ගතට සතුට' 56

බලශක්තිය - 'බලයෙන් බලවත්' 57

දේශපාලන ප්‍රතිසංස්කරණ - 'උඩු ගං බලා' 59

ණය කළමනාකරණය 61

# එක්ව නංවන රටක් - සතුට පිරුණු දැයක්

## සර්වජන අදිටන් සම්මුතිය

අපගේ සදාදරණීය මාතෘභූමියත් එහි වෙසෙන සිංහල, දෙමළ සහ මුස්ලිම් යනාදි සකලවිධ ජනතාවත් මුහුණ දී සිටින්නේ නිදහසින් පසු යුගයේ දැවැන්තම ආර්ථික, සමාජයීය, දේශපාලනික, පාරිසරික සහ සංස්කෘතික පරිහානියටයි. අප මේ අර්බුදයන්ට මුහුණ දෙන මොහොතේ ගෝලීය සන්දර්භය එකී අර්බුදයන් තීව්‍ර කරන්නට දායක වෙමින් පවතී.

"මිහිතලය අයිති මිනිසාට පමණකි" යන සංකල්පයේ පිහිටා කාර්මික විප්ලවයෙන් ද හරිත විප්ලවයෙන් ද සිදු කළ දැවැන්ත පාරිසරික විනාශය හමුවේ මිනිසුන් පමණක් නොව සමස්ත මිහිතලය ම අද පැවැත්මේ තර්ජනයකට මුහුණ දී සිටී. වරක් සුළි කුණාටු ලෙසින් ද තව වරක මහ වැසි ලෙසින් ද තවත් වරක නියඟ ලෙසින් ද අපට දැනෙන්නේ පාරිසරික විනාශය හමුවේ සොබාදහමේ කුපිත වීමයි.

සොබාදහම මිනිස් සංහතියේ පැවැත්මට තර්ජන එල්ල කරන මොහොතේ සාමූහික ව ඊට මුහුණ දෙනු වෙනුවට රාජ්‍යයන් ලෙස වෙන් වී මිනිස් ගුණ වළලමින් කලාපීය යුද ගැටුම් ලෝකය පුරා මතු වී ඇත. යුද ගැටුම් ලෙස ප්‍රකාශ වන්නේ සමස්ත ලෝකය ම වෙළී ඇති ආර්ථික සහ සංස්කෘතික පරිහානියයි.

ලොව මුහුණ පා ඇති ආර්ථික, පාරිසරික සහ සමාජයීය අර්බුදයන්ට විසඳුම් ප්‍රගතිශීලිත්වය, පරිසර හිතකාමීත්වය, අල්පේච්ඡත්වය, සාමූහිකත්වය සහ සමානාත්මතාවය මත පදනම් වුණු අපගේ සභ්‍යත්ව රාජ්‍යය තුළ ගැබ් වී ඇති බැව් අපි විශ්වාස කරමු. ජාති ආගම් භේදයකින් තොරව මේ උතුම් රට මව්බිම කරගත් සකලවිධ ජනතාවගේ උරුමය වුණු අපේ සභ්‍යත්වය දැවෙන ලොව සැනසීමට සමස්ත මානව වර්ගයා වෙත දායාද කළ හැකි බව ප්‍රකාශ කරන්නේ මහත් වූ අභිමානයෙනි.

අවාසනාවට එකී උරුමයන් පසෙක දමා ජාතික ආර්ථිකය බිඳ දමමින් ආනයන මත රැඳෙන ආනයන මූල්‍යනයට වාණිජ ණය ලබා ගන්නා නව ලිබරල්වාදී ආර්ථික දැක්ම 1977න් පසු බිහි වුණු සෑම ආණ්ඩුවකම ප්‍රතිපත්තිය විය. එකී නව ලිබරල්වාදී ආර්ථික උගුලේ දිගු කාලයක් පැටළී සිටීමේ ප්‍රතිඵලයක් ලෙස අප අද ණය ගෙවා ගැනීමට නොහැකි වීමෙන් බංකොලොත් වුණු සිඟමන් යදින පරාධීන ජාතියක් බවට පත් වී ඇත. ණය ගැති බවේ අසරණකම අයුතු ලෙස භාවිත කරමින් ජාත්‍යන්තර මූල්‍ය ආයතන ද බලවත් රටවල් ද ශ්‍රී ලංකාව මත සිය ග්‍රහණය තර කරමින් සිටී. එබැවින් වසර දහස් ගණනක් අපේ මුතුන් මිත්තන් දිවි පුදා සුරැකි ස්වාධීනත්වය අපට අහිමි වීමේ අවදානමක් ඉතිහාසයේ නොවූ විරූ ලෙසින් මතු වී ඇත.

ආනයන මත රැඳීමෙන් බිහි වුණු ගෙවුම් ශේෂ අර්බුදය හෙවත් විදේශ විනිමය අර්බුදයට අමතර ව ගජ මිතුරන්ට බදු සහන ලබා දීමෙන් ද දූෂිත පාලකයින් සහ නිලධාරීන් විසින් බදු පැහැර හරින්නන් රකිමින් ද දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම අවම රටවල් අතරට අප මව්බිම ද තල්ලු කර ඇති අතර අතාර්කික නාස්තිකාර වියදම් හමුවේ එය රාජ්‍ය මූල්‍ය අර්බුදයක් හෙවත් අයවැය අර්බුදයක් බවට පත් කර ඇත.

ගෙවුම් ශේෂ අර්බුදයටත් රාජ්‍ය මූල්‍ය අර්බුදයටත් විසඳුම් ලෙස ඉහළ පොලී මත කෙටිකාලීන වාණිජ ණය ලබා ගැනීමෙන් ද ණය ගෙවීමට දිගුකාලීන වැඩපිළිවෙළක් නොතිබීම හේතුවෙන් ණය ගෙවීම සඳහා ණය ලබා ගැනීමෙන් ද ණය කළමනාකරණය අභියෝගයක් බවට පෙරළමින් ණය අර්බුදයක් ද බිහි වී ඇත.

අපගේ හර පද්ධතිය විනාශ කර එහි අළු මත ඉදි කළ වත්මන් සමාජය විසින් මිනිස් ජීවිතවලට හුදු රුපියලින් අගය නියම වුණු ප්‍රචණ්ඩ සංස්කෘතියක් ද අවම අවශ්‍යතා ඉටු නොවීමෙන් අපේක්ෂා භංගත්වයට පත් තරුණ පරපුර මත්ද්‍රව්‍ය තුළින් ද හුදෙකලා වීමෙන් ද ව්‍යාජ ආශ්වාදයක් සොයන තත්ත්වයට පත් ව සිටී.

නිදහසින් පසු අපගේ සභ්‍යත්ව රාජ්‍යය ගොඩ නැඟීමට අප අසමත් වීමෙන් ජන කණ්ඩායම් අතර පවතින අසහනය සහ අවිශ්වාසය මතු වන්නේ වාර්ගික ගැටුම් සහ ත්‍රස්තවාදී ක්‍රියා ලෙසිනි. එකී අසහනයන් රාජ්‍යය අස්ථාවර කිරීමේ ද රාජ්‍යය වක්‍රව පාලනය කිරීමේ ද මෙවලම් ලෙසින් භාවිත කිරීමට ලෝක බලවත්තු පෙළඹී සිටී.

යටත් විජිත අධ්‍යාපන ප්‍රතිපත්තියෙන් මිදීමට නොහැකි වීමේ ශාපයෙන් ජාතියේ අභිමානවත් උරුමයක් වුණු ව්‍යවසායක මනස අපට අහිමි වී නිර්මාණශීලිත්වය, සම්පත් කාර්යක්ෂම කළමනාකරණය සහ අවදානම් දැරීමේ හැකියාව අපෙන් තුරන් වී ඇත. ඒ නිසාම විජාතික සංකල්ප තුළින් අපේ ප්‍රශ්න විසඳාගැනීමට තැත් කරන දීන ජාතියක් බවට අප පත් වී ඇත.

අපේ ආදරණීය මව්බිම මුහුණ දී ඇති මෙකී අභියෝගයන් පිළිබඳ කම්පනයට පත් වී ඇති මතු අත්සන් තබන පක්ෂ නායකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි විවේචනය වෙනුවට විසඳුම් පිළිබඳ ද, පොරොන්දු වෙනුවට උපාය මාර්ගික වැඩපිළිවෙළක් පිළිබඳ ද, විශ්වාසය තබමින් අපේ උරුමය මත දෙපා තබා ලොව සාධනීය නැවුම් ප්‍රවණතා උකහා ගනිමින් නැගී සිටින අදීන නවීන සුහුරු ජාතියක් බිහි කරනු වස් මතු දැක්වෙන මූලික ප්‍රතිපත්ති මේ මහපොළොවේ රෝපණය කිරීමට සාමූහිකව ප්‍රයත්න දැරීමේ අදිටනින් සම්මුතියට එළැඹුණු බවත් මෙකී ප්‍රතිපත්ති මත පිහිටා සැකසෙන උපාය මාර්ගික වැඩසටහන මෙසේ ජාතියට තිළිණ කරමු.

# එකී අරමුණ ඉටු කර ගනු වස්

01. ආත්ම විශ්වාසය බිඳ වැටුණු සර්ව අශුභවාදී මානසිකත්වය වෙනුවට අභිමානය සහ ආත්ම විශ්වාසය පිරුණු ව්‍යවසායක මනසකින් යුත් අභිප්‍රේරිත ජාතියක් ගොඩනැගීමට පදනම දැමීමට ද

02. දැනුමින් පිරිපුන් නිරෝගී ජාතියක් බිහි කරන නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවාව යාවත්කාලීන කරමින් තහවුරු කිරීමට ද විශේෂ හේතු මත රැකවරණය ලැබිය යුතු ඉලක්කගත සියලු කණ්ඩායම් වෙත රාජ්‍ය ශුභසාධනය සැපයීමට ද

03. දේශීය සම්පත්, දැනුම සහ මානව ප්‍රාග්ධනය මත පදනම් වී රටටත් ලොවටත් අනගි දේ නිපදවන ජාතික ආර්ථිකයක් බිහි කිරීමට ද

04. ව්‍යවසායකත්ව මනසින් කළමනාකරණය දෙස බලන සවිමත් රාජ්‍ය, පෞද්ගලික සහ සමූපකාර අංශ ගොඩ නැගීමට ද

05. අපනයන වෙළෙඳපොළ සහ භාණ්ඩ හා සේවා විවිධාංගිකරණයෙන් ද එකතු කළ අගයන් ඉහළ නැංවීමෙන් ද අපනයන ආදායම ඉහළ නැංවීමට ද එකී ආදායම මව්බිමට ගෙන එන බව තහවුරු කිරීමට ද

06. පසුගිය සමයේ සිදුවුණු මහ පරිමාණ දූෂණ විමර්ශනය කර සොරා ගත් ධනය ජනසතු කර වැරදිකරුවන්ට දඬුවම් කිරීමට සහ සෑම පුද්ගලයෙකුටම අනන්‍ය කේත අංකයක් ලබා දීමෙන් ද සියලුම ගෙවීම් පරිගණකගත කිරීමෙන් ද බදු පැහැර හැරීම ඇතුළු සමස්ත දූෂණය තුරන් කරන සුහුරු ආර්ථික පද්ධතියක් බිහි කිරීමට ද

07. තිරසර සංවර්ධන උපාය මාර්ග කෘෂිකර්මය, බලශක්ති, කර්මාන්ත, ඉදිකිරීම් ආදී ක්ෂේත්‍රයන්ට හඳුන්වා දී මිනිසාගේ පමණක් නොව සමස්ත ජීවින්ගේ ඉදිරි පැවැත්ම තහවුරු කිරීමට ද

08. බහුධ්‍රැව ලෝකය අවබෝධ කරගනිමින් ජාතික ප්‍රමුඛත්වය මත පදනම් වූ උපාය මාර්ගිකව ලොව ඕනෑම රටක් හෝ රටවල් සාමූහිකයක් සමග සමතලයක සිට ගනුදෙනු කිරීමට ද

09. සභ්‍යත්ව රාජ්‍යයේ උරුමය මත පදනම්ව ජාති ආගම් කුල භේදයකින් තොර අභිමානවත් නවීන ජාතියක් ගොඩනැගීමට ද

10. සතුට සැබෑ ධනය ලෙස දකිමින් භෞතික, මානසික සහ ආධ්‍යාත්මික සංවර්ධනය තුලනාත්මක කරමින් සතුටු දැයක් නිර්මාණය කිරීමට ද මෙයින් සපථ කර සිටිමු.

# ජාතික ප්‍රමුඛතා ලෙස අත්‍යවශ්‍ය නිවැරැදි කිරීම්

## දූෂිතයන්ට දඬුවම් කිරීම

- 1971 දී අපරාධ යුක්ති කොමිෂන් සභාව පිහිටු වූ ආකාරයට 2010 සිට 2024 දක්වා කාලය ආවරණය වන ලෙස රටේ සිදුවූ බවට චෝදනා එල්ල වන සියලුම වංචා සහ දූෂණ පිළිබඳව පරීක්ෂා කිරීම සහ වැරදිකරුවන්ට දඬුවම් ලබා දීම සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීම.

- වංචා, දූෂණ හා නාස්තිය පිටුදැකීමට ජාතික විගණන කොමිසම සිය වාර්තා හරහා හෙළිදරව් කරන දූෂණ පිළිබඳ යෝජිත මහජන අභිචෝදක විසින් නිශ්චිත කාලරාමුවක් තුළ නඩු පවරන බවට සහතික වන නීති සම්පාදනය කිරීම.

- වංචා කිරීම සහ ගෙවීම් පැහැරහැරීම හෝ පමා කිරීම හේතුවෙන් පසුගිය සමයේ රජයට අහිමි වූ බිලියන දහස් ගණනක බදු ආදයම අයකර ගැනීම සහ මහාපරිමාණ ජාවාරම්කරුවන් විසින් රාජ්‍ය වාණිජ බැංකු දෙකට ගෙවීම් පැහැර හැර ඇති රුපියල් බිලියන 650කට අධික ණය නැවත අයකර ගැනීමත් වැරදිකරුවන්ට දඬුවම් කිරීමටත් විශේෂ කොමිෂන් සභාවක් පිහිටුවීම. එකී ආදයම යොද ගනිමින් මහජනතාව මත පටවා ඇති අධික බදු බර කෙටි කාලීනව සැහැල්ලු කිරීම.

## රණවිරුවන් සුරකිමු

- ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුද නිලධාරීන් ජාත්‍යන්තර අධිකරණ බලයට ගොදුරු කිරීම සහ රට තුළ ජාත්‍යන්තර මැදිහත්වීමකට ඉඩ සැලසීම යන යටි අරමුණු සහිතව ඉදිරිපත් කර ඇති සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා පනත් කෙටුම්පත අත්හිටුවීම. ඒ වෙනුවට සැබෑ ලෙසම අතුරුදහන් වූවන් පිළිබඳව සොයා බලා සාධාරණය ඉටුකිරීම සඳහා දේශීය යාන්ත්‍රණයක් හඳුන්වා දීම.

- රණවිරු දඩයම යටි අරමුණ කරගත් සියලු පනත් සමාලෝචනය කිරීම. ජාතික ආරක්ෂාව දුර්වල කරමින් පසුගිය ආණ්ඩු ගෙන ඇති තීන්දු සියල්ල සමාලෝචනය කර නිවැරදි කිරීම. දිවි පිදූ රණවිරුවන්ගෙන් යැපෙන්නන්ට සහ ආබාධිත රණවිරුවන්ට ලැබිය යුතු එහෙත් දනට අත්හිටුවා ඇති සියලුම සහන සහ වරප්‍රසාද නැවත ලබා දීම.

## පාස්කු වින්දිතයන්ට යුක්තිය

- පාස්කු ප්‍රහාරයේ වින්දිතයින්ට සැබෑ ලෙසම සාධාරණය ඉටුකිරීමට සහ අනාගතයේ දී ආගමික අන්තවාදී පීඩාවෙන් සමස්ත ජාතිය ගලවා ගැනීම සඳහා ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අන්තර් අමාත්‍යාංශ කාර්යසාධක බළකායක් පත් කිරීම.

- පාස්කු ප්‍රහාරයට අදළව සිදු කළ සියලුම පරීක්ෂණවල වාර්තා අධ්‍යයනය කර ගතයුතු පියවර පිළිබඳ නිර්දේශ ලබාදීමට කමිටුවක් පත්කිරීම හා නිර්දේශ නිශ්චිත කාලරාමුවක් තුළ ක්‍රියාත්මක කිරීම.

## ආර්ථික පරාධීනත්වය පිටුදැකීම

- මහබැංකුව ස්වාධීන කිරීමේ නාමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර ආයතන විසින් පාලනය කිරීමට අවස්ථාව සැලසූ 2023 නව මහ බැංකු පනත සහ විදේශ විනිමය අර්බුදයට මූලික හේතුවක් වී ඇති විදේශ විනිමය වංචා දිරිමත් කෙරෙන 2017 විදේශ විනිමය පනත සංශෝධනය කිරීම.

- රාජ්‍ය ණය කළමනාකරණ පනත, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත හා ආර්ථික පරිවර්තන පනත යන පනත් ත්‍රිත්ත්වය මගින් රටේ මූල්‍ය පද්ධතිය සහ ආර්ථික කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය අත්තනෝමතික ලෙස ඒකාධිපතිකරණය කිරීමට ගනු ලබන උත්සාහය මෙම පනත් අහෝසි කිරීම මගින් පරාජය කිරීම.

- ශ්‍රී ලංකාවට විශාල පීඩනයක් එල්ලවීමට හේතු වී ඇති ස්වෛරී බැඳුම්කර මිල දී ගන්නා ලෙස සහ එම බැඳුම්කර දීර්ඝ කාලයක් තුළ ආපසු ගෙවීමට ඉඩ සලසන ලෙස යෝජනාවක් ඉන්දියාව, චීනය, ජපානය, ඇමෙරිකාව වෙත ඉදිරිපත් කිරීම මගින් අවම කොන්දේසි සහ ඉහළම සහන ලබාදෙන පාර්ශ්වය සමග එකඟතාවයක්
ලබා ගැනීම.

- රාජ්‍ය ආයතන විකිණීම වළක්වමින් එම ආයතන විධිමත්ව කළමනාකරණය කිරීම, පුද්ගලික ප්‍රාග්ධනය ආකර්ශණය කර ගැනීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ඇති කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් මධ්‍යගතව පාලනය කිරීමට පාලක සමාගමක් ඇති කිරීම.

## ගොවියා, කර්මාන්තකරුවා මෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රය සුරැකීම

- ගොවියා සහ දේශීය කර්මාන්තකරුවා ආරක්ෂා කිරීමට තෝරාගත් භාණ්ඩ සඳහා විශේෂ ආනයන බදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- 'උරුමය' ව්‍යාපෘතිය හරහා ගොවි ජනතාවට ලැබෙන ඉඩම් පසුකාලීනව අහිමිවීම වැළැක්වීම සඳහා එකී ඉඩම් විකිණීමට අවශ්‍යවන අවස්ථාවන්හි මිල දී ගැනීම සඳහා ඉඩම් බැංකුවක් ස්ථාපිත කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තය ඇතුළු ණය බර හේතුවෙන් සිය ව්‍යාපාර කටයුතුවලින් ඉවත් වීමට සිදුවුණු සියලු සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට සහන ලබාදීම සහ ඒ හේතුව නිසාම රැකියා අහිමිවූවන්ට සහන සැලසීම සඳහා 'ණය කපාහැරීම හා සහන ලබාදීමේ' ප්‍රායෝගික වැඩපිළිවෙළක් උදෙසා කෙටුම්පත් කෙරුණු නව පනතක් ගෙන ඒම මගින් ඔවුන් නැවත නගා සිටුවීම.

## රාජ්‍යයේ ස්වාධීනත්වය තහවුරු කිරීම

- බලශක්ති සුරක්ෂිතතාව අනතුරේ හෙළන වත්මන් විදුලිබල පනත අහෝසි කරන අතර, විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සඳහා නව පනතක් හඳුන්වා දෙනු ලැබේ. පරිසර හිතකාමී සුනිත්‍ය බලශක්තිය වර්ධනය කර දේශීය උපාංග නිෂ්පාදනය දිරි ගැන්වීම.
- ජාත්‍යන්තර වෙළෙඳ හෝ ආරක්ෂක හෝ ආයෝජන හෝ ගිවිසුම් අත්සන් කිරීමෙන් ජාතික ආර්ථිකයට හෝ ආරක්ෂාවට සිදුවිය හැකි අගතීන් වැළැක්වීම සඳහා ජාත්‍යන්තර ගිවිසුම් පිළිබඳ ප්‍රතිපත්තියක් සහ විනිවිදභාවය සහ වගවීම තහවුරු වන ක්‍රියාපටිපාටියක් අඩංගු පනතක් සම්මත කිරීම. එකී පනත සම්මත කරන තෙක් දැනට සාකච්ඡා මට්ටමේ ඇති ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම.

## කුල පීඩාවන් අහෝසි කිරීම

- උතුරු හා නැගෙනහිර පළාත්වලට විශේෂිත වූ කුල පීඩනය අහෝසි කිරීම සඳහා දැනට පවතින සමාජ දුබලතාවන් වැළැක්වීමේ පනත (1957) ශක්තිමත් කිරීම හා බල ගැන්වීම.
- උතුරු පළාතේ පවතින තේසවලාමේ නීතිය හරහා වහල්භාවයට පත්කොට අස්පර්ශ ලෙස හඳුන්වමින් කුලවාදයෙන් පීඩාවට පත් කළ ජනතාව මුහුණ දුන් අසාධාරණය පිළිබඳ විමර්ශනය කිරීම සඳහා කොමිසමක් පත් කිරීම හා එහි යෝජනා අනුව ඒ ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට කටයුතු කිරීම.

## සමාජය බිඳ දමන කුමන්ත්‍රණ පැරදවීම

- සංඝ සමාජය, පවුල ඇතුළු ඓතිහාසික සමාජ සංස්ථාවන් සහ පුද්ගල පෞරුෂත්වය බිඳ වැට්ටවීමේ සැලසුම් සහගත කුමන්ත්‍රණයන් පරාජය කිරීම සඳහා රාජ්‍ය මැදිහත් වීම.

# ප්‍රවේශය

1977න් පසු ශ්‍රී ලංකාවේ දේශපාලනය හා බිහි වූ බොහෝ දේශපාලනඥයින් රාජ්‍යයේ අවශ්‍යතාවන් සහ පුරවැසියන්ගේ අභිමතයන් නිසි ලෙස නියෝජනය නොකිරීම, සහකම්පනයෙන් තොර වීම යන හේතු නිසා අපගේ මව්බිම අපගේ ජාතික ශක්‍යතාවයන්ට සාපේක්ෂව අපේක්ෂිත තලයකට ඔසවා තැබීමට සහ කලාපීය රටවලට සාපේක්ෂව සංවර්ධන ඉලක්කයන් ඉටුකර ගැනීමට අසමත් වූ බව පැහැදිලිය.

මේ දක්වා රාජ්‍යය විසින් ගනු ලැබූ වැදගත් තීන්දු තීරණ එකිනෙකට සබැඳි කේන්ද්‍රීය උපාය මාර්ග මත පදනම් ව ගත් තීන්දු තීරණ නොවන අතර, ඒවා තත්කාලීන පාලකයන් කෙටිකාලීන පටු දේශපාලන, ආර්ථික සහ පෞද්ගලික අවශ්‍යතා මත පමණක් ගත් තීන්දු තීරණ වීම, ශ්‍රී ලංකාව අද පත්ව ඇති අභාග්‍යසම්පන්න ඉරණමට ප්‍රධානතම හේතුව ලෙස අපි දකිමු.

වර්තමාන අර්බුදය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී එදා වේල පවත්වා ගැනීම, ස්වකීය පැවැත්ම වෙනුවෙන් ගත් තින්දු තීරණ, මැතිවරණ ඉලක්ක කරගත් තාවකාලික වැඩපිළිවෙළ සහ අල්ලස, දූෂණය, වංචාව වැනි බැහැර කළ යුතු මූලික කාරණා රැසක් අපට හඳුනාගත හැකි විය.

ඉතිහාසයේ සිදුවූ වැරදි නැවත නැවතත් සාකච්ඡාවට බඳුන් කරමින් ඒ මත සන්තාපයට පත්වෙනවා වෙනුවට මේ දේශය එදා මෙදා තුර ඉතිහාසයේ දැවැන්තම පරිවර්තනීය මාවතකට ගෙන යැමට හැකි වැඩපිළිවෙළ අපි ඔබ වෙත ඉදිරිපත් කරමු.

අපගේ මූලික අභිප්‍රාය වන්නේ 'සතුටු දැයක්' නිර්මාණය කිරීමයි.

'සතුටු දැයක්' යනු භෞතික මෙන්ම ආධ්‍යාත්මික සංවර්ධනයෙන් තෘප්තිමත් වූ ජනතා සමූහයකි.

ඒ සඳහා අප තෝරා ගත් දර්ශනය වන්නේ 'ව්‍යවසායකත්ව රාජ්‍ය' සංකල්පයයි. 'ව්‍යවසායකත්ව රාජ්‍යයක්' යනු රාජ්‍යයේ මනස 'නිර්මාණාත්මක' අවදනම් ගැනීමේ ශක්තියෙන් හෙබි, එසේම කාර්යශූර බවින් සන්නද්ධ, හැඟීම් සමුදයකින් සමන්විත තීරණ ගැනීමේ ක්‍රියාවලියයි.

මේ අයුරින් අපගේ ජාතිය නිර්මාණය කරගැනීම සඳහා සමස්ත ශ්‍රී ලාංකික ජනතාව අභිප්‍රේරණය කර ගැනීම අත්‍යවශ්‍ය සාධකයකි.

අපගේ මූලික අභිප්‍රාය වන්නේ ව්‍යවසායකත්ව රාජ්‍යයක් තුළින් 'සතුටු දැයක්' නිර්මාණය කිරීමයි. ඒ සඳහා දේශීය සම්පත් රැකගනිමින්, නිසි විදේශ ආයෝජනයන්ට මං හසර විවර කරමින්, ආර්ථිකය පෙරට ගෙන යැමට අවශ්‍ය ශක්තිය මෙන්ම 'උපාය මාර්ගික සැලැස්ම' නිර්මාණය කරගැනීම සඳහා අවශ්‍ය දැක්ම අප සතුව ඇත.

අප විශ්වාස කරන පරිදි ශ්‍රී ලංකාවේ ඇති සුවිශේෂිතම ලක්ෂණය නම් වසර දහස් ගණනක් තිස්සේ බුදු දහමින් පෝෂණය වූ අපේ සභ්‍යත්වයයි. එකී සභ්‍යත්වය මත ගොඩනැගුණු ජාතිකවාදී රාජ්‍යයක් තුළ සෑම පුරවැසියෙකුටම හිස කෙළින් තබාගෙන ජීවත් විය හැකි පරිසරයක් නිර්මාණය කළ යුතු වේ. වර්තමානයේ ලොව භෞතික ව දියුණු වූ සියලුම රාජ්‍යයන් ස්වකීය සංවර්ධනයේ පදනම ලෙස යොදාගත්තේ ඒ ඒ රටවලට ඓන්ද්‍රීය ව ගොඩනැගුණු තම ඓතිහාසික ශිෂ්ටාචාරයෙන් පැනනැගුණු ජාතිකත්වයයි. ශ්‍රී ලංකාවේ අපට ඒ යථාර්ථයෙන් බැහැර ව ඉදිරි ගමනක් නැති බව අපි මනාව හඳුනාගෙන ඇත්තෙමු.

එබැවින් සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර්, මැලේ ආදී ඕනෑම ජනවර්ගයකට අයිති පුරවැසියෙකුට ඓතිහාසික උරුමයෙන් හිමිවන ජාතිකත්ව ලක්ෂණ මත පදනම් වූ අපේ වැඩපිළිවෙළ දේශය සමෘද්ධිය කරා රැගෙන යැමට හේතු වනු ඇත.

එහි දී ශ්‍රී ලංකාව සතු මානව සම්පත නිසි පරිදි අභිප්‍රේරණය කිරීම මූලික කාරණාවක් ලෙස අප හඳුනාගෙන තිබේ. වර්තමානයේ මේ රට අතහැර යාමට ඔබව පොළඹවන, ඔබ අපේක්ෂා භංගත්වයට පත් කළ, ඔබෙන් සතුට උදුරාගත් පවතින ක්‍රමය වෙනස් කිරීමට කාලය එළැඹ ඇත.

එකී සැබෑ ක්‍රම වෙනස තුළින් අභිප්‍රේරිත මානව සම්පත, අපේ භෞතික සම්පත් හා මූල්‍ය සම්පත් නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා මෙහෙයවීම ව්‍යවසායකත්ව මනසකින් කළ යුතුය.

එහිදී මූලික වශයෙන්ම දේශය වෙලාගත් අල්ලස, දූෂණය, වංචාව සහ මහා පරිමාණ සොරකම් පිටුදැකීම සඳහා අප ඉදිරිපත් කරන්නේ ඩිජිටල් තාක්ෂණය මත පදනම් වූ නැවුම් ප්‍රවේශයකි. එය දේශපාලන වේදිකාවේ ඇසෙන හොරු ඇල්ලීම වැනි ජනප්‍රිය සටන් පාඨවලින් ඔබ්බට ගිය මහපොළොවේ සැබෑ ලෙසම ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ගික වැඩපිළිවෙළකි.

තවද අතීතයේ සිදුවූ දූෂණ සහ වංචා සම්බන්ධයෙන් පුළුල් නෛතික ක්‍රියාපටිපාටියක් ඇතිකිරීම මගින් එකී වංචා, දූෂණ පිළිබඳ නිවැරදි තක්සේරුවක් ලබාගෙන අදාළ මුදල් නැවත අයකර ගැනීම සහ වරදකරුවන්ට නීතිය ක්‍රියාත්මක කිරීමට ද අපි පසුබට නොවෙමු.

ලෝක දේශපාලනයේ යථාර්ථයන් නිවැරදි ව හඳුනාගනිමින් ජාත්‍යන්තර සම්බන්ධතා මනාව කළමනාකරණය කරමින් අවශ්‍ය ජාත්‍යන්තර පරිචයෙන් සන්නද්ධ අප, සුවිශේෂී භූ දේශපාලනික තත්ත්වයන් කෙරෙහි සංවේදී ය. එකී සන්දර්භය තුළ බහුධ්‍රැවීය ස්වාධීන විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාව මතුව ඇත්තේය. දේශයේ වුවමනාවන් සිල්ලරට විකිණෙන, බලය පවත්වාගෙන යෑම වෙනුවෙන් විදෙස් බලවේග සරණ යන පරගැති ප්‍රතිපත්තිය වෙනුවට මව්බිමේ අවශ්‍යතාවන් ප්‍රමුඛත්වයේ ලා සලකන, මව්බිම කේන්ද්‍රීය විදෙස් ප්‍රතිපත්තියක් අනුගමනය කරමු. සෑම බලවේගයක් සමගම සහයෝගයෙන් කටයුතු කරන්නා වූ විදේශ ප්‍රතිපත්තියක් අප සතු වේ.

රහසේ සැප විඳිමින් ධනය උපයමින් වැජඹෙන රතු රෝස පක්ෂ තාරුණ්‍යයේ ජවය මහ පාරේ සහ සමාජ මාධ්‍යවල අවභාවිත කරද්දී තිල් කොළ වයෝවෘද්ධ දේශපාලනඥයෝ තාරුණ්‍යයට අසංවේදී ව සාම්ප්‍රදායික දේශපාලනයේ නිරත වෙති. එහෙත් ඒ සියල්ල පරාජය කරමින් ශ්‍රී ලාංකීය තාරුණ්‍යය ගෝලීය අභියෝගය හමුවේ ඉහළට ඔසවා තැබීම මේ රටේ ප්‍රමුඛතම අවශ්‍යතාවක් ලෙස අපි හඳුනාගෙන ඇත්තෙමු.

කිසිදු රාජ්‍ය මැදිහත්වීමකින් තොරව වර්තමාන තරුණ පරම්පරාව තාක්ෂණය හා සන්නද්ධ වෙමින් ගෝලීය අභියෝගයන්ට සරිලන ලෙස කුසලතා වර්ධනය කර ගනිමින් යහපත් හෙටක් උදෙසා අවස්ථා නිර්මාණය කරමින් සිටිති. ඒ නිර්මාණශීලී තාරුණ්‍යය ද කැටිව සමස්ත තාරුණ්‍යය අනාගත ලෝකයේ අභියෝග කරා සූදානම් කිරීම අපේ අරමුණයි.

වර්තමාන මැතිවරණ ක්‍රමය තුළින් ආත්මාර්ථකාමී, පටු වාසි උදෙසා මව්බිමට එරෙහි අණපනත්වලට අත ඔසවන, ජනතා ගැටලුවලට අසංවේදී, මැතිවරණ සමයේ පමණක් ජනතා අවශ්‍යතාවයන් කෙරෙහි ව්‍යාජ සංවේදිතාවක් පෙන්වමින්, පුරවැසියන් යැපුම් මානසිකත්වයකට යොමු කරවන දේශපාලකයන් බිහිවීම වළක්වා ලීම සඳහා නිවැරදි නව මැතිවරණ ක්‍රම සංශෝධනයක්, ඒ සඳහා නිවැරදි වැඩපිළිවෙළක් අප ඉදිරිපත් කර තිබේ.

අප ඓතිහාසික ව මාතෘ මූලික සමාජයකි. ව්‍යවසායක ජවය සහ දරාගැනීමේ හැකියාව උපරිමයෙන් පෙන්වන්නේ කාන්තාවයි. කුටුම්භය තුළ සතුට උත්පාදනය කරන්නේ ඇයයි. අධික ආර්ථික අර්බුද සහ දේශපාලන ව්‍යාකූලතාවන් හමුවේ වුවත් ජීවිතය ගෙනයෑමට හැකි වූයේ ඇය නිසාය. සෞභාග්‍යය සහ සතුට ඇති අනාගතයක් සැලසුම් කිරීමේ සහ ඒ සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛස්ථානය ලබාදෙන්නේ ඇයට ය.

වර්තමානයේදී ණය ගන්නේ කෙසේ ද අප බංකොලොත් ද නැති ද වැනි පටු තැනකට දේශයේ ප්‍රමුඛතා හා සංවාදය ලඝු කොට තිබුණද රාජ්‍යයක් ලෙස ධනය ඉපැයීමට හැකි ව්‍යවසායකත්ව ක්‍රමවේදය අප විසින් ගොඩනගනු ලැබේ. මේ දිගුකාලීන ක්‍රමවේදය ක්‍රියාත්මක වන අතරතුර සුභසාධනය අත්‍යවශ්‍ය කුටුම්භයන් වෙත අවම සුබසාධනය සහතික කරමින්, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ සේවකයින් මෙන්ම ව්‍යවසායකයින් මේ දැවැන්ත ආර්ථික අර්බුදයෙන් මුදාලීමට කෙටි කාලීන පියවර ගනු ලැබේ.

අවදානම ගනිමින් රාජ්‍යය නිර්මාණශීලී ව්‍යවසායකත්ව මනසකින් සන්නද්ධ කිරීම පිණිස සර්වජන බලයේ අපි මෙම වැඩපිළිවෙළේ දෙවෙන් කෙටුම්පත මෙලෙස ඔබ හමුවේ තබමු. මේ ඔස්සේ තවදුරටත් ගොඩනැගෙන සමාජ සංවාදය අපේ වැඩපිළිවෙළ හුදෙක්ම ඉතිහාසය පුරා සිදුවූ පරිදි තවත් එක් පොරොන්දු ලියවිල්ලක් නොවී ඔබේ ජීවිතය වෙනස් වෙන අයුරු ඔබට විදහාලන උපාය මාර්ගික සැලැස්මක් ලෙස සංවර්ධනය කරනු ඇත.

උපතේ සිට මරණය දක්වා ගත වන මේ ජීවිතය, මෙවන් පින් බිමක ඉපිද අසතුටින් ගත කළ යුතු නැත. එබැවින්, ඔබේ සතුට නිර්මාණය කිරීම වෙනුවෙන් ඉදිරිපත් කිරීමට නියමිත 'ජාතික උපාය මාර්ගික සැලැස්ම' සකස් කරගැනීම සඳහා ඔබ සමග සංවාදයට ලක්විය යුතු යැයි අප විශ්වාස කරන පුළුල් මාතෘකාවන් රැසක්, එම ප්‍රවේශයේ පළමු හා දෙවන කෙටුම්පත ලෙස අපි ඔබ වෙත ගෙන ආවෙමු. එසේ ජනතා අදහස් මතින් පණ පෙවුණු, ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාතික උපාය මාර්ගික සැලැස්ම අපි ඔබ වෙත මෙසේ පිළිගන්වන්නෙමු.


ශ්‍රී ලාංකික
සභ්‍යත්වය
ව්‍යවසායකත්ව රාජ්‍යය
උපාය මාර්ගික සැලැස්ම
අභිප්‍රේරිත ජනතාව
සුහුරු පරිපාලනය
සතුටු දයක්

# ව්‍යවසායකත්ව රාජ්‍යයක්

අභිමානවත් ජාතික අනන්‍යතාවක් සහිත සමෘද්ධිමත් රටක් බිහිකර ගැනීමට සියලුම ශ්‍රී ලාංකිකයන් සවිබලගැන්වීම සඳහා වන අපේ උපාය මාර්ගික වැඩපිළිවෙළෙහි මූලිකම අංගය ලෙස ව්‍යවසායකත්ව රාජ්‍යය හඳුන්වා දිය හැක.

- **ශ්‍රී ලංකාව වෙනුවෙන්:** මව්බිමේ අවශ්‍යතාවන් ප්‍රමුඛස්ථානයේ ලා සලකමින්, යහපැවැත්ම සහ සමෘද්ධිය උදෙසා උපාය මාර්ගික වැඩපිළිවෙළක්.

- **ශ්‍රී ලංකාවට පුළුවන්:** සෑම පුරවැසියෙකුගේම හැකියාව විශ්වාස කරමින් සියලු පුරවැසියන් අතර ස්වයංපෝෂිතභාවය, නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය වර්ධනය කරන මනසක්.

  ශ්‍රී ලංකාවේ රාජ්‍ය පුද්ගලික මාධ්‍ය සියල්ල ව්‍යවසායකත්වය, නිර්මාණශීලීත්වය පදනම්ව ජනතාව අර්බුදයෙන් ගොඩඒමේ අභිප්‍රේරණ චින්තනයත් සමාජගතකරන වැඩසටහන් පමණක් පළමු විනාඩි 10 තුළ තම ප්‍රවෘත්තිවල විකාශනය කළ යුතු බවට රජය එම ආයතන සමග ගිවිසුම් ගතවීම. මුද්‍රිත මාධ්‍යයෙහි පළමු පිටුවේ 20% හා තෙවෙනි පිටුවේ 30% ක් වෙන් කළ යුතුය.

  **ශ්‍රී ලංකා දවසක් ක්‍රියාත්මක කිරීම:** ලෝකය පුරා වාසය කරන ශ්‍රී ලාංකික වෘත්තිකයින් සහ අනෙකුත් විද්වතුන් විශේෂිත දිනකදී ශ්‍රී ලංකාවට ගෙන්වා රාජ්‍ය අනුග්‍රහය සහිතව ඔවුන් ඇගයීමට ලක් කිරීම. ලෝක ව්‍යාප්ත ශ්‍රී ලාංකිකයින්ගේ දිනය. (Sri Lanka Day in Sri Lanka.)

- **එක ජාතික අනන්‍යතාවක්:** ඓතිහාසික සභ්‍යත්වය මත පදනම් ව ජනවාර්ගික, ආගම්, කුල යනාදී පටු අනන්‍යතාවන් අභිභවමින් සියලු පුරවැසියන්ට අභිමානයක් රැගෙන එන අපේ ම ජාතික අනන්‍යතාවක් සහිත ජාතික මට්ටමේ සන්නිවේදන ව්‍යාපෘතියක් දියත් කරනු ලබන අතර, සමගාමීව ආකල්ප වෙනස්කිරීමේ ක්‍රියාමාර්ග සහිත ප්‍රවේශයක් සැකසීම.

- **සැමට සම වූ සිවිල් වටිනාකම්:** සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ හදවත් තුළ පොදුවේ ඇති ආදරයට, ගෞරවයට, කරුණාවට සහ බහු ආගමික, සංස්කෘතික වටිනාකම්වලට ප්‍රමුඛතාව.

  ජාතික මට්ටමේ සංස්කෘතික උත්සවයක් රට පුරා ව්‍යාප්තව පැවැත්වීම.

- **ඒකීය රාජ්‍යයක සාමකාමී සහජීවනය:** මව්බිමේ සුරක්ෂිතභාවය ප්‍රමුඛස්ථානයෙහි ලා සලකමින්, සියලු ආගම් හා ජනවර්ගවල පුරවැසියන්ගේ උරුමයන් ආරක්ෂා කරමින්, ඒකීය ශ්‍රී ලංකාවක් තුළ සාමකාමී සහජීවනය තහවුරු කිරීම.

  ජනතා සංවාදයෙන් පසු පිළියෙළ කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේදී ද මේ බව තහවුරු කරනු ඇත.

- අපේ සභ්‍යත්වය නිර්මාණය වී ඇත්තේ අන්‍යෝන්‍ය වශයෙන් ජීවී-අජීවී සැමට දක්වන දයාව සහ සාමූහිකත්වය යන උත්තුංග පදනම මත බව අවබෝධ කරගෙන කටයුතු කිරීම සඳහා ජනතාව එකඟ වන ආචාරධර්ම පද්ධතියක් සහිත ජනතා ව්‍යවස්ථාවක් බලපැවැත්වීම. (People's Constitution)

# සමානාත්මතාවය සහ සෞභාග්‍යය මගින් සතුටු දැයක් නිර්මාණය කිරීම

## සතුටු දැයක් සඳහා වූ උපාය මාර්ග

- **පරිපූර්ණ සුබසාධනය:** අප විශ්වාස කරන පරිදි රාජ්‍යය විසින් මෙහෙයවන සතුට පාදක වූ උපාය මාර්ගයක් මව්බිමට අවශ්‍ය ව ඇත. උපතේ සිට මරණය දක්වා ගතවෙන ජීවිතය තුළ සතුට නිර්මාණය කිරීම සඳහා පුරවැසියන්ගේ භෞතික සහ ආධ්‍යාත්මික අවශ්‍යතාවන් හඳුනාගෙන ඒවා ඉටුකරලීම සඳහා පදනම සකසන වැඩ පිළිවෙළක් බිහිකරගත යුතු වේ. ඒ සඳහා ලාංකීය මානව සම්පත අභිප්‍රේරණය කරමින්, භෞතික සම්පත් ඵලදායී ලෙස යෙදවීමෙන් හා මූල්‍යමය සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීමෙන් මේ අභියෝගය ජයගත හැකි බව අපගේ විශ්වාසයයි.

- **සාධාරණ ලෙස සම්පත් බෙදී යෑම:** සියලු ශ්‍රී ලාංකිකයින් වෙත ජාතික සම්පත් හා ධනය සාධාරණ ලෙස බෙදී යන අයුරින් සකස් වන සමානාත්මතාවයෙන් යුතු ප්‍රවේශයක්. කුටුම්භයක අවම ආදයම රුපියල් 100,000ක් උපයාගත හැකි ආර්ථික පරිසරයක් 2025.12.31 දින වන විට සහතික කිරීම.

- **ඒ සඳහා සැමට අනන්‍ය ඩිජිටල් හඳුනාගැනීමක් සමග** සෑම පුරවැසියෙකුටම සුරක්ෂිත අනන්‍ය ඩිජිටල් හඳුනා ගැනීමක් ලබා දෙමින් රාජ්‍ය සේවා සඳහා පහසු ප්‍රවේශයක් ඇති කිරීම සහ දත්ත මත පදනම් ව තීරණ ගන්නා පාරදෘශ්‍ය රාජ්‍ය යාන්ත්‍රණයක් බිහිකිරීම තුළින් බැංකු පද්ධතිය, සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළ, බදු එකතු කිරීම වැනි රාජ්‍ය සේවාවන් කාර්යක්ෂම කිරීමට ද දූෂණය පිටුදැකීමට ද කටයුතු කරනු ලැබේ. මේ සඳහා වන අනන්‍ය හැඳුනුම් අංකය ලබාදීම 2024 ඔක්තෝබර් 01 දින ආරම්භ කර මාස 06 ක් ඇතුළත් අවසන් කරනු ඇත.

- **ආධ්‍යාත්මික වටිනාකම්:** ඓතිහාසිකව ගොඩනැගුණු ලාංකීය ආධ්‍යාත්මික හරය අවශෝෂණය කරගත් නූතන ලෝකය හා පෑහෙන පරපුරක් බිහිකිරීම තුළින් සතුට උදාකර ගත හැකි බව අපගේ විශ්වාසයයි.

## ව්‍යවසායකත්වය බලගැන්වීම

- **රාජ්‍ය දර්ශනය:** රාජ්‍ය යාන්ත්‍රණයේ මනස නිර්මාණශීලී සහ අවදානම්වලට මුහුණ දීමේ ව්‍යවසායකත්ව මනසකට පරිවර්තනය කිරීම හා අභියෝග හමුවේ සාම්ප්‍රදායික විසඳුම් සෙවීම වෙනුවට නවමු විසඳුම් කරා යොමුවෙමින් පසුගාමී දේශයක් සෞභාග්‍යය කරා ගෙන යන ගැඹුරු පරිවර්තනයක් සිදු කිරීම.

- **මුල් ළමා වියේදීම ව්‍යවසායකත්වය:** නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය සහ අභියෝගවලට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරන අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ හරහා මුල් ළමා වියේ සිටම ජාතියට අවැසි ව්‍යවසායකත්ව මනසක් වර්ධනය කිරීමට කටයුතු කිරීම.

- **ව්‍යවසායකයන් බලගැන්වීම:** දැනුම, ප්‍රාග්ධනය සහ වෙළෙඳපොළ වැනි අත්‍යවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශය සහතික කිරීම මගින් ව්‍යවසායකත්වය පෝෂණය කිරීම.

- **ඉලක්කගත සුබසාධනය:** සුබසාධන සහාය අවශ්‍ය පුද්ගලයන් සහ ප්‍රජාවන් නිවැරදිව හඳුනාගෙන ඔවුන් නිසි මෙවලම් සහ අවස්ථා මගින් සවි බල ගැන්වීම. සුභසාධනය ලෙස අර්ථ ගැන්වුණු වත්මන් වැරදි පූර්වාදර්ශය වන එදිනෙදා පරිභෝජන අවශ්‍යතාවයන් වෙනුවෙන් යැපුම් මානසිකත්වයක් බිහි වීම වළක්වා ලීම. ශක්‍යතාවයන් වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සැකසීම මගින් යැපුම් මානසිකත්වයෙන් ඔවුන් මුදා ලීම.

## දේශපාලන වහල්භාවය සහ දූෂණය අවසන් කිරීම

- **යැපුම් මානසිකත්වය වෙනුවට ආත්ම විශ්වාසය බලගැන්වීම:** පුරවැසියන් දේශපාලන අනුග්‍රහය මත යැපෙන සංස්කෘතියෙන් මිදීමට හුරුකර ස්වයංපෝෂිත වීමට සහ ස්වයං බලගැන්වීමට අවශ්‍ය සම්පත් සහ අවස්ථා නිර්මාණය කිරීම.

- **සමාන අවස්ථා:** දේශපාලන බැඳියාවන් නොසලකා සෑම පුරවැසියෙකුටම සමාන අවස්ථා ලැබෙන බව තහවුරු කිරීමෙන් ජනතාව දේශපාලන වහල් බවින් මුදගැනීම.

# ඒකාබද්ධ ආණ්ඩුකරණය සහ එකිනෙකට බැඳුණු උපාය මාර්ග

ආණ්ඩුකරණය හා පරිපාලන කටයුතු පරිවර්තනීය සහ ධරණීය මාවතක් ඔස්සේ දේශයේ ප්‍රමුඛතාවයන් කරා යොමු කරවන නව්‍ය, දූෂණයෙන් තොර වැඩපිළිවෙළක්

- **සාමූහික තීන්දු ගැනීම:** ජාතික උපාය මාර්ගික සැලසුම් අධිකාරිය පිහිටුවා සියලුම අමාත්‍යාංශ හරහා තීරණ ගැනීම සඳහා ඒකාබද්ධ රාමුවක් ස්ථාපිත කිරීම මගින් සෑම ක්‍රියාවක්ම අපගේ ජාතික අරමුණු සමග සමපාත වන බව තහවුරු කිරීම හා කාර්යක්ෂමතාව ඉහළ නංවමින්, වංචා හා නාස්තිය අවම කිරීම.

- **දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති:** අවශ්‍යතා හඳුනා ගැනීමට, සම්පත් වෙන් කිරීමට සහ ව්‍යාපෘති සඵලතාවය ඇගැයීමට ශක්තිමත් දත්ත කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. හැඟීම් හා අභිමත මත තීරණ ගැනීම වෙනුවට දත්ත මත නිවැරදි තීරණ ගන්නා ප්‍රවේශය පුරවැසියන්ගේ සැබෑ අවශ්‍යතාවයන් ඉටු කරන බව සහතික කරනු ඇත. ඒ සඳහා පවතින ආයතන ඒකාබද්ධ කර බහුවිධ පර්යේෂණ ආයතනයක් පිහිටුවනු ලැබේ.

- **දූෂණය තුරන් කිරීම:** අනන්‍ය පුද්ගල හැඳුනුම් අංකය භාවිත කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සියලු අභ්‍යන්තර ගනුදෙනු එකම ඩිජිටල් පද්ධතියකට යටත් කිරීමෙන්, සියලු පුද්ගල හා ආයතනික ගනුදෙනුවල පාරදෘශ්‍යභාවය තහවුරු කරනු ඇත. 2024. 12. 31 වන දින වන විට ආරම්භ කර මාස 06 කින් සියලු කටයුතු නිමා කරනු ඇත.

  මෙහි ආරම්භයක් ලෙස මේ වනවිට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති කෝපා හා කෝප් කමිටු නිර්දේශ හා ආංශික අධීක්ෂණ කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම 2024. 11. 01 දින සිටම වහාම ආරම්භ කිරීම.

- **අතීත දූෂිත ගනුදෙනු පිළිබඳ පියවර ගැනීම:** පසුගිය දශක දෙක තුළ සිදුව ඇති දූෂිත ගනුදෙනු හා බදු සහ ගාස්තු ගෙවීම් පැහැර හැරීම් මගින් සිදුවී ඇති අලාභය අයකර ගැනීමට සහ වරදකරුවන් නීතිය හමුවට ගෙන ඒමට පූර්ණ බලැති විශේෂ කොමිෂන් සභාවක් නව පනතක් හරහා ස්ථාපිත කිරීම.

- **පිටමං කරන ලද දේශීය සම්පත් නැවත ලබාගැනීම:** සොරාගත් දේපළ ප්‍රතිසාධනය (Stolen assets recovery initiative) යටතේ ජාත්‍යන්තර නීතිය ද උපකාර කොට ගෙන දේශයට අහිමි වූ දේපළ නැවත ලබාගැනීමට වහා කටයුතු කරනු ඇත. 2024. 12. 31 ට පෙර විදේශ විනිමය පනතට අවශ්‍ය සංශෝධන ගෙන ඒම තුළින් විදේශ විනිමය අව භාවිතාව නතර කරන අතර, මිල පැවරුම් ශිල්ප ක්‍රම, ලාභ ප්‍රේෂණය මිලකරණය අවභාවිතා කිරීම නතර කිරීමට අවශ්‍ය නීති සම්පාදනය ජාත්‍යන්තර ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම, රාජ්‍යයන් අතර ගිවිසුම් ගත වීම.

- **සහයෝගිතා උපාය මාර්ග:** අමාත්‍යාංශ අතර සහයෝගිතාවය සහ සහයෝගිතාව උත්තේජනය කරන චේතනාන්විත උපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම. මෙ මගින් රජයේ මුලපිරීම්වල බලපෑම උපරිම කරමින් අන්තර් සම්බන්ධිත සේවාවන් බාධාවකින් තොරව ලබා දීමට හැකි වේ.

- **වගවීම සහ අවංකභාවය:** දේශපාලනිකව පෙළඹුණු තීරණ අවම කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය සංවර්ධනය කිරීම. ජාතික අවශ්‍යතාවන්වලට ප්‍රමුඛත්වය ලබාදීමෙන් දූෂණයට ඇති ඉඩ අහෝසි කර වගවීම සහ විනිවිදභාවයෙන් යුතු සංස්කෘතියක් බිහි කිරීම.

  සියලුම අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ ආවරණය වන බලතල සහිත ආංශික අධීක්ෂණ කාරක සභා සිවිල් සමාජ ක්‍රියාකාරීන් ද ඇතුළත් වන ලෙස පිහිටුවා මාස් පතා අමාත්‍යාංශ කටයුතු නිරීක්ෂණය හා විමර්ශනය කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නීති ගෙන ඒම.

  ශ්‍රී ලාංකික රාජ්‍ය තාන්ත්‍රික ගුවන් බලපත්‍ර උපයෝගී කරගනිමින් දේශීය ගුවන්තොටුපොළ ප්‍රභූ පර්යන්තය හරහා ගමන් කිරීම නතර කර, සාමාන්‍ය මගී පර්යන්තය භාවිත කිරීම අනිවාර්ය කෙරේ.



# සතුටු දෑයක්

ව්‍යවසායකත්ව රාජ්‍යයක් නිර්මාණය කිරීම මගින් භෞතික සහ ආධ්‍යාත්මික සන්තුෂ්ටිය භුක්ති විඳින්නා වූ ඵලදායී මිනිසුන්ගෙන් සැදි සතුටු දැයක් උදෙසා වන සැලැස්ම.

කැබිනට් මණ්ඩලය → ප්‍රතිපත්ති මාර්ගෝපදේශ →



← අධීක්ෂණය ← පාර්ලිමේන්තුව

## ජාතික උපාය මාර්ගික සැලසුම් අධිකාරිය

ජාතික ප්‍රමුඛතා හා අරමුණු ජයගැනීම වෙනුවෙන් නිශ්චිත උපාය මාර්ගික කාලරාමුවක් සහිතව ඉලක්ක කරා මෙහෙයවන මධ්‍යම අධිකාරියකි.



### මානව සම්පත්

අභිප්‍රේරණය

**ජාතික මානව සම්පත් කාර්යාංශය**

මානව සම්පත් කළමනාකරණය සඳහා වූ අධිකාරියකි. ඊට ආහාර, නිවාස, සෞඛ්‍යය, අධ්‍යාපනය, මඟී ප්‍රවාහන, සහජීවනය, සංස්කෘතික කටයුතු අයත් වනු ඇත.



### මූල්‍ය සම්පත්

ගාමක බලය

**ජාතික ප්‍රාග්ධන කළමනාකරණ කාර්යාංශය**

ප්‍රාග්ධන සහ ආයෝජන උපාය මාර්ගික ව කළමනාකරණය කිරීම සඳහා වන කාර්යාංශය. එමගින් ප්‍රතිපාදන සහ සම්පත් ප්‍රශස්ත ලෙස ආර්ථික ප්‍රතිලාභ හා සංවර්ධනය ළඟා කරගත හැකි පරිදි යෙදවීම සහතික කෙරෙනු ඇත.



### භෞතික සම්පත්

ප්‍රශස්තකරණය

**ජාතික භෞතික සම්පත් කළමනාකරණ අධිකාරිය**

රටේ ස්වාභාවික සම්පත් මෙන්ම මිනිස් ශ්‍රමයෙන් තැනූ යටිතල පහසුකම් ද තිරසර අයුරින් හා ආර්ථික ප්‍රතිලාභ අත්වන පරිදි කළමනාකරණය මෙම අධිකාරිත්වයට පැවරේ.


## සක්‍රිය කාරක

| විදේශ සම්බන්ධතා | යුක්තිය පසිඳලීම | ආරක්ෂාව | නියාමනය |
|---|---|---|---|
| ජාතික අභිලාෂයන්ට ප්‍රමුඛත්වය ලබා දෙන උපාය මාර්ගික බහුධ්‍රැවීය සහ මිත්‍රශීලී ප්‍රතිපත්තියක්. | සාධාරණ, අපක්ෂපාතී සහ විනිවිදභාවයෙන් යුතු නීති පද්ධතියක් මගින් නෛතික ක්‍රියාදාමය පිළිබඳ මහජන විශ්වාසය හා ප්‍රසාදය ඇතිවන පරිදි සියලු පුරවැසියන්ට යුක්තිය ඉටු කිරීම. | ජාතික ආරක්ෂාව හා ස්වෛරීභාවය රැකීමෙහි සමත් බුද්ධි තොරතුරු මත පදනම් වුණු උපාය මාර්ගික ආරක්ෂක ක්‍රියාපිළිවෙළක්. | නීති රෙගුලාසි ජාත්‍යන්තර සම්මුති සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුගතවෙමින් සෑම ක්ෂේත්‍රයකම මහජන විශ්වාසය හා අවංකභාවය රැකෙන පරිදි ක්‍රියා කිරීම. |

ව්‍යවසායකත්ව රාජ්‍යයක්

සභ්‍යත්වය

# මානව සම්පත් අභිප්‍රේරණ චක්‍රය






4 ප්‍රාථමික අධ්‍යාපනය



5 මධ්‍ය පාසල



6 පාසලේ දී වෘත්තීය හා ශාස්ත්‍රීය අධ්‍යාපනය



7 ව්‍යවසායකත්ව මානසිකත්වය දියුණු කිරීම



8 තෘතීය අධ්‍යාපනය



14 විශ්‍රාමික ප්‍රතිලාභ, රක්ෂණය, සමාජ සුබසාධනය

# අපේ භෞතික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතය

අපගේ ශිෂ්ටාචාරය ගොඩනැංවී ඇත්තේ මිනිසා සහ සොබාදහම අතර ඇති සහජීවනයට ගරු කිරීමේ පදනම මතය. අපේ රටේ භෞතික සම්පත් එනම් ගුවන, භූමිය, සයුර ප්‍රශස්ත ලෙස භාවිතයේදී අප ගන්නා වූ ප්‍රවේශයට මග කියන්නේ මෙකී දැක්මයි. ආර්ථික වර්ධනය තිරසර බව සහ සමාජ යහපැවැත්ම උදෙසා මෙකී සම්පත් කළමනාකරණය කිරීම අපගේ අභිප්‍රායයි. මෙ මගින් තිරසර ව සෞභාග්‍යමත් ජාතියක් නිර්මාණය කිරීම උදෙසා මග පැදෙනු ඇත.

## ගුවන

| බලශක්තිය | වර්ෂාව |
|---|---|
| සුළං, සූර්ය, ජල සුනිත්‍ය බලශක්ති ප්‍රභවයන්ගේ දායකත්වය 70% දක්වා ඉහළ නැංවීම. | පිරිසිදු ජලමාර්ග, පරිභෝජනය, කෘෂිකර්මය හා කර්මාන්ත සඳහා ඵලදායි භාවිතය. |

## භූමිය

| කෘෂිකර්මය | කර්මාන්ත හා සේවා |
|---|---|
| දේශීය පරිභෝජනය හා අපනයනය සඳහා එළවළු/පලතුරු, වාණිජ භෝග තේ, රබර්, පොල්, කුළුබඩු මෙන්ම නූතන වාණිජ භෝග. දේශීය පරිභෝජනය හා අපනයන සඳහා පශු සම්පත්. පාංශු සම්පත සංරක්ෂණය සහ ඵලදායි ලෙස භාවිතය. | සංචාරක කර්මාන්තය. කරදිය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය. |



## සයුර






## ගුවන් අවකාශය

ගුවන් ප්‍රවාහනයේ ශ්‍රී ලංකාව උපාය මාර්ගික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම. සන්නිවේදන තරංග හා චන්ද්‍රිකා පද්ධති සංවර්ධනය වෙනුවෙන් යොදාගැනීම.
ජාතික ආරක්ෂාව උදෙසා ඵලදායි ව භාවිතය.
සංචාරක කර්මාන්තය.



| සත්ත්ව ලෝකය | වනාන්තර | අභ්‍යන්තර ජලමාර්ග | ඛනිජ ආශ්‍රිත කර්මාන්තය |
|---|---|---|---|
| වනජීවී සම්පත සුරක්ෂිත කිරීම, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම. සුරතල් සතුන් සහ සහායක සතුන්ගේ යහපැවැත්ම. සත්ත්ව ලෝකය හා බැඳුණු දේශීය උරුමයන් ආරක්ෂා කිරීම. | වනාන්තර සුරක්ෂිත කිරීම, කාලගුණ නියාමනය සහ ස්ථාවරත්වය සඳහා වනාන්තරවල භූමිකාව හඳුනාගෙන කටයුතු කිරීම. කාබන් වෙළෙඳාම. නූතන පරිසර සංරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම. පාලිත ද්‍රව කර්මාන්තය හා වනාන්තර ආශ්‍රිත දේශීය කර්මාන්ත. | කෘෂිකර්මාන්තය හා බලශක්තිය උදෙසා ඵලදායි ව භාවිත කිරීම. පරිභෝජනය හා සංරක්ෂණය. ප්‍රවාහනය හා කර්මාන්ත උදෙසා ඵලදායි ව යොදා ගැනීම. | මැණික්, මිනිරන්, ඉල්මනයිට්, රූටයිල්, සිලිකා සහ ක්වාට්ස් සඳහා අගය එකතු කළ කර්මාන්ත සංවර්ධනය. ඉදිකිරීම් සඳහා අවශ්‍ය සම්පත් ඵලදායි ලෙස භාවිතය. දුර්ලභ ඛනිජ ගවේෂණය. |



| සාගරය | මුහුදු වෙරළ | ධීවර |
|---|---|---|
| වරාය හා නාවික ක්ෂේත්‍රයේ උපාය මාර්ගික මධ්‍යස්ථානයක් ලෙස භාවිත කිරීම. බලශක්ති උත්පාදනය, ජෛව සම්පත් ආරක්ෂා කිරීම සහ පරිභෝජනය සඳහා වැඩපිළිවෙළ. නූතන තාක්ෂණය මත සමුද්‍රීය සම්පත් හඳුනාගැනීම. අධ්‍යයනය සහ ඵලදායි ව යොදා ගැනීම. | සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සහ සමුද්‍රීය ඛනිජ සම්පත් තිරසර භාවිතය. | දේශීය පරිභෝජනය සහ අපනයනය උදෙසා මත්ස්‍ය සම්පත සංවර්ධනය. |


# මූල්‍ය සම්පත් සඳහා පිටුබලය

ව්‍යවසායකත්ව රාජ්‍යයක අවශ්‍යතා සපිරීම වෙනුවෙන් සහාය වන පරිදි අපේ මූල්‍ය සම්පත් පිටුබලයක් කරගැනීම පිණිස දේශීය ප්‍රවේශයකින් උපාය මාර්ගිකව කළමනාකරණය කිරීම.




## ආදයම් උත්පාදන උපායමාර්ග

බදු ප්‍රතිපත්ති - බදු දල පුළුල් කිරීම, බදු රැස්කිරීම වර්ධනය කිරීම සඳහා අනන්‍ය ඩිජිටල් හැඳුනුම් අංකය ඇතුළු තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දීම. ඉලක්කගත බදු දිරිගැන්වීම සහ සහන මගින් දේශීය ව්‍යවසායකයින්ට සහාය වීම සඳහා කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුතු ඩිජිටල් වේදිකාවක් (Digital Platform) මගින් රේගු බදු, මත්පැන් අළෙවි බදු, වාහන ලියාපදිංචි ආදයම් බලපත්‍ර ආදයම් වැනි විවිධ ආදයම් උපරිම කරගැනීමට කටයුතු කිරීම. රජයට හිමි ව්‍යාපාරවලින් ලැබෙන ලාභය උපරිම කරගැනීම සඳහා වූ උපාය මාර්ගික වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම.



## රාජ්‍ය ආයෝජන

ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ඉහළ ප්‍රමුඛතාවයෙන් යුතුව ආයෝජන මෙහෙයවනු ඇත. යටිතල පහසුකම් හා සේවා සංවර්ධනය සඳහා උපාය මාර්ගික ආයෝජනයන් දිරිමත් කිරීම. සංවිධිත ප්‍රතිපත්තියක් යටතේ උපාය මාර්ගික ආයෝජන දිරිමත් කිරීම. සෞඛ්‍ය, ආරක්ෂාව හා අධ්‍යාපනය වෙනුවෙන් උපාය මාර්ගික ආයෝජන සංකල්පය යටතේ ප්‍රතිපාදන ඉහළ නැංවීම.




## දේශීය සහ විදේශීය ණය කළමනාකරණය

ණය කළමනාකරණය සඳහා වූ ජාතික ණය කළමනාකරණ නියෝජිතායතනයක් පිහිටුවීම මගින් ''ජාතික ප්‍රමුඛතාවය'' පදනම යටතේ සියලු දේශීය හා විදේශීය ණය කළමනාකරණය සඳහා කටයුතු කරනු ඇත.



## අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා

සියලු ජනතාවට තම සිතැඟි හා ප්‍රමාණවත් අයුරින් අඛණ්ඩව අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා ලබාගැනීම සඳහා රජය උපාය මාර්ගිකව මැදිහත් වෙමින් දේශීය කෘෂිකර්මාන්තය ඇතුළු සියලු දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය වන පුළුල් ප්‍රතිපත්තියක පිහිටුවා කටයුතු කිරීම.



## තාක්ෂණය සහ නවෝත්පාදනය

නව නිර්මාණ දිරිගැන්වෙන ශ්‍රී ලාංකික පරිසරයක් ඇතිකර ගැනීම සඳහා නව ''ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයක්'' පිහිටුවීම මගින් නව ඇරඹුම් ව්‍යවසායකත්වයන් ඇතුළු සියලු ආකාරයේ නව නිර්මාණාත්මක නිෂ්පාදන සහ සේවාවන් දිරිමත් කිරීම සඳහා කටයුතු කරනු ඇත.



## ප්‍රාග්ධනය සඳහා ප්‍රවේශය

පසුගිය දශකය තුළ දිගින් දිගටම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඔවුන්ගේ පාලනයෙන් තොරව මුහුණ දුන් විවිධ අභියෝග නිසා ඔවුන් පත්ව ඇති ණය බරිත භාවයෙන් මුදගැනීම සඳහා රාජ්‍ය මැදිහත්වීම යෝජනා කරන අතර, නව ඇරඹුම් සඳහා සහන පදනම මත ණය සහ උපදෙස් ලබා දීම. ඒ ඒ ක්ෂේත්‍රයන්ට විශේෂිතව ණය සහ ණයවර ව්‍යාපෘති වෙනුවෙන් රාජ්‍ය උපකාරීත්වය. සංවර්ධන මූල්‍ය සහ දිරිගැන්වීම් සඳහා ප්‍රවේශය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විධිමත් හා කාර්යක්ෂම කිරීම සහ විශේෂිත සංවර්ධන බැංකු ස්ථාපිත කිරීම.

## මූල්‍ය



''සියල්ලන්ටම බැංකුකරණය'' දිරිගන්වමින් අනන්‍ය ඩිජිටල් හැඳුනුම් අංකය භාවිත කිරීම මගින් සීමිත කාලයක් තුළ ඩිජිටල් මුදල් ගනුදෙනු අනිවාර්ය කරමින් මුදල් ගනුදෙනු පාලනය කිරීම. පූර්ව අධ්‍යාපනයේ සිටම මුදල් සාක්ෂරතා වැඩසටහන් දියත් කිරීම. රාජ්‍ය බැංකුකරණය භාවිත කරමින් අඩු වියදම් බැංකු සේවාවන් තහවුරු කිරීම.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය



සමාගම් ලැයිස්තුගත කිරීම දිරිගැන්වීම, කලාපීය වෙළෙඳපොළ සහභාගිත්වය සඳහා පහසුකම් සැපයීම මගින් ආයෝජන සුරක්ෂිත කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සහ ව්‍යාපාර ප්‍රාග්ධනය වඩාත් පුළුල් කිරීම සහ පෞද්ගලික කොටස් අයිතිය මෙන්ම පොදු කොටස් අයිතිය ප්‍රවර්ධනය කිරීම.

## විදේශ ආයෝජන



ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ ප්‍රවර්ධනය පිණිස සම්ප්‍රදායෙන් ඔබ්බට ගිය අන්තර් ජාතික ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම. දේශීය වශයෙන් ධාරිතා සංවර්ධනය පිණිස දේශීය ව්‍යවසායකයින් සමග අන්තර්ජාතික සම්බන්ධතා දිරිගැන්වීම. සංවර්ධන නියාමන රාමුවක් තුළින් ව්‍යාපාර කිරීම සඳහා දිරිගැන්වීම සහ පහසුකම් වඩාත් කාර්යක්ෂම කිරීමට කටයුතු කිරීම. ආයෝජන හිතකාමී ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සම්මුති සඳහා වූ නීති රෙගුලාසි වඩාත් සුමට හා කාර්යක්ෂම කිරීම.

## සංචිත කළමනාකරණය



විදේශ ප්‍රේෂණ දිරිගැන්වීම සඳහා වූ විවිධාංගීකරණයෙන් යුත් සංවිධිත වැඩසටහනක් මගින් විදෙස් සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් දිරිමත් කිරීම. අපනයනයෙන් උපයන මුදල් නිවැරදි ලෙස නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන බව තහවුරු කිරීම සඳහා වහාම අපනයන කටයුතු සම්පූර්ණයෙන් ම ඩිජිටල් වේදිකාවක් මතට ගෙන ඒම සහ එමගින් අපනයන ගනුදෙනු විනිවිදභාවයට යටත් කිරීම.

## ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා අර්බුදයන්ට ප්‍රතිචාර දැක්වීම




ශ්‍රී ලංකාව මුහුණ දෙස ආර්ථික උච්ඡාවචනයන්ට මුහුණදීමේ හැකියාව තහවුරු කිරීම සඳහා ''අනිවාර්ය ජාතික විදේශ විනිමය සංචිතය'' පවත්වා ගෙන යෑම තහවුරු කිරීම.

## මහ බැංකුව



මූල්‍ය පද්ධති ස්ථාවරත්වය සඳහා එහි මධ්‍ය ක්‍රියාකාරීත්වය වෙනුවෙන් මහ බැංකුවට ස්වාධීනව මෙහෙයවීමට ඉඩ සලස්වන අතර, එය ව්‍යවස්ථාදායකයේ සුපරීක්ෂණය යටතේ තැබීමට කටයුතු කරනු ඇත. එසේම, එම ප්‍රතිපත්ති රජයේ ආර්ථික න්‍යාය පත්‍රය උදෙසා උපකාරී වන බවට වගබලා ගැනීම සඳහා ''ජාතික උපාය මාර්ගික සැලසුම් අධිකාරියේ'' නිරීක්ෂණයට යටත් කරනු ඇත.

# ව්‍යවසායකත්ව රාජ්‍යයේ මූලිකාංග

**රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය - 'සුහුරු පාලනයක්'**

සුහුරු පාලනය අනිවාර්ය අංගයක් බවට පත්වන උසස් තාක්ෂණික ප්‍රවේශයක් සමගින් ව්‍යවසායකත්ව රාජ්‍යයට සහාය වීම සඳහා ශක්තිමත් පරිපාලන පද්ධතියක් ගොඩනැගීම.

**තාරුණ්‍යය - 'පළමුව තාරුණ්‍යය'**

ප්‍රමුඛත්වය තාරුණ්‍යයට. ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට දියුණු වීමට අවශ්‍ය කුසලතා, අවස්ථා සහ අභිප්‍රේරණය ලබා දෙමින් ඔවුන් සවිබල ගැන්වීම. මෙහි අරමුණ වන්නේ වර්තමානයේ තාරුණ්‍යය මුහුණ දෙන ගැටලු විසඳීම සහ ඔවුන් ජාතියේ සංවර්ධනයට ක්‍රියාකාරීව සහභාගි විය හැකි ආධාරක පරිසරයක් නිර්මාණය කිරීමයි.

**බලශක්තිය - 'බලයෙන් බලවත්'**


දැරිය හැකි මිලකට සැමට සැම විට බලශක්තිය සපයමින් බලශක්ති සුරක්ෂිතභාවය තහවුරු කිරීම.

**අධ්‍යාපනය - 'විශිෂ්ටයෝ'**

සහජ ශ්‍රී ලාංකේය සාරධර්ම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් ශක්තිමත්, ගතික සහ නව්‍ය අධ්‍යාපන ක්‍රමයක් හරහා ජාතියේ මානව සම්පත් අවශ්‍යතා සපුරාලීමට පුරවැසියන් සූදානම් කරමින් ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරමින් විධිමත් රාමුවකට යටත්ව පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද සහාය ඇතිව උපාය මාර්ගිකව කළමනාකරණය කිරීම.

**සෞඛ්‍යය - 'සුවපත් මිනිසුන්'**

සැම පුරවැසියෙකුටම ජාත්‍යන්තර මට්ටමේ සෞඛ්‍ය රැකවරණයක් සහතික කෙරෙන ක්‍රියාශීලී කළමනාකරණය හා තාක්ෂණය මත පදනම් වූ විසඳුම් සහ පරිපූර්ණ සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිපත්ති තුළින් සියලුම පුරවැසියන්ගේ නිදහස් සෞඛ්‍යය සේවාව සහ යහපැවැත්ම සහතික කිරීම.



**පරිසරය - 'හරිත දිගන්තය'**

ශ්‍රී ලංකාව සතු ඉහළ ජෛව විවිධත්වය සුරකමින්, ආර්ථික වර්ධනය සමඟ පාරිසරික සංරක්ෂණය සමතුලිත කරන නව්‍ය, ව්‍යවසායක විසඳුම් හරහා තිරසර පරිසරයක් පෝෂණය කිරීම වෙනුවෙන් ක්‍රියාකිරීම/හරිත නවෝත්පාදනය, පුනර්ජනනීය බලශක්තිය, තිරසර කෘෂිකර්මාන්තය සහ ඵලදායී අපද්‍රව්‍ය කළමනාකරණය වැළඳ ගැනීම මගින් සංවර්ධනය සහ පාරිසරික භාරකාරත්වය අතර සමබර සමතුලිතතාවයක් ඇති කිරීම අපගේ අරමුණයි.

**සමාජ සුබසාධනය - 'හිතේ හයිය'**

යැපුම් මානසිකත්වය දුරු කිරීම, ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සහ තිරසර ආර්ථික සංවර්ධනය තුළින් පුරවැසියන් සවිබල ගන්වන යාන්ත්‍රණයක් බවට සමාජ සුබසාධන ආධාර පරිවර්තනය කිරීම.

**ප්‍රවාහනය - 'ගතට සතුට'**

නවීන තාක්ෂණය මුසුකරමින් කාර්යක්ෂම, තිරසර, සුවපහසු, ආරක්ෂිත ප්‍රවාහන සේවයක් දැරිය හැකි මිලකට ලබා දීම.

**තාක්ෂණය - 'බිසෝකොටුවෙන් ඔබ්බට'**

සියලු පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා තාක්ෂණය උපයෝගි කරගන්නා සුහුරු රටක් නිර්මාණය කරනු වස් ඩිජිටල් සංවර්ධනය ද ඇතුළුව තාක්ෂණය සහ විද්‍යාව දියුණු කරමින් නවෝත්පාදනයන් පෝෂණය කිරීම.

**කර්මාන්ත - 'පන්නරය'**

නවෝත්පාදනය හා ඉහළ ඵලදායිතාවය මත ගුණාත්මක රැකියා අවස්ථා බිහිකරමින් ශ්‍රී ලංකාව තුළ දේශීය නිෂ්පාදනය වැඩි කිරීමට හා ආනයන මත යැපෙන ආර්ථිකය අවම කිරීම අරමුණු කරගෙන නව ආයෝජන සඳහා පරිසරය නිර්මාණය කරන ව්‍යවසායකත්ව රාජ්‍යය තුළ ප්‍රමුඛතාවය මත තෝරාගත් කර්මාන්ත සංවර්ධනය කිරීම.

**ජාතික සමගිය - 'එකම මුතු'**

මව්බිමේ සභ්‍යත්වය මත පදනම් ව සමාජ විවිධත්වයට ගරු කරන එකමුතු ජාතියක් ගොඩනැගීම.

**ක්‍රීඩාව - 'ගතට සිතට'**


සෑම පසුබිමකින්ම දක්ෂයින් ක්‍රීඩාවට ආකර්ෂණය කර ගන්නා උසස් තත්ත්වයේ පුහුණුවක් සපයන සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ආරක්ෂාව සහ අවස්ථා ලබා දෙන ශක්තිමත් ක්‍රීඩා පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමෙන්, නිරෝගි සම්පන්න, විනය ගරුක, සාමූහිකව කටයුතු කරන ජාතියක් නිර්මාණය කිරීම තුළින් මව්බිම සන්නාමයක් ලෙස ක්‍රීඩාව තුළින් ඔසවා තැබිය හැකි ගෞරවනීය වෘත්තීය මාර්ගයක් බවට ක්‍රීඩාව පත්වන බව සහතික කිරීම.

**සංස්කෘතිය හා කලාව - 'පහන් පැල'**

සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කර මතුපරපුරට දයාද කිරීම රාජ්‍යයේ ප්‍රමුඛ වගකීමක් බව පිළිගනිමින් සියලු පුරවැසියන්ගේ කලා කුසලතා ඔප් නංවා පෝෂණය කිරීම, නවෝත්පාදන සංස්කෘතියක් බිහිකිරීම සහ කලාව, සාහිත්‍යය සහ සංස්කෘතිය එදිනෙදා ජීවිතයට බද්ධ කිරීම මගින් ප්‍රීතිමත් සහ නිර්මාණශීලී දේශප්‍රේමී සතුටු දූයක් බිහි කිරීම.

**නාවික, ගුවන් සහ අභ්‍යන්තර ප්‍රවාහන යටිතල පහසුකම් - 'ජීව නාලිකා'**

වරායයන් සහ ගුවන් තොටුපොළ ආශ්‍රිතව බැඳුණු නාවික සහ ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රය නූතනකරණය කිරීම තුළින් හා උපාය මාර්ගික පිහිටීමේ උපරිම පල නෙලාගනිමින් ශ්‍රී ලංකාව සමුද්‍රීය සහ නාවික කේන්ද්‍රයක් බවට පත් කිරීම.



**ආර්ථිකය - 'පොහොසත්'**

සියලු පුරවැසියන් සඳහා තිරසර වර්ධනයක් සහ සමෘද්ධියක් සහතික කරන ව්‍යවසායකත්වය, නවෝත්පාදන සහ උපාය මාර්ගික ආයෝජන මගින් මෙහෙයවනු ලබන ගෝලීය වශයෙන් තරගකාරී, ගතික, අභියෝගයන්ට මුහුණ දිය හැකි නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීම.

**විදේශ සබඳතා - 'බහු බැඳි නිදහස'**

මව්බිමේ අභිලාශයන් ප්‍රමුඛත්වයේ තබමින් ශ්‍රී ලංකාවේ ගෝලීය සන්නාම අගය ඉහළ නංවා ගනිමින් ජාතික අවශ්‍යතා වැඩි දියුණු කිරීම, කලාපීය සාමය සහතික කිරීම සහ ආර්ථික වර්ධනය පෝෂණය කිරීම සඳහා විදේශ සබඳතා උපාය මාර්ගිකව කළමනාකරණය කිරීම.

**නූතන මූල්‍ය සම්පත් කළමනාකරණය පිළිබඳ දැක්ම - 'ධනවත්'**

සියලු පුරවැසියන් හට සමානාත්මතාවය මත පදනම් වූ මූල්‍ය ස්ථාවරත්වයක් සහ දියුණු ජීවන තත්ත්වයක් සහතික කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික විභවයන් උපරිම කරන ශක්තිමත්, විනිවිදභාවයෙන් යුත් තිරසර මූල්‍ය කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම.

**නීල ආර්ථිකය - 'නිල්වන්'**

සමුද්‍රීය සම්පත් තිරසර ලෙස භාවිත කරමින් ද ශ්‍රී ලංකාවේ භූමිය මෙන් සත් ගුණයක් විශාල අනන්‍ය ආර්ථික කලාපය, විසිතුන් ගුණයක් පමණ විශාල මහද්වීපික තඩාගය සතු මහා සාගර සම්පත් සහ ශ්‍රී ලංකාවේ සියලුම අභ්‍යන්තර ජලාශවල උපරිම උපයෝජනය මව්බිම වෙත දයාද කිරීම.

**යුක්තිය - 'සැමට සම සේ'**

නීතියේ ආධිපත්‍යය සවිමත් කර, මානව හිමිකම් සුරැකීම ප්‍රවර්ධනය කිරීමෙන් සෑම පුද්ගලයෙකුට ම සම සේ සැලකීමත් නීතිමය රැකවරණයට සම අවස්ථා ලැබීමත් සහතික කිරීමෙන් සාධාරණ සමාජයක් බිහි කිරීම.

**ජාතික ආරක්ෂාව - 'රන්වැට'**

ශ්‍රී ලංකාවේ පිහිටීමේ උපාය මාර්ගික වැදගත්කම හඳුනාගනිමින් දේශීය වශයෙන් හා ගෝලීය ව එල්ලවන සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන තර්ජන ද හඳුනාගනිමින් රාජ්‍ය තාන්ත්‍රිකභාවය, බුද්ධි තොරතුරු සහ තාක්ෂණය මත පදනම් වූ ඒකාබද්ධ ආරක්ෂක උපාය මාර්ගයක් ඔස්සේ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සහතික කිරීම.

**වැවිලි, කෘෂිකර්මය සහ පශු සම්පත් හා ධීවර - 'ගොවිවරු'**

සොබා සම්පත් තිරසර ලෙස භාවිත කරමින් ද නාස්තිය අවම කරමින් ද නැවුම් තාක්ෂණය මුසුකරමින් ද ගොවිජනතාවගේ ජීවන තත්ත්වය නංවාලමින් ද සැමට සැම දින නැවුම්, පිරිසිදු, පෝෂ්‍යදායී ආහාර සැපයීම.

**දේශපාලන ප්‍රතිසංස්කරණ - 'උඩු ගං බලා'**

ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ඔප් නැංවන, දේශපාලකයින් විසින් ප්‍රායෝගික පොරොන්දු ජනතාවට ලබා දෙන, දුන් පොරොන්දු ඉටු කරන වග වීමේ දේශපාලන සංස්කෘතියක් බිහි කිරීම.

# අධ්‍යාපනය - 'විශිෂ්ටයෝ'

සෑම දරුවකුටම අධ්‍යාපනය ලබාදීම රජයේ මූලික වගකීම ලෙස පිළිගනිමින් සහජ ශ්‍රී ලාංකේය සාරධර්ම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් ශක්තිමත්, ගතික සහ නව්‍ය අධ්‍යාපන ක්‍රමයක් හරහා ජාතියේ මානව සම්පත් අවශ්‍යතා සපුරාලීමට පුරවැසියන් සූදානම් කරමින්, ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරමින්, විධිමත් රාමුවකට යටත් ව පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද සහාය ඇතිව, ඒ සඳහා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සුදුසු විශේෂඥයින්ගෙන් සැදුම්ලත් කොමිෂන් සභාවක් යටතේ උපාය මාර්ගික ව කළමනාකරණය කිරීම.

## ව්‍යවසායකත්ව රාජ්‍යයක් සඳහා අධ්‍යාපනය

- **උපාය මාර්ගික කළමනාකරණය:** රාජ්‍යයේ සංවර්ධන සැලසුම් හා ජාතික මානව සම්පත් අවශ්‍යතාවයද සැලකිල්ලට ගෙන ආයෝජන ප්‍රභවයක් ලෙස ශ්‍රී ලංකාවේ අධ්‍යාපන දර්ශක පිහිටුවීම.
- **ජාතික මානව සම්පත් නියෝජිතායතනය:** ජාත්‍යන්තර ප්‍රවණතාවයන් සලකා දත්ත රැස් කිරීමට, ප්‍රවණතා විශ්ලේෂණය කිරීමට, දේශීය හා ගෝලීය අවශ්‍යතා පුරෝකථනය කිරීමට සහ රටේ මානව සම්පත් සංවර්ධනය කළමනාකරණයට කැප වූ අධිකාරියක් පිහිටුවීම. ආබාධිත පුද්ගලයන් ඇතුළු සුවිශේෂ ක්ෂේත්‍ර පිළිබඳ දත්ත එක්රැස් කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා හඳුනාගැනීම ද මෙම ආයතනයේ වගකීමකි.
- **පුද්ගලික ජෛව දත්ත:** සෑම ශ්‍රී ලාංකිකයෙකුටම ගැළපෙන අධ්‍යාපනික සහ වෘත්තීය සංවර්ධනය සඳහා යාවත්කාලීන මෙන්ම ඩිජිටල් ජෛව දත්ත ඇති බවට සහතික වීම.

## මුල් ළමාවිය අධ්‍යාපනය

- **මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය:** අධිකාරිය ප්‍රතිපත්ති සැලසුම් කිරීම, ගුරු අධ්‍යාපනය සහ යටිතල පහසුකම් අධීක්ෂණය කරනු ඇත.
- **රජය විසින් අධීක්ෂණය කරන ලද පෙර පාසල්:** පවතින පෙර පාසල්, පූර්ව ව්‍යවසායකත්ව සංකල්ප හඳුන්වා දීම ඇතුළු පුළුල් ක්‍රියාකාරකම් මත පදනම් වූ විෂය මාලාවක් සමග රජය විසින් නියාමනය කරනු ලබන ආයතන බවට පරිවර්තනය කරනු ලැබේ. ඒ අනුව 2025. 01. 01 සිට සියලු පෙර පාසල් ගුරුවරු පුහුණු කිරීම ඇරඹේ.
- **අරමුදල්:** ළමයින් සංඛ්‍යාව අනුව පෙර පාසල් සඳහා රජය විසින් මූල්‍ය අනුග්‍රහය ලබා දෙන අතර, ළමුන්ගේ පූර්ණ කායික හා මානසික වර්ධනය සඳහා අවශ්‍ය සියලු පියවර ගනු ඇත. ධනාත්මක ආකල්ප සහිත සමාජානුයෝජනය කේන්ද්‍රීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අනාගතයේ බහුපරමාර්ථ ශ්‍රමිකයෙකුගේ පෞර්ෂත්ව සංවර්ධනයක් වනු ඇත.

## ප්‍රාථමික අධ්‍යාපනය (1-5 ශ්‍රේණි)

- **ක්‍රියාකාරකම් පාදක විෂය නිර්දේශය:** ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාව ක්‍රියාකාරකම් පාදක වූ විෂය නිර්දේශයක් බවට පරිවර්තනය කරමින් නිර්මාණාත්මක චින්තනයට මග පාදනු ලැබේ.
- **විභාග:** විභාග අනිවාර්ය නොවන අතර ඇගැයීම් අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් භාවිත කරනු ලැබේ.
- **සමාන අධ්‍යාපනයක්:** සෑම ප්‍රාථමික පාසලකට සමාන පහසුකම් ලබාදීමෙන් සෑම දරුවෙකුටම සමාන අධ්‍යාපනයක් තහවුරු කිරීම.
- **මව්බස:** ප්‍රාථමික අධ්‍යාපනය මව්බසින් හැදෑරීම අනිවාර්ය කිරීම හා ද්විතියික භාෂාවන් සඳහා ප්‍රවේශ හිමිකම ලබා දේ.

## කණිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය (6-9 ශ්‍රේණි)

- **විස්තීරණ විෂය මාලාව:** විෂයයන් ලෙස විද්‍යාව, ගණිතය, මව් භාෂාව, ද්විතීයික භාෂාව, ජාත්‍යන්තර භාෂාව, ආගම, ඉතිහාසය, පරිගණක විද්‍යාව, සෞන්දර්ය අධ්‍යයනය, ප්‍රජාචාරය සහ ව්‍යවසායකත්වය ඇතුළත් වේ.
- **නීතිය:** ප්‍රජාචාරය යටතේ සිවිල් නීතිය, අපරාධ නීතිය බදු හා විවිධ පරිපාලන නීති පිළිබඳ දැනුමක් ලබා දීම තුළින් නීතිගරුක පුරවැසියන් බිහි කිරීමේ පදනම සැපයීම.
- **විභාග:** ආගම, සෞන්දර්ය අධ්‍යයනය, සිවිල් අධ්‍යයනය සහ ව්‍යවසායකත්වය හැර අනෙකුත් සියලුම විෂයයන් සඳහා විභාග පවත්වනු ලැබේ.

- **සහතික කිරීම සහ නිපුණතා සංවර්ධනය:** ආගමික ආයතනවලින් සහ ක්‍රීඩා, සෞන්දර්යාත්මක අධ්‍යයන, විශේෂ කුසලතා සඳහා ලැබෙන සහතික සඳහා පිළිගැනීමක් ඇති කිරීම.

- **කඩඉම් විභාගයක්:** ජාතික මට්ටමේ කඩඉම් විභාගයක් නමය ශ්‍රේණියේදී පැවැත්වීමෙන් අනාගත අධ්‍යාපන ධාරාව තෝරා ගැනීමේ අවස්ථාව දරුවන්ට ඇති කිරීම.

- **ව්‍යවසායකත්ව සාමූහික:** දරුවන්ගේ නිර්මාණශීලිත්වය හා මූල්‍ය කළමනාකරණ හැකියාව වර්ධනය කිරීමට පාසල් තුළ ව්‍යවසායකත්ව සාමූහික ඇති කිරීම.

## ජ්‍යෙෂ්ඨ ද්විතීයික සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය

### ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය (10-11 ශ්‍රේණි)

- **ජ්‍යෙෂ්ඨ ද්විතීයික විෂය මාලාව:** විද්‍යා, ගණිත, වාණිජ, කලා, වෘත්තීය පුහුණුව හා තාක්ෂණික ධාරාවන් ඔස්සේ පාසලේ අවසන් වසර දෙක වන 10 සහ 11 ශ්‍රේණිවල අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ඇති කිරීම තුළින් 11 ශ්‍රේණිය අවසානයේදී උසස් පෙළ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ඇති කිරීම. උසස් පෙළ විභාග සඳහා සූදානම් කිරීමේදී ව්‍යවසායකත්වය සහ ජීවන කුසලතා අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු කිරීම.

### විශ්වවිද්‍යාල අධ්‍යාපනය

- යෞවනයේ ජවසම්පන්න කාලය විශ්වවිද්‍යාල තුළ ඵලදායිව ගෙවා දමමින් සමබර පෞර්ෂත්වයකින් යුතු බහුපරමාර්ථ විද්‍යාර්ථීන් බිහි කිරීමේ මධ්‍යස්ථාන බවට පත් කරමින් වයස අවුරුදු 22 වන විට උපාධිය නිමා කිරීමේ පහසුකම් තහවුරු කිරීම.

- **සිසුන් තෝරා ගැනීම:** විශ්වවිද්‍යාල ප්‍රවේශයේ දී දිස්ත්‍රික් පදනම වෙනුවට පාසල් වර්ගීකරණය පදනම් කරගෙන සිසුන් තෝරා ගැනීම සිදු කෙරේ.

- **ප්‍රායෝගික පුහුණුව:** සෑම පාඨමාලාවකටම විෂයානුබද්ධ ප්‍රායෝගික රැකියා පුහුණුවක් අනිවාර්ය කෙරේ. ව්‍යවසායකත්ව මනස සහ ජීවන කුසලතා වර්ධනය සඳහා කටයුතු යොදනු ලැබේ.

- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සහ කළමනාකරණය:** විශ්වවිද්‍යාලවලට ප්‍රතිපාදන වෙන් කරනු ලබන අතර, ස්වාධීන කළමනාකරණ ආයතනයක් විසින් මෙම ක්‍රියාවලිය පාලනය කරනු ලැබේ.

- **විශේෂීකරණය වූ විශ්වවිද්‍යාල:** භූගෝලීය සහ මානව සම්පත මත පදනම් විශේෂීකරණය වූ විශ්වවිද්‍යාල පද්ධතියක් ඇති කිරීම.

- **විශ්වවිද්‍යාල නියාමනය:** රාජ්‍ය හා පුද්ගලික විශ්වවිද්‍යාල නියාමනය ශක්තිමත් කිරීම.

### විශේෂිත අධිකාරීන්

- **සමාජ කුසලතා අධ්‍යාපන අධිකාරිය:** අභිප්‍රේරිත ශ්‍රී ලාංකිකයෙකු බිහි කරගැනීම සඳහා අවශ්‍ය වන නායකත්වය හා අන්තර්පුද්ගල කුසලතා වර්ධනය කිරීම මෙම ආයතනයේ වගකීමයි.

- **පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ අධිකාරිය:** පිරිවෙන් අධ්‍යාපනය නියාමනය සහ කළමනාකරණය කිරීම. දැනට පවතින ආයතන ඒකාබද්ධ කිරීම. උත්තරීතර බලයක් එක්කිරීම.

- **ගුරු පුහුණු අධිකාරිය:** පෙර පාසලේ සිට සරසවිය දක්වා ගුරු භවතුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා අඛණ්ඩ පුහුණුව ලබා දීම.

- **පෞද්ගලික අධ්‍යාපන නියාමන අධිකාරිය:** සමස්ත පෞද්ගලික අධ්‍යාපනය හා එහි සියලු අංශයන් නියාමනය කිරීම වෙනුවෙන් පිහිටුවනු ලබන ආයතනයකි.

### අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැටුප් සහ දීමනා

- **ගුරු වැටුප් කේන්ද්‍රීය ක්ෂේත්‍රයක් ලෙස:** අධ්‍යාපන සේවයේ නියුතු සියලු වෘත්තිකයින්ගේ සියලු වැටුප් විෂමතා ඉවත් කරමින්, ශ්‍රී ලංකාවේ ඉහළම වැටුප් ලබන්නන්ගේ මට්ටම ට ගෙන ඒමට කටයුතු කරනු ඇත.

# සෞඛ්‍යය - 'සුවපත් මිනිසුන්'

සෑම පුරවැසියෙකුටම ජාත්‍යන්තර මට්ටමේ සෞඛ්‍ය රැකවරණයක් සහතික කෙරෙන ක්‍රියාශීලී කළමනාකරණය හා තාක්ෂණය මත පදනම් වූ විසඳුම් සහ පරිපූර්ණ සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිපත්ති තුළින් සියලුම පුරවැසියන්ගේ නිදහස් සෞඛ්‍ය සේවාව සහ යහපැවැත්ම රජයේ වගකීමක් බව පිළිගනිමින් සහතික කිරීම.

### පවුල් සෞඛ්‍ය කාර්යාංශය නවීකරණය හා බලගැන්වීම

- නිරෝගී ගෘහණියක්, නිරෝගී මවක් තුළින් නිරෝගී ජාතියක් ගොඩනැගීම.
- මාතෘ සහ ළදරු සෞඛ්‍ය පිළිබඳ උසස් ප්‍රමිතීන් සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සියලු දරු උපත් නියමිත සෞඛ්‍ය සම්පන්න මට්ටමට ගෙන ඒම.
- පිරිසිදු පානීය ජලය සියලුම ජනතාවට ලබාදීම රජයේ මූලික වගකීමක් ලෙස පිළිගනු ලබන අතර, අපගේ ප්‍රමුඛ කාර්යයක් ලෙස ගෙන නිමා කරනු ඇත.

### ජාතික රෝග නිවාරණ සහ සැලසුම් ආයතනය

- බෝ නොවන රෝග වැළැක්වීම ප්‍රමුඛතාවක් සේ සලකා ඒ සඳහා විශේෂිත ආයතනයක් පිහිටුවීම.
- රෝග පැතිරීම් සහ සෞඛ්‍ය ප්‍රවණතා නිරීක්ෂණය කිරීමට, පුරෝකථනය කිරීමට සහ පාලනය කිරීමට තාක්ෂණය සහ දත්ත භාවිත කිරීම.
- රෝග නිවාරණය සඳහා බටහිර, හෙළ, ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රමයන් භාවිත කිරීමේ ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.
- ආහාරවල ගුණාත්මකභාවය හා ප්‍රමිතිය සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කිරීම.
- අනාගත ජනගහන සංයුතිය කෙරෙහි අවධානය යොමු කරමින් වැඩිවන වැඩිහිටි ජනගහනය ගැන විශේෂ අවධානයකින් කටයුතු කිරීම.
- ටෙලි සෞඛ්‍ය සේවය (ටෙලි මෙඩිසින්) හඳුන්වා දීම මගින් දුෂ්කර ප්‍රදේශවල ඇති අඩුපහසුකම් නිසා ඇතිවන සෞඛ්‍ය ගැටලු විසඳීම.

### ක්‍රීඩා සහ විනෝදාස්වාදය කෙරෙහි අවධානය යොමු කිරීම

- සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක අත්‍යවශ්‍ය අංගයන් ලෙස ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම. සියලුම පාසල් සිසුන් අවම වශයෙන් මළල ක්‍රීඩා දෙකක් සඳහා යොමු කළ යුතු බව.
- සියලුම වයස් කාණ්ඩවල ශාරීරික ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය දිරිගැන්වීම සඳහා යටිතල පහසුකම් සහ වැඩසටහන් සංවර්ධනය කිරීම.

### මානසික සෞඛ්‍යය කෙරෙහි අවධානය

- පුළුල් මානසික සෞඛ්‍ය සේවා සැපයීම මගින් මානසික සෞඛ්‍යය ඉහළ නැංවීම.
- ඍණාත්මක, පසුගාමී මානසිකත්වයට එරෙහිව සහ මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපාර දියත් කිරීම. ඒ සඳහා සියලු ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය උපයෝගී කර ගැනීම. ඒ සඳහා සියලුම ජනමාධ්‍ය උපයෝගී කර ගනිමින් 2024.12.31 දිනට වැඩි පිළිවෙළක් දියත් කිරීම.

### ජාතික සෞඛ්‍ය රක්ෂණ අරමුදල

- සියලුම පුරවැසියන් සඳහා මූල්‍ය ආවරණය සැපයීම වෙනුවෙන් ජාතික සෞඛ්‍ය රක්ෂණ අරමුදලක් හඳුන්වා දීම. පෞද්ගලික අභිමතය පරිදි, හදිසි සෞඛ්‍ය අවශ්‍යතා සඳහා පෞද්ගලික නැතිනම් විදේශගත සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමේ අවකාශය.
- සෑම පුරවැසියෙකුටම දැරිය හැකි සහ ගුණාත්මක සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශ සහතික කිරීම.

### පළාත් සඳහා රෝහල් 9ක්

- භෞතික හා මානව සම්පත් ලබාදීම මගින් පළාත් රෝහල් 9 ක් ජාතික රෝහලේ පහසුකම් මට්ටමට සංවර්ධනය කිරීම.

### ඖෂධ

- අත්‍යවශ්‍ය සහ අත්‍යවශ්‍ය-නොවන ඖෂධ වර්ගීකරණය යාවත්කාලීන කිරීම. රටේ ඖෂධ අවශ්‍යතාව නිශ්චිත දත්ත මත පදනම් ව තීරණය කිරීම සහ එමගින් අක්‍රමිකතාවලට වැට බැඳීම. සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තියට සමාන  ඖෂධ ප්‍රතිපත්තියක් 2025.01.01 දින සිටම ඇතිකිරීම.

- දේශීය ව ඖෂධ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ දේශීය ඖෂධ ව්‍යවසායකයන් රැකගැනීමට කටයුතු යෙදීම. දේශීය හා විදේශීය වශයෙන් දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම තුළින් ධරණීය සරල සෞඛ්‍ය රටාවට ජනතාව හුරු කිරීම තුළින් දේශීය වෛද්‍ය වෘත්තිය ශක්තිමත් කිරීම.

### දේශීය වෛද්‍ය අධිකාරිය

- දේශීය වෛද්‍ය ක්‍රම නියාමනය කිරීමට සහ එම ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට අධිකාරියක් පිහිටුවීම. විශේෂයෙන් සංචාරක කර්මාන්තය හා සම්බන්ධ කිරීමෙන් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය පුරෝගාමී ආර්ථික ප්‍රභවයක් ලෙස පෙරට ගැනීම මෙමගින් එක් වර්ෂයක් තුළදී ස්වයං මූල්‍යන උත්පාදන ක්ෂේත්‍රයක් බවට ආයුර්වේද ක්ෂේත්‍රය පත් කිරීම.

- සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රාදේශීය විෂමතාවන් ඉවත් කිරීම සඳහා වෛද්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ නිර්දේශ මත අවශ්‍ය පියවර කඩිනමින් ක්‍රියාත්මක කිරීම.

- සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පුරෝගාමී සේවය, වෛද්‍ය සේවය ලෙස හඳුනාගනිමින් වෛද්‍ය වෘත්තිකයන්ගේ සියලු වෘත්තීය ගැටලු වෙන වෙනම විසඳීමටත් තෘප්තිමත්ව පවත්වා ගැනීමටත්, සෞඛ්‍ය පද්ධතියට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමුඛතා පදනම මත සැපයීමටත් ප්‍රමුඛතම කාර්යයක් ලෙස ආරම්භ කරනු ලැබේ.

# පරිසරය - 'හරිත දිගන්තය'

ශ්‍රී ලංකාව සතු ඉහළ ජෛව විවිධත්වය සුරකිමින්, ආර්ථික වර්ධනය සමඟ පාරිසරික සංරක්ෂණය සමතුලිත කරන නව්‍ය, ව්‍යවසායක විසඳුම් හරහා තිරසර පරිසරයක් පෝෂණය කිරීම වෙනුවෙන් ක්‍රියාකිරීම
හරිත නවෝත්පාදනය, පුනර්ජනනීය බලශක්තිය, තිරසර කෘෂිකර්මාන්තය සහ ඵලදායි අපද්‍රව්‍ය කළමනාකරණය වැළඳ ගැනීම මගින් සංවර්ධනය සහ පාරිසරික භාරකාරත්වය අතර සමබර සමතුලිතතාවයක් ඇති කිරීම අපගේ අරමුණයි.

## හරිත නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය

- **පාරිසරික නවෝත්පාදන කේන්ද්‍රයන්:** තිරසර තාක්ෂණ සහ විසඳුම් සංවර්ධනය කරන ආරම්භකයින්ට සහ ව්‍යවසායකයින්ට සහාය වීම සඳහා පාරිසරික නවෝත්පාදන මධ්‍යස්ථාන පිහිටුවීම.
- **හරිත අරමුදල්:** ගෝලීය උණුසුම අවම කිරීම හා පරිසර හිතකාමී භාවිතයන් ක්‍රියාත්මක කරන සහ හරිත නිෂ්පාදන සංවර්ධනය කරන ව්‍යාපාර සඳහා ප්‍රදාන, ණය සහ දිරිගැන්වීම් මෙන්ම හරිත බැඳුම්කර ලබා දීම.
- **කාබන් වෙළෙඳාම:** ශ්‍රී ලංකාවේ හරිත ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනයට කාබන් වෙළෙඳාම භාවිත කිරීමට ජාතික කාබන් අරමුදල සක්‍රිය කිරීම.
- **තිරසර ව්‍යාපාර පිළිවෙත්:** අපද්‍රව්‍ය අවම කිරීම, ප්‍රතිචක්‍රීයකරණය සහ පුනර්ජනනීය බලශක්ති භාවිතය වැනි තිරසර භාවිතයන් අනුගමනය කරන ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රතිලාභ ලබා දීම. වසරක් තුළ ගෘහස්ත ජීව වායු ඒකක 50,000 ක් ස්ථාපිත කර, ඒ සඳහා ප්‍රවේශ වීම.

## තිරසර කෘෂිකර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාව

- **කෘෂි-ව්‍යවසායකත්වය:** කෘෂිකර්ම පිළිවෙත් සහ තාක්ෂණය භාවිතයට කෘෂි ව්‍යවසායකයින්ට සහාය වීම. කාර්යක්ෂමතාවය හා ඵලදායිත්වය වර්ධන ක්‍රියාමාර්ග හඳුන්වාදීම. මෙමගින් කන්න දෙකක් වෙනුවට කන්න තුනක් වගාකිරීම, තේ, පොල් වැනි වගාවල ඵලදායිත්වය ඉහළ නැංවීමේ ප්‍රවේශයන් ගැනීම තුළින් නිෂ්පාදනය ඉහළ දැමීම.
- **සුහුරු කෘෂිකර්මය:** කාර්යක්ෂමතාව වැඩි කිරීමට සහ පාරිසරික බලපෑම අවම කිරීමට නිරවද්‍ය ගොවිතැන සහ අන්තර්ජාල භාවිතය තුළින් (IoT) තාක්ෂණය වැනි සුහුරු කෘෂිකර්ම විසඳුම් ක්‍රියාත්මක කිරීම.
- **සමුද්‍ර සම්පත් කළමනාකරණ අධිකාරිය:** ශ්‍රී ලංකාවේ භූමිය මෙන් සත් ගුණයක් විශාල සුවිශේෂී ආර්ථික කලාපය ද විසිතුන් ගුණයක් විශාල මහාද්වීපික තටාගයද සතු සම්පත් ජාතික ආර්ථිකයට මුසු කිරීම මෙම අධිකාරියේ වගකීමයි. නීල ආර්ථිකය බලගැන්වීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමද අධිකාරිය සතු වගකීමකි.

## පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

- **පුනර්ජනනයන් සඳහා ආයෝජන:** රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් හරහා සූර්ය, සුළං, ජල සහ හරිත හයිඩ්‍රජන් වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සඳහා ආයෝජනය දිරිමත් කිරීම.
- **බලශක්ති නවෝත්පාදන ප්‍රදාන:** නව්‍ය පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සහ ආරම්භකයින් සඳහා ප්‍රදාන සහ සහනාධාර පිරිනැමීම.
- සෑම අමාත්‍යාංශයක් සඳහා ම තිරසර සංවර්ධන නිර්නායක හා ඉලක්ක ඒ ඒ වර්ෂයේ අයවැය ලේඛනය සමගම ලබාදෙන අතර, 2025 සඳහා 2024 නොවැම්බර් මස අග ලබා දෙනු ඇත.

## අපද්‍රව්‍ය කළමනාකරණය සහ චක්‍රීය ආර්ථිකය

- **චක්‍රීය ආර්ථික ආකෘතීන්:** ව්‍යාපාර ඔවුන්ගේ මුළු ජීවන චක්‍රය ම මනසේ තබාගෙන නිෂ්පාදන සැලසුම් කිරීමට දිරිගන්වන චක්‍රීය ආර්ථික මූලධර්ම ප්‍රවර්ධනය කිරීම.
- **ප්‍රතිචක්‍රීයකරණය සහ උපචක්‍රීයකරණ ආරම්භය:** අපද්‍රව්‍ය වටිනා සම්පත් බවට පත් කිරීමට ප්‍රතිචක්‍රීයකරණය සහ භාවිත කළ හැකි ද නැවත භාවිත කළ හැකි ලෙස සකසමින් උපචක්‍රීයකරණය කෙරෙහි අවධානය යොමුකිරීමට ආරම්භක සහාය ලබා දීම.

- **ශුන්‍ය අපද්‍රව්‍ය ප්‍රවේශ:** අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම සහ සම්පත් කාර්යක්ෂමතාව උපරිම කිරීම සඳහා ප්‍රජාව අතර සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ ශුන්‍ය අපද්‍රව්‍ය ප්‍රවේශ දියත් කිරීම සඳහා නිර්නායක හා ප්‍රමිත ඇති කරමින් නීති හා රෙගුලාසි පැනවීම.

### විවිධාංගීකරණය වූ වැඩපිළිවෙළක්

- **ජාතික තිරසර සංවර්ධන සභාව:** ශ්‍රී ලංකාවේ අනාගතය ස්වාභාවික ධනයේ මූලික සාධක වන වායුගෝලීය ජල සහ පාංශු සංරක්ෂණය පදනම් ව ගොඩනැගීම සඳහා අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් ජාතික තිරසර සංවර්ධන සභාවක් පිහිටුවීම.
- **පරිසරහිතකාමී වාහන:** ඛනිජ තෙල් භාවිත කරන වාහන ක්‍රමානුකූලව භාවිතයෙන් බැහැර කර පළමු අදියරේ දී දෙමුහුන් වාහන හා අවසානයේ දී පරිසර හිතකාමී වාහන යොදාගැනීම. ඒ සඳහා විද්‍යුත්, දෙමුහුන් සහ හයිඩ්‍රජන් වාහන සඳහා ආනයන බදු අඩු කිරීම.
- 2035 වන විට ත්‍රිරෝද රථ හා කුඩා රථවාහන 100%ක් පුනර්ජනනීය බලශක්තියෙන් ධාවනය කෙරෙන බව සහතික කිරීම.
- **දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීම:** දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර අරමුදලෙන් මුදල් ලබාගෙන දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීම සඳහා කෘෂිකර්මය, සෞඛ්‍යය, ඉදිකිරීම් සහ ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි අනුවර්තන සිදුකිරීම.
- ශ්‍රී ලංකාව දේශගුණික බලපෑම්වලට දැඩිව ගොදුරුවන රටක් ලෙස පිළිගැනෙන බැවින් ඝර්ම කලාපීය දූපත් රාජ්‍යවල සිදුවන හානි සඳහා කාබන් අධිවිමෝචන රටවලින් වන්දි ලබාගැනීමට ජාත්‍යන්තර සම්මුතියක් දියත් කිරීමට නායකත්වය ගැනීම.
- බලශක්ති, ප්‍රවාහන, කර්මාන්ත, ඉදිකිරීම් සහ කෘෂිකර්ම ක්ෂේත්‍රයන්හි අවශ්‍ය පරිසර හිතකාමී ප්‍රතිසංස්කරණ සඳහා හරිත බැඳුම්කර නිකුත් කිරීම.
- ශ්‍රී ලංකාවේ හරිත වානාන්තර සහ ජෛව විවිධත්වය සංරක්ෂණය පදනම් කරගත් හරිත බැඳුම්කර හඳුන්වා දීම හා රටට අනන්‍ය ජෛව ආරක්ෂණය කිරීම.
- ආක්‍රමණශීලී ජීවීන්ගෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම සඳහා වැඩපිළිවෙළක් සැකසීම. එවැනි හානිකර ජීවීන් හා බීජ රටට ඇතුළුවීම වැළැක්වීමට රේගුව සහ වරාය සම්බන්ධකරගත් වැඩ පිළිවෙළක්.

### ආපද කළමනාකරණය

- ජලගැලීම්වලින් සිදුවන විපත් අවම කිරීම සඳහා ජලගැලීම් කලාප පුරා ජල රැඳවුම් සංරක්ෂණය, ප්‍රතිසංස්කරණය, නව ඉදිකිරීම් හා නවීන තාක්ෂණික ප්‍රවේශයන් තුළින් විසඳුම් ක්‍රියාත්මක කිරීම.
- ස්වාභාවික විපත්වලට මුහුණ දිය හැකි අයුරින් ජනාවාස සහ ඉදිරිකිරීම් ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම තුළින් භූ ස්ථායිතාවය ආරක්ෂා කිරීම හා තුලනය කිරීම.
- තෙත් කලාපය ජලගැලීම්වලින් පීඩා විඳින අතරේ වියළි කලාපය ජල හිඟයෙන් පීඩා විඳින බැවින් කළු ගඟ සහ නිල්වලා ගඟ ආශ්‍රිතව සදකල් පවතින ගංවතුර පාලනයත්, එම ජලය වියළි කලාපයට හැරවීමෙන් ජල විපත්වලට මෙන්ම ජල හිඟයට ද එකවර විසඳුම් ලබා දීම. 2025 වර්ෂය තුළදී සම්පූර්ණ සාධ්‍යතා අධ්‍යයනය නිමකර 2026 දී ව්‍යාපෘති ආරම්භ කර වසර 5 ක් තුළ 2030.12.31 නිමාවට පත් කරනු ලැබේ.

# රාජ්‍ය පරිපාලනය සහ කළමනාකරණය - 'සුහුරු පාලනයක්'

සුහුරු පාලනය අනිවාර්ය අංගයක් බවට පත්වන උසස් තාක්ෂණික ප්‍රවේශයක් සමඟින් ව්‍යවසායකත්ව රාජ්‍යයට සහාය වීම සඳහා ශක්තිමත් පරිපාලන පද්ධතියක් ගොඩනැගීම.

## කුසලතාවට මුල්තැන

- රාජ්‍ය සේවයට බඳවා ගැනීම දේශපාලන මැදිහත්වීමෙන් තොරව කුසලතා මත පදනම් ව විභාග ක්‍රමයකින් පමණක් සිදුකිරීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව රාජ්‍ය සේවයේ පවතින විවිධ සේවාවන් නියෝජනය වන පරිදි 2024.12.31. දින වන විට ප්‍රතිව්‍යුහගත කිරීම.
- රාජ්‍ය සේවයේ වැටුප් තීරණය කිරීම ජාතික මානව සම්පත් අධිකාරියේ නිර්දේශ අනුව පමණක් සිදු කිරීම, සඳහා 2024.12.31 වන විට බලය පවරන නීති සම්පාදනය.

## ජාතික උපාය මාර්ගික සැලසුම් අධිකාරිය

- අගමැති ප්‍රධානත්වය දරන මෙම අධිකාරිය දේශපාලනඥයින්, නිලධාරින්, විද්වතුන් වෘත්තීයවේදීන්, සේවක සභා සහ ව්‍යවසායකයින්ගෙන් සමන්විත වන අතර, පාර්ලිමේන්තුව පත්වී මාස 3ක් තුළ මීට අදළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ.
- දැනට පවතින රාජ්‍ය ආයතන ඒකාබද්ධ කරමින් දිගුකාලීන ජාතික උපාය මාර්ගික සැලසුම් සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වගකිව යුතු අධිකාරියක් පාර්ලිමේන්තුව පත්වී මාස 3ක් තුළ පිහිටුවනු ලැබේ.
- පොදු ජාතික ඉලක්ක කරා යන ප්‍රයත්න පෙළගැස්වීම සඳහා විවිධ රාජ්‍ය ආයතන සහ අංශ අතර සම්බන්ධීකරණය සඳහා සුදුසු යාන්ත්‍රණයක් බලතල සහිතව පාර්ලිමේන්තුව තුළ ස්ථාපිත කිරීම.

## සැමට සම පරිපාලන ඒකක

- රට පුරා ඇති පරිපාලන ඒකකවල ව්‍යුහය සහ කාර්යයන් ප්‍රමිතිගත කිරීම.
- කාර්යක්ෂමතාවය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා සේවා සැපයීමේ සහ පාලන ක්‍රියාවලීන්හි අනුකූලතාව සහතික කිරීම.

## ජාතික දත්ත කළමනාකරණ නියෝජිතායතනය

- සියලුම පුරවැසියන් සඳහා ඩිජිටල් හැඳුනුම්පත් නිර්මාණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු ජාතික දත්ත කළමනාකරණ නියෝජිතායතනයක් පිහිටුවීම. රාජ්‍ය පත්වී මාස 3ක් තුළ අවශ්‍ය නීති සම්පාදනය කරනු ඇත.
- සියලුම රාජ්‍ය සේවාවන්හි තොරතුරුවල නිරවද්‍යතාව, ආරක්ෂාව සහ ප්‍රවේශ්‍යතාව සහතික කිරීම සඳහා දත්ත කළමනාකරණය මධ්‍යගත කිරීම හා දත්තවල නීත්‍යනුකූලභාවය තහවුරු කරනු ලබන නීති සම්මත කිරීම.

## ඩිජිටල් පොදු යටිතල පහසුකම් කළමනාකරණ නියෝජිතායතනය

- ඩිජිටල් පොදු යටිතල පහසුකම් සංවර්ධනය කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා කැප වූ ආයතනයක් පිහිටුවීම. මෙය 2014.12.31 දින වනවිට පිහිටු වේ.
- රජයේ මෙහෙයුම් සහ පොදු සේවාවන්ට සහාය වීම සඳහා ශක්තිමත්, ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ඩිජිටල් යටිතල පහසුකම් සහතික කිරීම.

## ඩිජිටල් සහායෙන් සීමා නිර්ණය කිරීම

- පරිපාලන සීමාවන් නිවැරදිව හා කාර්යක්ෂමව නිර්ණය කිරීම සඳහා භූගෝලීය, ඓතිහාසික, සංස්කෘතික හා සමාජයීය කරුණු සැලකිල්ලට ගනිමින් සුහුරු තාක්ෂණය මත පදනම් වූ විසඳුම්, මේ වනවිට රැස්කර ඇති සියලු යෝජනා සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක කිරීම එක් වර්ෂයක් තුළ නිමා කිරීම.
- පරිපාලන ඒකකවල සාධාරණ හා තාර්කික බෙදීම සහතික කිරීම සඳහා GIS (Geographical Information System) සහ අනෙකුත් ඩිජිටල් මෙවලම් භාවිත කිරීම.

### ඒකාබද්ධ රාජ්‍ය සේවා වේදිකා

- පුරවැසියන්ට තනි ඩිජිටල් අතුරු මුහුණතක් (Digital User Interface) හරහා බහුවිධ සේවාවන් වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසන පොදු සේවාවන් සඳහා ඒකාබද්ධ වේදිකා සංවර්ධනය කිරීම. පළමු මාස 06 තුළ තෝරා ගත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 06 ක් සම්පූර්ණ කිරීම.

- ඩිජිටල් ඒකාබද්ධ කිරීම හරහා ජනතාවට රාජ්‍ය සේවා ලබාගැනීම වඩාත් පහසු හා කාර්යක්ෂම කිරීම.

- රාජ්‍ය සේවයේ සියලුම ලිපි ගනුදෙනු විද්‍යුත් ලිපි හරහා සිදු කිරීමට අවශ්‍ය නීති හා වැඩපිළිවෙළ මාස 06 ක් තුළ නිමා කිරීම.

- රාජ්‍ය සේවයේ හමුවී කරන රැස්වීම් වෙනුවට වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීමෙන් කාලය සහ මුදල් ඉතිරි කර, මාර්ග තදබදය ද අවම කිරීම මගින් අයවැය පිරිමැසුම් ක්‍රියාත්මක කිරීම.

- රජයෙන් හා රාජ්‍ය ආයතන ඉල්ලීමක් කළ පසු නිරතුරුව ඒ පිළිබඳ විමසීමට සිදුවන හෙයින් ඒ රාජකාරියේ ප්‍රගතිය සහ වරින්වර ලිපිගොනුව භාරව සිටින නිලධාරියාගේ නම සහ දුරකථන අංකය කෙටි පණිවුඩ මගින් සේවාලාභියාට දැනුවත් කිරීම.

- සියලුම ඩිජිටල් රාජ්‍ය සේවාවන් සිය මව්බසින් ලබාගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම.

### මහජන සහභාගීත්වය සහ ජනතා ප්‍රතිචාර

- රාජ්‍ය සේවා වැඩිදියුණු කිරීම සඳහා පුරවැසි ප්‍රතිචාර රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීමට ඩිජිටල් මෙවලම් භාවිත කිරීම. රජයේ හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇති යාන්ත්‍රණයක් සැකසීම. රාජ්‍ය සේවකයන් අඛණ්ඩ පුහුණුවට යොමු කිරීම, සේවා වාතාවරණය යහපත් තත්ත්වයට පත්කිරීම හා ආකල්ප වර්ධන වැඩසටහන් තුළින් කාර්යක්ෂමතාව වර්ධනය.

### විශ්‍රාම දිවිය

- 2020ට පෙර විශ්‍රාම ලැබූවන්ගේ විශ්‍රාම වැටුප් 2020 වසරට අදාළ වැටුප් ව්‍යුහය අනුව වහාම සංශෝධනය කිරීම හා විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීම හා යාවත්කාලීන කළ වැටුප්, 2025 ජනවාරි මස සිට ගෙවීමටත් හිඟ මුදල් වසර 3ක් තුළ ගෙවා නිම කිරීමටත් කටයුතු කෙරේ.

- අනාගතයේ දී, රාජ්‍ය හා පළාත් පාලන සේවයේ වැටුප් සංශෝධන ක්‍රියාත්මක දිනයේ සිටම බලපැවැත්වෙන පරිදි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ද සංශෝධනය කිරීම.

- රජයේ සේවක ජීවන වියදම් දීමනාවේ වටිනාකමින් 75%කට නොඅඩු වටිනාකමක් සහිතව විශ්‍රාමික ජීවන වියදම් දීමනාව ද, ඒ දිනයේ සිටම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක කිරීම.

- තම විශ්‍රාමයෙන් පසු 'රාජ්‍ය කළමනාකාර සහකාර සේවය' වශයෙන් ප්‍රතිව්‍යුහගත කරනු ලැබූ, සාමාන්‍ය ලිපිකාර, ලඝුලේඛක, යතුරුලේඛක, පොත් තබන්නා, සරප්, ගබඩා භාරකාර යන සේවාවලට අයත් තනතුරු දැරූවන්ගේ විශ්‍රාම වැටුප් රජයේ කළමනාකාර සහකාර සේවයේ වැටුප් ව්‍යුහයට ගළපා සංශෝධනය කර 2025 ජනවාරි මස සිට ගෙවීම ඇරඹීම.

- විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමේ සේවා කාලය සියලු බලධාරීන්ට හා නිලධාරීන්ට සමාන තත්ත්වයට පත්කරනු ලැබේ.

- රක්ෂණ ක්‍රම මත පදනම් වූ දායකත්ව විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමයක් පුද්ගලික අංශයේ සේවකයන් සඳහා හඳුන්වා දීම.

# ජාතික ආරක්ෂාව - 'රන්වැට'

ජාතික වටිනාකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම වෙනුවෙන් ජාතියේ අත්‍යන්ත නීත්‍යානුකූල අභිප්‍රායන් සහ සාරධර්මවලට තර්ජනයක් වන අභියෝග මෙන්ම ගැටුම් පාලනය කිරීමට රාජ්‍යයට ඇති හැකියාව තහවුරු කරනු වස් එම තර්ජනය පරාජය කිරීමෙන් ජාතියේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම.

### ජාතික ආරක්ෂක අභිප්‍රායයන්

- වර්ග කිලෝ මීටර් 65,000ක භූමි ප්‍රමාණයක් හිමි ශ්‍රී ලංකාව ඒ හා සත් ගුණයක් විශාල සාගර ආර්ථික කලාපයක් මෙන්ම භූමිය මෙන් 23 ගුණයක් විශාල මහද්වීපික තටාකයකට හිමිකම් කියන හෙයින් සමුද්‍රීය ආරක්ෂාව ජාතික ප්‍රමුඛතාවක් ලෙස සලකනු ලැබේ.
- තවමත් දියුණු වෙමින් පවතින රටක් ලෙස සැලකෙන නිදහසින් පසු අපට මගහැරුණු ජාතික සංවර්ධන ශක්‍යතාවන් සැලකිල්ලට ගෙන සංවර්ධන කේන්ද්‍රීය ආරක්ෂක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ඇත.
- අතීත අභියෝග ආවර්ජනය කරමින් බාහිර සහ අභ්‍යන්තර ගැටුම් ජයගැනීම සඳහා සමස්ත ජාතික අවශ්‍යතාවන් ප්‍රමුඛත්වයෙහි ලා කටයුතු කරනු ඇත.
- ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රමුඛතා හඳුනාගැනීමේදී ගෝලීය සමාජ ආර්ථික ප්‍රවණතා සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ බහුමානීය ගෝලීය ප්‍රවණතා විශේෂ අවධානයට ගෙන කටයුතු කරනු ඇත.
- අත්‍යවශ්‍ය ජාතික අවශ්‍යතා සඳහා සහාය වන තවදුරටත් පන්නරය කළ මතවාදී, ආර්ථික, දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික අවශ්‍යතා ප්‍රමුඛත්වයෙහි ලා සලකනු ඇත.

### ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුද

- සමෝධානිත හා ඵලදායි ආරක්ෂක හමුවක් ගොඩ නැගීමට ඒ ඒ හමුදාවන් හි පූර්ණ ශක්‍යතාවන් උපයෝගී කරගනිමින් ඒකාබද්ධ ප්‍රවේශයකින් ඕනෑම නැගී එන අභියෝගයක් ආමන්ත්‍රණය කිරීමට අප හමුදාවන්ට හැකි බව සහතික කරනු ඇත.
- ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවන් මීළඟ මට්ටමට ඔසවා තැබීමට අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් හමුදවේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කටයුතු කරනු ඇත. ඒ වෙනුවෙන් ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම, ත්‍රිවිධ හමුද ඒකාබද්ධ ක්‍රියාන්විත ඵලදායිතාවය හා සම්බන්ධීකරණය, උපකරණ හා තාක්ෂණය නවීකරණය, පුහුණුව හා වෘත්තීය සංවර්ධනය අත්‍යවශ්‍ය ප්‍රමුඛතාවන් ලෙස සලකා කටයුතු කරනු ඇත.

### මධ්‍යම බුද්ධි කාර්යාංශය

- ජාතික ආරක්ෂක උපදේශක තනතුර බලාත්මක කරනු අතර, ඔහුගේ ප්‍රධානත්වයෙන් ජාතික ආරක්ෂාව, අපරාධ, ආර්ථික යන ආදී සියලුම ක්ෂේත්‍ර ආවරණය කරමින් සියලුම බුද්ධි අංශ සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ මෙහෙයවීම සඳහා මධ්‍යම බුද්ධි කාර්යාංශය පිහිටුවනු ලැබේ.
- ඉහළ මට්ටමේ දත්ත රැස්කිරීම, විශ්ලේෂණය හා පුරෝකථන හැකියාවන් සහිතව මධ්‍යම බුද්ධි කාර්යාංශය සවිබල ගැන්වීම.
- අන්තර් නියෝජිත ආයතන සහයෝගිතාව, තොරතුරු හුවමාරු කරගැනීම සහ උසස් බුද්ධි තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදීම මෙන්ම නවීන බුද්ධි තාක්ෂණ සහ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කෙරෙනු ඇත.

### ඒකාබද්ධ විශේෂ බලකා විධානය

- ඒකාබද්ධ විශේෂ බලකා මෙහෙයුම් විධානය යටතේ යුධ, නාවික සහ ගුවන් හමුදවේ විශේෂ බලකායන් ඒකාබද්ධ විශේෂ බලකා විධානයකට යටත් කරනු ඇත.

### ප්‍රායෝගික සක්‍රිය ආරක්ෂාව

- තර්ජනයක් එල්ලවීමට පෙර එය හඳුනාගැනීමට හැකි හා අවම කර ගැනීමෙහි සමත් සක්‍රිය ආරක්ෂක උපාය මාර්ගයක් ක්‍රියාවට නැංවීම.
- යම් තර්ජනයක් කඩිනමින් හඳුනාගනිමින් ප්‍රතිචාර දැක්වීමට හැකි ආවේක්ෂණ හා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම.
- ජාතික තොරතුරු පද්ධතිය සයිබර් ප්‍රහාරයන්ගෙන් සුරක්ෂිත කරගැනීමට ප්‍රමුඛතාව ලබා දීම.

### සුවිශේෂ ආර්ථික කලාපය ආරක්ෂා කිරීම

- නීති විරෝධී සංක්‍රමණිකයින් පැමිණීම වළක්වාලීමට සහ ශ්‍රී ලංකාව සතු සම්පත් අන්‍යයන් සොරා ගැනීම වැළැක්වීම සඳහා මෙන්ම භෞමික අඛණ්ඩතාව තහවුරුකර ගැනීමේ වෙනුවෙන් ප්‍රශස්ත මට්ටමේ නිරීක්ෂණයන් ඇතුළු වැඩපිළිවෙළක් දියත් කිරීම.

- භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම වෙනුවෙන් ඉහළ මට්ටමේ නිරීක්ෂණ තාක්ෂණයක් ක්‍රියාවට නැංවීම.

### ආර්ථික තර්ජන

- ආර්ථික අර්බුදවල බලපෑම අවම කිරීම සහ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා හදිසි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා සැලසුම් ඇති කිරීම.

- ආර්ථික ඔත්තු බැලීම සහ කඩාකප්පල්කාරී ක්‍රියාකාරකම් ඇතුළු එල්ල විය හැකි තර්ජනවලින් ආර්ථිකය ආරක්ෂා කිරීම.

### ආහාර සුරක්ෂිතතා තර්ජන

- නිෂ්පාදනයේ සිට බෙදාහැරීම දක්වා රටේ ආහාර සැපයුම් දාමයේ ආරක්ෂාව සහතික කිරීම.

- ආහාරවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් සහ අධීක්ෂණ පද්ධති දියුණු කිරීම.

### විදුලිබල හා බලශක්ති සුරක්ෂිතතාව

- රටේ විදුලිබලය හා බලශක්ති යටිතල පහසුකම්වලට එල්ල විය හැකි තර්ජන හා අවහිරතා හඳුනාගනිමින් විදුලිබල හා බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම.

- බලශක්ති සම්පත් විවිධාංගීකරණය කිරීම සහ ආරක්ෂා කිරීම තුළින් බලශක්ති ස්වාධීනත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම.

  ඉහළ මට්ටමේ බලශක්ති හා ආර්ථික විශේෂඥයින් ගෙන් සැදුම්ලත් කමිටුවකින් ලබා ගන්නා නිර්දේශ මත ක්‍රියාමාර්ග ගැනීම 2024.12.31 දින සිට.

# ආර්ථිකය - 'පොහොසත්'

සියලු පුරවැසියන් සඳහා තිරසර වර්ධනයක් සහ සමෘද්ධියක් සහතික කරන ව්‍යවසායකත්වය, නවෝත්පාදන සහ උපාය මාර්ගික ආයෝජන මගින් මෙහෙයවනු ලබන ගෝලීය වශයෙන් තරගකාරී, ගතික, අභියෝගයන්ට මුහුණ දිය හැකි නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කිරීම.

### නිෂ්පාදන ආර්ථිකය

- කාර්යක්ෂම දේශීය නිෂ්පාදන ආර්ථිකයක් බිහිකිරීමට අවශ්‍ය දැනුම, ප්‍රාග්ධනය, තාක්ෂණය ලබාදීමට සහ වෙළෙඳපොළ නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම සහතික කෙරේ.

### මුදල් සහ ව්‍යවසායකත්ව අමාත්‍යාංශය

- ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් හා මූල්‍ය කළමනාකරණය අධීක්ෂණය සහ සහාය දැක්වීම සඳහා කැප වූ අමාත්‍යාංශයක් පිහිටුවා සම්බන්ධිත සියලු ආයතන ඒ යටතට පත්කිරීම 2024.12.31ට පෙර.

- නවෝත්පාදන සහ ආර්ථික විවිධාංගීකරණය දිරිගැන්වීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම. පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභා සියල්ලේ නිර්දේශ උපයෝගී කරගෙන 2024.12.31 දිනට නිමා කෙරේ.

### ජාතික ව්‍යවසායකත්ව අරමුදල

- සිය පාලනයෙන් තොර වූ හේතූන් නිසා අවදානමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඇතුළු සියලු ව්‍යවසායකයින් රැකගැනීම සඳහා මූල්‍ය ආධාර සහ සම්පත් සැපයීම වෙනුවෙන් අරමුදලක් පිහිටුවීම හා ඒ සඳහා සියලු රාජ්‍ය සමාගම් සම්බන්ධ කරගනිමින් ප්‍රතිරක්ෂණ සහිත රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීමෙන් ඔවුන්ගේ අවධානම අවම කිරීම තුළින් අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට පියවර ගැනීම.

- නව නිපැයුම්කරුවන්ට, නව ව්‍යාපාර සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය මෙන්ම වෙළෙඳපොළ අවස්ථාවන් නිර්මාණය කරදීමට මැදිහත්වීම සහ කළමනාකරණ කුසලතා ද ලබා දීම සඳහා ප්‍රදාන, ණය සහ කොටස් ආයෝජන පිරිනැමීම. මේ පිළිබඳව වන රජයේ සියලු පර්යේෂණ හා පරිපාලන ආයතන ඒකාබද්ධ කරමින් ව්‍යවසායකත්ව අමාත්‍යාංශය යටතේ ඒකාබද්ධ නව යාන්ත්‍රණයක් රජය පිහිටුවා මාස 3ක් ඇතුළත පිහිටුවනු ලැබේ.

### සංවර්ධන බැංකුව

- නවමු සහ කුඩා ව්‍යාපාර සඳහා අඩු වියදම්, විකල්ප අරමුදල් සැපයීමට බැංකු සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

- ආර්ථික ක්‍රියාකාරකම් සහ වර්ධනය උත්තේජනය කිරීම සඳහා ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය සහ මහාපරිමාණ ව්‍යාපාරිකයින්ට දැරිය හැකි පොලියට ණය සහ අරමුදල් ලබාදීම සහතික කිරීම. මේ සඳහා දිවයින පුරා ශාඛා දහසකින් යුත් 8,000 ඉක්ම වූ කාර්ය මණ්ඩලයක් සහිත මූලික ප්‍රාග්ධනය රුපියල් බිලියන 750ක් සහිත වූ සංවර්ධන බැංකුවක් පිහිටුවීම හා ප්‍රධාන වාණිජ බැංකු සමග සමපාත කර ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පමණක් කේන්ද්‍ර කරගනිමින් කටයුතු කර වර්ෂයක් තුළ එම ක්ෂේත්‍රයේ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය 25% මට්ටමට ගෙන ඒම.

### Startup ශ්‍රී ලංකා ඩිජිටල් ව්‍යවසායකත්ව අරමුදල

- ගෝලීය පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් ඩිජිටල් ව්‍යවසායකත්ව අරමුදලක් දියත් කිරීම.

- ආයෝජන, උපදේශන සහ වෙළෙඳපොළ ප්‍රවේශය හරහා තාක්ෂණික දියත් කිරීම් සහ ඩිජිටල් ව්‍යවසායන් සඳහා සහාය වීම.

- තනි, හවුල්, සමිති, සීමිත සමාගම් හෝ වෙන්චර් කැපිටල් ස්වභාවයේ ව්‍යාපාර ආකෘති බලගන්වමින් සාර්ව ආර්ථික ප්‍රසාරණයක් සඳහා සංවර්ධන ණය ලබා දීම.

### කඩිනම් කෘෂිකර්ම ඵලදායිතා කළමනාකරණ ආයතනය

- නවීන තාක්ෂණික ක්‍රම සහ තාක්ෂණය හරහා කෘෂිකර්ම ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පවතින ආයතන ඒකාබද්ධ කර මෙම ආයතනය සැකසීම තුළින් කෘෂි නිෂ්පාදන අගය එකතු කිරීම පදනම් කරගත් නව්‍යතාවලින් හෙබි කර්මාන්ත ක්ෂේත්‍රයක් බවට එම ක්ෂේත්‍රය පත්කිරීම නියෝජිතායතයේ වගකීමයි.

එම ක්ෂේත්‍රය විදේශ විනිමය උපයන තත්ත්වයට නගාසිටුවන පස් අවුරුදු සැලැස්මක් 2025 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වේ.

- තිරසර කෘෂිකර්ම පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ කෘෂිකර්ම අංශයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම.

### ජාතික ප්‍රාග්ධන කළමනාකරණ ආයතනය

- ජාතික ප්‍රාග්ධනය සහ ආයෝජන උපාය මාර්ගිකව කළමනාකරණය කිරීම සඳහා නියෝජිතායතනයක් පිහිටුවීම.
- ආර්ථික ප්‍රතිලාභ සහ සංවර්ධනයේ ප්‍රතිඵල උපරිම කිරීම සඳහා සම්පත් ප්‍රශස්ත ලෙස බෙදා දීමට වග බලා ගැනීම.

### ජාතික සැපයුම් දාම අධිකාරිය

- ජාතික සැපයුම් දාමයේ කාර්යක්ෂම හා සුනම්‍ය ක්‍රියාකාරිත්වය සහ සම්බන්ධීකරණය, තීරණාත්මක භාණ්ඩ හා සේවා ලබාගැනීමේ හැකියාව, විශ්වසනීයත්වය සහ සුරක්ෂිතභාවය සහතික කරන ආයතනයක් පිහිටුවීම.

### ස්වාභාවික සම්පත් කළමනාකරණ අධිකාරිය

- ස්වාභාවික සම්පත් කළමනාකරණය සඳහා පිහිටුවා ඇති ආයතන මධ්‍යගත ව සම්බන්ධීකරණය කිරීම සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණ අධිකාරිය පිහිටු වීම. ඵලදායි සහ විනිවිද භාවයෙන් යුතු රාජ්‍ය සහ පෞද්ගලික අංශවල හවුල්කාරීත්වයෙන් සම්පත් කළමනාකරණය කිරීම මෙම ආයතනයේ වගකීමකි.

### ආයෝජන මණ්ඩලය ප්‍රතිසංස්කරණය කිරීම

- විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම් සඳහා එහි කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ නැංවෙන අයුරින් ආයෝජන මණ්ඩලය, එහි නීති රීති හා ක්‍රමවේද 2024 නිමාවීමට ප්‍රථම ප්‍රතිසංස්කරණය කිරීම.
- උපාය මාර්ගික හවුල්කාරිත්වයන් සහ ආයෝජක සබඳතා කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කිරීමට ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරි ධුරයට පෞද්ගලික අංශයේ ප්‍රධාන විධායක මට්ටමේ අත්දැකීම් ඇති නිලධාරියෙකු පත් කිරීම. සියලු සේවා එක් කාර්යාලයක් තුළ ඉටුකිරීමේ ක්‍රමවේදය 2024.12.31 දින වන විට ක්‍රියාවට නැංවීම.

### ජාතික ණය කළමනාකරණ ආයතනය

- ආණ්ඩුවට ණය ලබාගත හැකි උපරිම සීමාව ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම මගින් රටට දැරිය නොහැකි ආකාරයට දේශපාලකයන්ට සිතැඟි පරිදි අනවශ්‍ය ලෙස ණය ගැනීම වැළැක්වීම.
- ජාතික ණය කළමනාකරණය සහ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා කැප වූ ආයතනයක් පිහිටුවීම.
- ණය මට්ටම් අඩු කිරීමට සහ ණය ගැනීම ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.

### ජාතික සන්නාම මධ්‍යස්ථානය

- දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලාංකේය සන්නාම ගොඩනැගීමට සහ ප්‍රවර්ධනය කිරීමට ජාතික සන්නාම නියෝජිතායතනයක් පිහිටුවීම.
- ශ්‍රී ලාංකේය නිෂ්පාදනවල ගෝලීය පැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ගික සන්නාමකරණ මුලපිරීම් වැඩිදියුණු කිරීම.
- ජාතික සන්නාමකරණ ව්‍යාපාර සහ මුලපිරීම් හරහා පුරවැසි අභිප්‍රේරණය සහ අභිමානය ඇති කිරීම.

### රාජ්‍ය ආදායම ඉහළ නැංවීම

- ඩිජිටල් අනන්‍යතාවය හරහා කාර්යක්ෂමව බදු එකතු කිරීම.
- බදු එකතු කිරීම විධිමත් කිරීම සහ ඒ අනුව බදු අනුපාත සකස් කිරීම මගින් බදු ආදායම වැඩි කිරීම.

## නැතිවූ ආදායම නැවත ලබා ගැනීම

- පසුගිය සමයේ සිදු වූ බදු පැහැර හැරීම හෝ මගහැරීම හේතුවෙන් අහිමි වූ ආදායම සුදුසු යාන්ත්‍රණයක් හරහා ගණනය කිරීම සහ අයකර ගැනීම. මේ තුළින් අපේක්ෂිත අතිරේක ආදයම රුපියල් බිලියන 500 ඉක්මවන අතර, වර්ෂයක් තුළ සියල්ල එකතු කර ගැනීමට පියවර ගැනේ.
- පසුගිය සමය තුළ මහා පරිමාණ වංචා සහ දූෂණ අනාවරණය කර ගැනීම සඳහා ඩිජිටල් යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම තුළින් රාජ්‍ය ආදයම ආරක්ෂා කර ගැනීම හා වංචා කර ඇති මූල්‍ය රටට ලබාගැනීමට නීත්‍යනුකූලව කටයුතු ඇරඹීම.

## රාජ්‍ය ව්‍යවසායන්

- රාජ්‍යය තුළ ව්‍යවසායකත්ව මනෝභාවයක් පෝෂණය කිරීම මගින් රජය සතු සම්පත් විකිණීම වෙනුවට කාර්යක්ෂමව භාවිත කිරීම. සුදුසු පරිදි ප්‍රතිව්‍යුහගත කිරීම, අනවශ්‍ය ආයතන ඒකාබද්ධ කිරීම හා වර්ගීකරණය, හෝ වසා දැමීම හෝ අවසන් කිරීම.
- ඇතැම් සේවා සැපයීම රාජ්‍යයේ අනිවාර්ය වගකීමක් වන අවස්ථාවේදී හැර අනෙකුත් ආයතන ස්වයං මූල්‍යන මට්ටමට ගෙන ඒම තුළින් රජයේ වැය බර අවම කිරීම.

## විදේශ විනිමය සංචිත/එක්සිම් බැංකුව

- ඇමෙරිකානු ඩොලරය මත පමණක් පදනම් නොවන විදේශ ගනුදෙනු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ එක්සිම් බැංකුවක් පිහිටුවීම.
- ඒ බැංකුවේ මැදිහත්වීම මත අපනයන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. දේශීය ව්‍යවසායකයන්ට විදේශීය වෙළෙඳපොළෙහි ඉඩකඩ විවර කර ගැනීම.
- සියලුම අපනයනකරුවන් විසින් සිය අපනයන ආදයම මාස 3ක් ඇතුළත රට තුළට ගෙන බවට තහවුරු කර ගැනීමට නීති සම්පාදනය කිරීම.
- රටට හිමි විදේශ විනිමය වංචා, අපරාධ වරදක් ලෙස හඳුනාගැනීම, විදේශ විනිමය පනත සුදුසු පරිදි සංශෝධනය කිරීම හා ක්‍රියාත්මක ආයතන සක්‍රිය කිරීම.
- බ්‍රික්ස් සංගමයේ සාමාජිකත්වය ලබාගැනීමට කටයුතු කිරීම හා කලාපයේ මූල්‍ය ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම.
- වෙළෙඳ ගිණුමේ ධන ශේෂයක් කඩිනමින් නිර්මාණය කර ගැනීම අරමුණු කරගත් වෙළෙඳ ආයෝජන හා කර්මාන්ත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

# නූතන මූල්‍ය සම්පත් කළමනාකරණය පිළිබඳ දැක්ම - ‘ධනවත්’

සියලු පුරවැසියන් හට සමානාත්මතාවය මත පදනම් වූ මූල්‍ය ස්ථාවරත්වයක් සහ දියුණු ජීවන තත්ත්වයක් සහතික කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික විභවයන් උපරිම කරන ශක්තිමත්, විනිවිදභාවයෙන් යුත් තිරසර මූල්‍ය කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම.

### විනිවිදභාවයෙන් යුතුව කාර්යක්ෂමව බදු අය කිරීමේ ක්‍රමවේදයක්

- **බදු අයකිරීමේ ඩිජිටල් වේදිකාව:** බදු එකතු කිරීම විධිමත් කිරීම, පැහැර හැරීම අවම කිරීම සහ අනුකූලතාව වැඩි දියුණු කිරීම සඳහා බදු අය කිරීමේ පුළුල් ඩිජිටල් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. මෙම වේදිකාව මගින් බදු ආදායම් තත්කාලීනව සොයා බැලීමට සහ බදු වාර්තා ස්වයංක්‍රියව සැකසීමට ඉඩ සලසයි. මෙමගින් වාර්ෂික රාජ්‍ය බදු ඇදයම 30%කින් පමණ ඉහළ යනු ඇති අතර, පළමු වර්ෂය තුළ රුපියල් බිලියන 1000ක අතිරේක ආදයමක් ලබාගැනීමට හැකිවේ.

- **ප්‍රගතිශීලී බදු ප්‍රතිසංස්කරණ:** ඉහළ ආදායම්ලාභීන් සඳහා ඉහළ අනුපාත ද, අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන ද සමඟ සාධාරණ බදු බර බෙදා හැරීමක් සහතික කිරීම සඳහා ඍජු බදු ආදයම 40%ක් ද වක්‍ර බදු ආදයම 60%ක් ද වන ලෙස රාජ්‍ය බදු ආදයමේ ව්‍යුහය වෙනස් කරගැනීමට අපේක්ෂා කරයි. එහිදී තෝරාගත් අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ රාශියකට පනවා ඇති එකතු කළ අගය මත බදු (VAT) ඉවත් කිරීමෙන් ඒවායේ මිල පහත හෙලීමත් එමගින් ජනතාවගේ ජීවන වියදම අඩුකිරීමත් අපේක්ෂා කරයි. අත්‍යවශ්‍ය භාණ්ඩ මත ඇති VAT ඉවත් කිරීම 2024.10.01 දින සිටම ක්‍රියාත්මක වේ.

- **බදු ක්‍රම සරල කිරීම:** පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට බදු අයකරගැනීම තේරුම් ගැනීමට සහ ඒවාට අනුකූල වීම පහසු කිරීම සඳහා බදු වර්ග ගණන අවම කරමින් බදු ක්‍රමය සරල කිරීම.

### බදු අය නොවන ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම

- **රාජ්‍ය වත්කම් තුළින් මුදල් ඉපැයීම:** රාජ්‍ය-පුද්ගලික හවුල්කාරිත්වයන් සහ කල්බදු ගිවිසුම් හරහා රජය සතු වත්කම් භාවිතය ප්‍රශස්ත කිරීම, පොදු අයිතිය පවත්වා ගනිමින් උපරිම ප්‍රතිලාභ සහතික කිරීම. මෙම ප්‍රතිසංස්කරණ මගින් රාජ්‍ය වත්කම් උපරිම උපයෝජනය තහවුරු කරන අතර, එම ව්‍යවසායන්ගෙන් අතිරේක ආදයම් උත්පාදනය තුළින් ස්වයං මූල්‍යනයට යොමු කර රාජ්‍ය වැය බරින් නිදහස් වීම.

- **කාර්යක්ෂම සේවා සැපයීම:** කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, වියදම් අඩු කිරීම සහ සේවා ගාස්තු සහ අයකිරීම්වලින් ආදායම් වැඩි කිරීම උදෙසා රාජ්‍ය සේවය සුහුරු සේවයක් බවට පත්කරනු ලැබේ. ඒ තුළින් රාජ්‍ය වියදම් තාර්කිකරණය හා විරස්තීන කිරීමෙන් අයවැයට ධනාත්මක බලපෑමක් අපේක්ෂා කරයි. එහි වාර්ෂික මූල්‍ය වියදම් ඉතුරුව රුපියල් බිලියන 100ක් ඉක්මවනු ඇත.

### මූල්‍ය ආයතන ශක්තිමත් කිරීම

- **මහ බැංකුව නවීකරණය කිරීම:** වඩා හොඳ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍ය ස්ථායිතා අධීක්ෂණය සහ ආර්ථික පුරෝකථනය සඳහා උසස් දත්ත විශ්ලේෂණ සහ කෘත්‍රිම බුද්ධිය සමඟ මහ බැංකුවේ ශක්‍යතාවන් වැඩි දියුණු කිරීම.

- **සැමටම මූල්‍ය සේවා:** ජංගම බැංකුකරණය, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ ඩිජිටල් මූල්‍ය සේවා හරහා ග්‍රාමීය ප්‍රදේශවල බැංකු සේවා සඳහා ප්‍රවේශය පුළුල් කිරීම.

- **ගුප්ත මුදල්** (Cryptocurrency)**:** ගුප්ත මුදල් ප්‍රවණතා අධ්‍යයනය කරමින් රටට ගැළපෙන ලෙස කළමනාකරණය කිරීම.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය

- **ප්‍රාග්ධන වෙළෙඳපොළ පුළුල් කිරීම:** දේශීය හා විදේශීය ආයෝජනයන් ආකර්ෂණය කර ගැනීම සඳහා නව්‍ය මූල්‍ය මෙවලම් සහ ඩිජිටල් වේදිකාවන් හඳුන්වා දීම. කොළඹ කොටස් වෙළෙඳපොළේ ආරම්භක ව්‍යාපාර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලැයිස්තුගත කිරීම ප්‍රවර්ධනය කිරීම.

- **ආයෝජකයින් ආරක්ෂා කිරීම සහ දැනුවත් කිරීම:** ආයෝජකයින් ආරක්ෂා කිරීම සඳහා නියාමන රාමු ශක්තිමත් කිරීම, ආයෝජන අවස්ථා සහ මූල්‍ය සාක්ෂරතාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.

- **කෘෂිකර්ම නිෂ්පාදන හුවමාරුවක්:** පාරිභෝගිකයාට ද නිෂ්පාදකයාට ද සාධාරණ මිලක් මෙන්ම ඉහළ ප්‍රමිතියක් සහතික කරමින් විදේශීය තාක්ෂණික සහාය ලබාගෙන කොළඹ කොටස් වෙළෙඳපොළ වැනි ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන හුවමාරුව නමින් භාණ්ඩ හුවමාරුවක් (Comodity Exchange) ස්ථාපිත කෙරේ.

- රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද ණය සුරැකුම්පත් ප්‍රචලිත කිරීමේ අරමුණෙන් ණය සුරැකුම් ද්විතීයික වෙළෙඳපොළක් ස්ථාපිත කෙරේ.

## මූල්‍ය සේවාවන් සඳහා තාක්ෂණය උපයෝගි කරගැනීම

- **මූල්‍ය තාක්ෂණ (FinTech) සංවර්ධනය:** නවෝත්පාදන සඳහා නියාමන පරීක්ෂණ භූමියක් නිර්මාණය කිරීම, FinTech ආරම්භක ව්‍යාපාර සඳහා අරමුදල් සහ උපදේශන සැපයීම සහ FinTech විසඳුම් ප්‍රධාන ධාරාවේ මූල්‍ය සේවාවන් හා ඒකාබද්ධ කිරීම මගින් FinTech අංශයේ වර්ධනයට සහාය වීම.

## රාජ්‍ය ණය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම

- **ණය විනිවිදභාවය සහ වගවීම:** සියලුම රජයේ ණය ගැනීම් සහ ණය සේවා ක්‍රියාකාරකම් පාර්ලිමේන්තුව සමග එක්ව තත්‍ය කාලීන සොයාබැලීම් සහ ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම සමඟ විනිවිදභාවයෙන් යුත් රාජ්‍ය ණය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

- **ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උපාය මාර්ග:** අප වැනි ණය අර්බුදයක ගිලුණු රාජ්‍යයන් විසින් අනුගමනය කර සාර්ථක වී ඇති හොඳම ජාත්‍යන්තර ප්‍රවේශවීම් හා අත්දැකීම් පාදක කර ගනිමින් අනාගත පරම්පරාව මත පැටවෙන ණය බර අඩු කිරීමට සහ මූල්‍ය තිරසරභාවය සහතික කිරීම සඳහා පවතින ණය කළමනාකරණය සහ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා උපාය මාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

  සියලුම ආකාරයේ ණය සහ ආධාර භාවිතා කිරීම්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් ජාතික ප්‍රසම්පාදන කොමිසම විසින් අනුමත කර, පාර්ලිමේන්තුවේ සම්මත වී ඇති විගණකාධිපතිවරයා විසින් පිළිගත් සුහුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පමණක් සිදු කිරීම.

- **උපාය මාර්ගික ව ණය හා ආධාර භාවිතය:** ජාත්‍යන්තර ආධාර සහ ණය පාර්ලිමේන්තුවට විනිවිදභාවයකින් යුතුව වාර්තා කරන වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම තුළින් ණය උපාය මාර්ගිකව භාවිත කරන බවට සහතික වීම. අධීක්ෂණය සඳහා පාර්ලිමේන්තු ආංශික අධිකාරිය කාරක සභාවක් 2024.12.31 දිනට ප්‍රථම පත්කිරීම.

## විදේශ විනිමය සහ ප්‍රේෂණ ප්‍රශස්තකරණය

- **ප්‍රේෂණ දිරිමත් කිරීම:** විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින්ට ඉහළ විනිමය අනුපාත සහ අවම ගනුදෙනු ගාස්තු වැනි විධිමත් ක්‍රියාමාර්ග හරහා මුදල් ප්‍රේෂණය කිරීමට දිරි ගැන්වීම.

- දේශීයව පිහිටුවන සංවර්ධන බැංකුව හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ තම ඉපැයීම් පවුලේ ව්‍යවසායන් තුළ ආයෝජනය කිරීම සඳහා රජයේ වගකීම යටතේ අවස්ථාව ලබා දීම.

- විදෙස්ගත ශ්‍රමිකයන් ආසන්න වසර තුනේදී රටට එවා ඇති විදේශ විනිමය ප්‍රමාණය අනුව දරුවන් පාසලකට ඇතුළත් කිරීමේදී අමතර ලකුණු ලබාදීම වැනි මූල්‍යමය නොවන දිරිගැන්වීම් ලබා දීම හරහා නිල මාර්ගවලින් මුදල් ප්‍රේෂණය කිරීමට දිරි ගැන්වීම.

- **ස්ථාවර විදේශ විනිමය සංචිත:** මාස 3ක ආනයන වියදම ආවරණය කිරීමට ප්‍රමාණවත් අවම විදේශ විනිමය සංචිතයක් ආණ්ඩුව විසින් පවත්වා ගන්නා බව ව්‍යවස්ථාපිත විධිවිධාන හරහා තහවුරු කිරීම.

## මිල ස්ථායිකරණ අරමුදල

- ඉන්ධන ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ලෝක වෙළෙඳපොළේ දැඩි ලෙස උච්චාවචනය වීමෙන් දේශීය පාරිභෝගිකයා සහ නිෂ්පාදකයාට අහිසි බලපෑමක් ඇතිවීම වැළැක්වීම සඳහා මැදිහත් වීම.

## රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ

- **ශුන්‍ය පාදක** (Zero based budgeting) **අයවැයකරණය:** වත්මන් අවශ්‍යතා සහ ප්‍රමුඛතා මත පදනම් ව සම්පත් කාර්යක්ෂම ව බෙදා හැරීම සහතික කිරීම සඳහා සියලුම රාජ්‍ය ආයතන හරහා ශුන්‍ය පාදක අයවැයකරණය අනුගමනය කිරීම.

- රාජ්‍ය අංශයේ බලශක්තිය, ඉන්ධන ඇතුළු අනෙකුත් සම්පත් භාවිතාව පිළිබඳ වෝහාරික විගණනයක් සිදුකර තාර්කිකරණය තුළින් මහාපරිමාණ හා සුළුපරිමාණ පිරිමැසුම් හරහා රාජ්‍ය වැය මත 10% ඉක්ම වූ සම්පත් ඉතිරියක් සඳහා රාජ්‍ය යාන්ත්‍රණය මෙහෙයවීම.

- **කාර්යසාධනය මත පදනම් වූ අයවැයකරණය:** කාර්යසාධන ප්‍රතිඵල සඳහා රාජ්‍ය වියදම් සම්බන්ධ කිරීම, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා රාජ්‍ය අරමුදල් ඵලදායී ලෙස භාවිත කිරීම සහතික කිරීම.

## ජාත්‍යන්තර ආධාර සහ සංවර්ධන මූල්‍ය

- **බහුපාර්ශ්වික ආයතන සමග සහයෝගිතාව වැඩිදියුණු කිරීම:** ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා හිතකර අරමුදල් කොන්දේසි සහ තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග සබඳතා ශක්තිමත් කිරීම.

## මූල්‍ය අංශයේ ස්ථාවරභාවය සහ නියාමනය

- **ශක්තිමත් නියාමන රාමුව:** බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා මූල්‍ය අංශයේ නියාමනය ශක්තිමත් කිරීම.

- **ආර්ථික අර්බුද කළමනාකරණ යාන්ත්‍රණ:** හදිසි ආර්ථික අර්බුද පැනනැගීමට තුඩු දිය හැකි ආර්ථික ක්ෂේත්‍රයේ දුර්වලතා හඳුනාගෙන ඒවා විසඳීම සඳහා උපාය මාර්ගික වැඩපිළිවෙළක් දියත් කිරීම.

- **රාජ්‍ය-පුද්ගලික හවුල්කාරිත්වය:** මූල්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාව සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා පුද්ගලික අංශය සමග හවුල්කාරිත්වයන්ට යොමු වීම.

- **ධාරිතාවන් ගොඩනැගීම:** නූතන මූල්‍ය කළමනාකරණ පිළිවෙත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා මූල්‍ය අංශයේ වෘත්තිකයන් සවිබල ගැන්වීම සඳහා ආයෝජනය කිරීම.

- **පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය:** ව්‍යාපාර, සිවිල් සමාජය සහ ජාත්‍යන්තර හවුල්කරුවන් ඇතුළු පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වෙමින් මූල්‍ය ප්‍රතිසංස්කරණ සඳහා සම්මුතිය සහ සහයෝගය ගොඩනැගීම

- **අධීක්ෂණය සහ ඇගැයීම:** ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, බලපෑම තක්සේරු කිරීම සහ මූල්‍ය කළමනාකරණ උපාය මාර්ගයන් සඳහා අවශ්‍ය වෙනස්කම් කිරීම සඳහා ශක්තිමත් අධීක්ෂණ සහ ඇගැයීම් රාමුවක් ඇතිකිරීම.

## කෘෂිකර්ම නිෂ්පාදන හුවමාරුවක්

- පාරිභෝගිකයාට ද නිෂ්පාදකයාට ද සාධාරණ මිලක් මෙන්ම ඉහළ ප්‍රමිතියක් සහතික කරමින් විදේශීය තාක්ෂණික සහාය ලබාගෙන කොළඹ කොටස් වෙළෙඳපොළ වැනි ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන හුවමාරුව නමින් භාණ්ඩ හුවමාරුවක් (Comodity Exchange) ස්ථාපිත කෙරේ.

- රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද ණය සුරැකුම්පත් ප්‍රචලිත කිරීමේ අරමුණෙන් ණය සුරැකුම් ද්විතීයික වෙළෙඳපොළක් ස්ථාපිත කෙරේ.

# විදේශ සබඳතා - 'බහු බැඳි නිදහස'

මව්බිමේ අභිලාශයන් ප්‍රමුඛත්වයේ තබමින් ශ්‍රී ලංකාවේ ගෝලීය සන්නාම අගය ඉහළ නංවා ගනිමින් ජාතික අවශ්‍යතා වැඩිදියුණු කිරීම, කලාපීය සාමය සහතික කිරීම සහ ආර්ථික වර්ධනය පෝෂණය කිරීම සඳහා විදේශ සබඳතා උපාය මාර්ගික ව කළමනාකරණය කිරීම.

### උපාය මාර්ගික විදේශ සබඳතා පිළිබඳ ජාතික සභාවක්

- ගෝලීය ප්‍රවණතා අධ්‍යයනය කර ඒ අනුව විදේශ ප්‍රතිපත්ති සැකසීමට උපදෙස් ලබාදීම සඳහා විද්වතුන්, වෘත්තීයවේදීන්, ව්‍යවසායකයින් සහ වෙනත් රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගෙන් සමන්විත සභාවක් පිහිටුවීම.

### විදේශ සබඳතා උපාය මාර්ගික කළමනාකරණය

- ලොව පුරා රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා කළමනාකරණය කිරීම සහ පෝෂණය කිරීම සඳහා පුළුල් උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ දිගුකාලීන ඉලක්ක සහ අවශ්‍යතා සමඟ සමපාත වන ශක්තිමත් සන්ධාන සහ හවුල්කාරිත්වයන් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කිරීම.

### දේශප්‍රේමී නවීන ගෝලීය විදේශ සේවා නිලධාරීන් යෙදවීම

- ගෝලීය වේදිකාවන් හි ශ්‍රී ලංකාවේ අවශ්‍යතා ඵලදායී ලෙස නියෝජනය කළ හැකි ඉහළ දක්ෂතා ඇති සහ දේශප්‍රේමී විදේශ සේවා නිලධාරීන් පත් කිරීම.
- නවීන රාජ්‍යතාන්ත්‍රික අභියෝගවලට මුහුණ දීම සඳහා තානාපතිවරුන් හොඳින් සන්නද්ධ ව සිටින බව සහතික කිරීම සඳහා අඛණ්ඩ පුහුණුව සහ සහාය ලබා දීම.

### ජාතික අවශ්‍යතා මත පදනම් වූ බහු-බැඳි ප්‍රතිපත්ති

- වෙනස්වන ගෝලීය ගතිකත්වයන්ට අනුගත වන සහ ජාතික අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙන නම්‍යශීලී, බහු-බැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- ස්වාධීනත්වය සහ ස්වෛරීභාවය පවත්වා ගනිමින් අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ගෙන දෙන උපාය මාර්ගික සන්ධාන සහ හවුල්කාරිත්වයන් හි නිරත වීම.

### ඉන්දියන් සාගරයේ සාමය සහතික කිරීම

- ඉන්දියානු සාගරය සාම කලාපයක් බවට පත්කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කරන ලද 2832(xxvi) යෝජනාව බලගැන්වීමට මූලිකත්වය ගැනීම.
- සමුද්‍රීය ආරක්ෂාව, මුහුදු කොල්ලකෑම් සහ අනෙකුත් කලාපීය අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා අසල්වැසි රටවල් සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

### ශ්‍රී ලාංකේය සන්නාමය ඔසවා තැබීම

- ජාත්‍යන්තර ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ සංස්කෘතික, ආර්ථික සහ තාක්ෂණික ජයග්‍රහණ ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාවේ නිෂ්පාදන, සේවා සහ නවෝත්පාදන ගෝලීය වේදිකාවේදී ඔසවා තැබීමට රාජ්‍ය තාන්ත්‍රික ප්‍රවේශයන් භාවිත කිරීම.
- ජාත්‍යන්තර අභියෝගවලදී ජාත්‍යන්තර ප්‍රජාවගේ සහාය ශ්‍රී ලංකාවට ලබා ගැනීම.

### ආර්ථික වර්ධනය සඳහා සහාය

- විදේශ ආයෝජන, විදේශ වෙළෙඳපොළ, විදේශ රැකියා, සංචාරකයින් ආකර්ශණය කර ගැනීම සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් කාර්යක්ෂම ව භාවිත කිරීම.
- ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර ලබාගැනීමට ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ පරිත්‍යාගශීලී රටවල් සමඟ සම්බන්ධ වීම.

### ස්වෛරීත්වය ආරක්ෂා කිරීම

- සියලුම විදේශ ප්‍රතිපත්ති සහ ගිවිසුම් ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවයට ගරු කරන බව සහතික කිරීම.
- බාහිර ක්‍රියාකාරීන්ගේ අනවශ්‍ය බලපෑම් හෝ පීඩනය වැලැක්වීම සඳහා ජාත්‍යන්තර සංසද සහ සාකච්ඡාවලදී ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම.
- ලෝකය පුරා ක්‍රියාත්මක ශ්‍රී ලංකා තානාපති කාර්යාල හා එහි ඇතුළත් වාණිජ කාර්යාල එකී රටවලට අයත් නිශ්චිත වාණිජ, රැකියා, ශිෂ්‍යත්ව ආදී සියල්ල ආවරණය වන ඉලක්ක මත මෙහෙයවනු ලැබේ. එම ඉලක්ක සපුරාලීමට අසමත්වන සියලු රාජ්‍යතාන්ත්‍රික නිලධරීන් හා වාණිජ නිලධාරීන් නැවත කැඳවනු ලැබේ.

# සමාජ සුබසාධනය - 'හිතේ හයිය'

යැපුම් මානසිකත්වය දුරු කිරීම, ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සහ තිරසර ආර්ථික සංවර්ධනය තුළින් පුරවැසියන් සවිබල ගන්වන යාන්ත්‍රණයක් බවට සමාජ සුබසාධන ආධාර පරිවර්තනය කිරීම.

### ''හිතේ හයිය" ව්‍යවසායක සුබසාධන යෝජනා ක්‍රමය

- **ආයෝජන සඳහා ප්‍රාග්ධනය:** සෘජු මූල්‍ය ආධාර වෙනුවට තම ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ වර්ධනය කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන්ට ප්‍රාග්ධනය ලබා දීම.
- **ව්‍යවසායකත්ව පුහුණුව:** ව්‍යවසායකත්ව කුසලතා සහ ව්‍යාපාර කළමනාකරණ දැනුම වර්ධනය කිරීම සඳහා පුහුණුව සහ සම්පත් ලබා දීම.
- **උපදේශනය සහ සහාය:** ප්‍රතිලාභීන් ඔවුන්ගේ ව්‍යවසායක ගමනේදී මග පෙන්වීම සඳහා පළපුරුදු උපදේශකයින් සහ ව්‍යාපාරික උපදේශකයින් සමඟ සම්බන්ධ කරවීම.

### ඉලක්කගත සහාය සහ වගවීම:

- **නිවැරදි ප්‍රතිලාභීන්:** ඔවුන්ගේ සාර්ථකත්වය සහ අවශ්‍යතාවය මත පදනම්ව නිවැරදි පුද්ගලයන්ට සහාය ලැබෙන බව සහතික කිරීම සඳහා දැඩි නිර්ණායක ක්‍රියාත්මක කිරීම.
- **කාර්ය සාධනය මත පදනම් වූ දිරිගැන්වීම්:** ක්ෂුද්‍ර, සහ සුළු ප්‍රමාණයේ ව්‍යවසාය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් සමෘද්ධි නිලධාරීන් සඳහා ප්‍රධාන කාර්යසාධක දර්ශක හඳුන්වා දීම.
- **ප්‍රජා පාදක ජන කණ්ඩායම් ක්ෂුද්‍ර මූල්‍ය අරමුදලෙන් මුදවා ගැනීම:** මහා පරිමාණ මූල්‍ය හා මූල්‍ය නොවන සමාගම් වැනි ආයතන ක්ෂුද්‍ර මූල්‍ය ලේබලය යටතේ අතිශය ඉහළ පොලී අනුපාත යටතේ ලබාදී ඇති ණය හේතුවෙන් අගතියට පත් වී ඇති ග්‍රාමීය ජනතාව මුදවා ගැනීම සඳහා කඩිනම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
- **දිරිගැන්වීමේ දීමනා ලබාදීමේ ක්‍රමවේදය:** සමෘද්ධි නිලධාරීන්ට ඔවුන් අධීක්ෂණය කරන ව්‍යවසායකත්වයන්ගේ සාර්ථකත්වය මත පදනම් ව දිරිගැන්වීමේ දීමනා සහ උසස්වීම් ලබා දීම මගින් ප්‍රතිඵල පිළිබඳ වග වීමේ සංස්කෘතියක් ඇති කිරීම.

### ධාරිතාවයන් ගොඩනැගීම සහ සංවර්ධනය

- **නිපුණතා සංවර්ධන වැඩසටහන්:** විවිධ කර්මාන්ත සඳහා ඉලක්කගත කුසලතා සංවර්ධන වැඩසටහන් ඉදිරිපත් කිරීම.
- **වෙළෙඳපොළ වෙත ප්‍රවේශය:** ව්‍යවසායකයින්ට දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට වේදිකා සහ අවස්ථා ලබා දීම සඳහා දැනටමත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැනුම්කරු වන ආණ්ඩුව 'හිතේ හයිය' ව්‍යවසායකයන්ගෙන් සෘජුව මිල දී ගන්නා ක්‍රමවේදයක් වහා සැකසෙනු ඇත.
- 'හිතේ හයිය' ජාතික විද්‍යුත් වෙළෙඳපොළ හඳුන්වා දීම.
- **නවෝත්පාදන මධ්‍යස්ථාන:** ව්‍යාපාර ආරම්භක අවස්ථාවේ පෝෂණය කිරීමට අවශ්‍ය උපදෙස්, මගපෙන්වීම සහ යටිතල පහසුකම් සපයන මධ්‍යස්ථාන පිහිටුවීම.

### ප්‍රජා මූලික සංවර්ධනය

- **ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය:** සහයෝගිතාව සහ හවුල්කාරිත්වය දිරිමත් කරන ප්‍රජා මූලික ආර්ථික සංවර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම. මේ සඳහා ප්‍රජා සහභාගිත්ව ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය පනතක් මගින් බලගන්වමින් නීත්‍යානුකූල කිරීම.
- **තිරසර පිළිවෙත්:** ප්‍රජාවේ සහ පරිසරයේ දිගුකාලීන යහපැවැත්මට දායක වන තිරසර ව්‍යාපාරික භාවිතයන් දිරිමත් කිරීම.
- **සමාජ ව්‍යවසාය සහාය:** ආර්ථික වටිනාකමක් ජනනය කරන අතරම ප්‍රජා අවශ්‍යතා සපුරාලන අවමංගල්‍යාධාර සමිති වැනි සමාජ ව්‍යවසාය සංවර්ධනයට සහාය වීම.
- **සමුපකාර ක්‍රමය:** ආර්ථික සහයෝගිතාවය සහ ප්‍රජාවට දරාගැනීමේ හැකියාව ප්‍රවර්ධනය කරමින් පුද්ගලයන්ට සම්පත් එක්රැස් කරමින්, දැනුම බෙදා ගැනීමට සහ ව්‍යාපාර සඳහා සාමූහිකව ආයෝජනය කිරීමට ඉඩ සැලසීම සඳහා සමුපකාර පද්ධති සවිමත් කිරීම.

- පිහිටුවන සංවර්ධන බැංකුව සමග මෙම ග්‍රාමීය ව්‍යුහය සම්බන්ධ කිරීමෙන් සමස්ත යාන්ත්‍රණය සුහුරු ගත කිරීම මගින් ඉලක්ක සපුරා ගැනීම.

## ළමා, කාන්තා, සහ ආබාධිත ප්‍රජාව කෙරෙහි සුබසාධනය

### ළමා සුබසාධනය

- **අධ්‍යාපනික සහාය:** සෑම දරුවෙකුටම සෙනෙහස, රැකවරණය, පෝෂණය, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ විනෝදාස්වාදය ලැබීම සහතික කිරීම.

- ළමා ආරක්ෂාව සහ සුබසාධනය පිළිබඳ දැනට පවතින සියලු ආයතන ඒකාබද්ධ කරමින් පූර්ණ බලැති අධිකාරියක් ස්ථාපිත කිරීම.

### කාන්තා සුබසාධනය

- **කාන්තා ව්‍යවසායකත්ව වැඩසටහන්:** කාන්තාව ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික ව බලගැන්වීම සඳහා කාන්තා ව්‍යවසායිකාවන් සඳහා විශේෂිත වැඩසටහන් දියත් කිරීම.

- **සෞඛ්‍ය සහ ආරක්ෂාව:** කාන්තා සෞඛ්‍යය වැඩිදියුණු කිරීම සඳහා පවුල් සෞඛ්‍ය නිලධාරිණියගේ මෙහෙයවීමෙන් 'මාතෘ' සංවිධානය හරහා ගම් මට්ටමින් ජංගම සුවනාරී සායන පැවැත්වීම.

### ආබාධිත ප්‍රජා සහභාගිත්වය

- ආබාධිත ප්‍රජාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දීම මගින් අබාධිතයින්ගේ ජීවිත සාමාන්‍යකරණය කිරීම සඳහා අවශ්‍ය සෑම පියවරක්ම ගැනීම.

- **දිරිගැන්වීම්:** ආබාධිත පුද්ගලයින්ට සේවයේ නියුක්ත කරන ව්‍යවසායකයින්ට විශේෂ දිරිගැන්වීම් ලබා දීම.

- **රාජ්‍ය සේවය:** රාජ්‍ය සේවා නියුක්තියෙන් 2%ක් ආබාධිත ප්‍රජාවට වෙන් කිරීම.

- **ව්‍යාපාරික අවස්ථා:** විවිධ සුවිශේෂී අවශ්‍යතා සහිත පුද්ගලයින් බඳවා ගන්නා සහ සහාය දක්වන ව්‍යාපාර සඳහා සහාය සහ දිරිගැන්වීම් ලබා දීම.

# තාරුණ්‍යය - 'පළමුව තාරුණ්‍යය'

ප්‍රමුඛත්වය තාරුණ්‍යයට. ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට දියුණු වීමට අවශ්‍ය කුසලතා, අවස්ථා සහ අභිප්‍රේරණය ලබා දෙමින් ඔවුන් සවිබල ගැන්වීම. මෙහි අරමුණ වන්නේ වර්තමානයේ තාරුණ්‍යය මුහුණ දෙන ගැටලු විසඳීම සහ ඔවුන් ජාතියේ සංවර්ධනයට ක්‍රියාකාරීව සහභාගි විය හැකි ආධාරක පරිසරයක් නිර්මාණය කිරීමයි.

### තරුණ ව්‍යවසායකත්වය

- **තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන්:** තරුණ ව්‍යවසායකයින් සහ ව්‍යාපාර ආරම්භකයින් දිරිමත් කිරීම සඳහා අරමුදල්, උපදේශන සහ සම්පත් සැපයීම.

### තරුණ විරැකියාව

- තරුණ විරැකියාව වසර 5ක් තුළ 3% දක්වා පහත හෙළීමටත් වසර 10ක් තුළ දී සහමුලින් ම දුරුකිරීමටත් පියවර ගැනීම මානව සම්පත් සංවර්ධන ආයතනයේ ප්‍රධානම වගකීම වේ.
- **රැකියා උත්පාදන මුලපිරීම්:** තරුණයින් ඉලක්ක කරගත් රැකියා අවස්ථා නිර්මාණය කිරීම සඳහා පුද්ගලික අංශයේ සමාගම් සමග හවුල් වීම.
- විදේශ රැකියා වෙළෙඳපොළේ අවස්ථා සහ තොරතුරු තානාපති කාර්යාල හරහා රැස්කර අධ්‍යයනය කිරීමට විදේශ රැකියා නියුක්ති කාර්යංශයේ පර්යේෂණ අංශයක් පිහිටුවීම සහ එහි සොයා ගැනීම් මත ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාඨමාලා සැකසීම.
- ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳපොළේ අවශ්‍යතා මත තරුණ ප්‍රජාවට වෘත්තීය පුහුණු ලබා දෙන ආයතනයක් ඇති කිරීම.
- රැකියා නියුක්තිය සඳහා වන නුපුහුණු ශ්‍රමය අපනයනය වෙනුවට උපදේශාත්මක හා වෘත්තීය සේවා අපනයනයට මග පෑදීම.
- **සීමාවාසික පුහුණුව සහ කාර්යයන්හි පළපුරුද්ද සඳහා වැඩසටහන්:** තරුණ තරුණියන් හට ප්‍රායෝගික සේවා පළපුරුද්ද ලබා දීමට සහ සේවා නියුක්තිය වැඩි දියුණු කිරීමට සීමාවාසික වැඩසටහන් සංවර්ධනය කිරීම.

### නිපුණතා සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

- **ප්‍රායෝගික කුසලතා පුහුණුව:** වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන ප්‍රායෝගික කුසලතාවලින් තරුණයින් සන්නද්ධ කිරීම සඳහා වෘත්තීය පුහුණු සහ ආධුනිකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- **අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම:** ප්‍රමාදයන් අවම කිරීම සඳහා අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සහ වර්තමාන සහ අනාගත රැකියා වෙළෙඳපොළ අවශ්‍යතා සමග විෂයමාලා පෙළගැස්වීම.
- **ඩිජිටල් සාක්ෂරතාවය:** විකාශනය වන ඩිජිටල් ආර්ථිකය සඳහා තරුණයින් සූදානම් කිරීම සඳහා ඩිජිටල් සාක්ෂරතාවය සහ තාක්ෂණික කුසලතා ප්‍රවර්ධනය කිරීම.

### දේශපාලන සහ සමාජ සහභාගීත්වය

- **තරුණ සභා සහ සංසද:** තරුණ ප්‍රජාවේ නායකත්ව ව්‍යවසායකයන් කලා සහ ක්‍රීඩා කුසලතා ඔප්නැංවීමට නායකත්වය ලබාදීමට නායකත්වය ලබාදිය හැකි අයුරින් ජාතික තරුණ සේවා සභාව ප්‍රතිසංවිධානය කිරීම.
- **නායකත්ව සංවර්ධනය:** තරුණ පාර්ලිමේන්තුව බලගැන්වීම ඇතුළු පාලනයේ සහ ප්‍රජා නායකත්වයේ ක්‍රියාකාරී භූමිකාවන් සඳහා තරුණ තරුණියන් සූදානම් කිරීම.

### අභිප්‍රේරණය සහ මානසික සෞඛ්‍යය

- **මානසික සෞඛ්‍ය සහාය:** තරුණ තරුණියන්ගේ මානසික යහපැවැත්ම ආමන්ත්‍රණය කිරීම සඳහා මානසික සෞඛ්‍යය යහපත්ව පවත්වාගෙන යාමට සම්පත් සහ උපදේශන සේවා සැපයීම.

- **අභිප්‍රේරණ වැඩසටහන්:** තාරුණ්‍යය දිරිමත් කිරීම සහ අභිප්‍රේරණය කිරීම සඳහා ආදර්ශ චරිත කතා, සාහිත්‍ය සහ කලාව භාවිත කිරීම.

- **ක්‍රීඩා සහ විනෝදාස්වාදය:** තරුණ ශක්තිය ධනාත්මකව මෙහෙයවීමට සාමූහිකත්වය සහ විනය ගොඩ නැගීම සඳහා ක්‍රීඩා සහ විනෝදාත්මක පහසුකම් සහ වැඩසටහන් සංවර්ධනය කිරීම.

- **නායකත්ව පුහුණුව:** උසස් පෙළ විභාගයෙන් පසු මාසයක අනිවාර්ය නායකත්ව පුහුණුවක්, ත්‍රිවිධ හමුදාවේ සහායෙන් පැවැත්වීම.

- **විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව:** ලෝකය පිළිගත් විශ්වවිද්‍යාලවල ශිෂ්‍යත්ව ශ්‍රී ලාංකික සිසුන්ට ලබාදීමට මැදිහත් වීම.

## බුද්ධිගලනය වැළැක්වීම

- **ආකර්ෂනීය අවස්ථා:** රට තුළ දක්ෂතා සපිරි පිරිස් රඳවා තබා ගැනීම සඳහා ආකර්ෂණීය වෘත්තීය අවස්ථා සහ සංවර්ධන වැඩසටහන් නිර්මාණය කිරීම.

- **ජාතික සේවා වැඩසටහන්:** ජාතික සංවර්ධනයට දායක වන අතරම තරුණයින්ට වටිනා කුසලතා සහ අත්දැකීම් ලබා දෙන ජාතික සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- **සංස්කෘතික හුවමාරු වැඩසටහන්:** ශ්‍රී ලංකාවට දැනුම සහ අත්දැකීම් හුවමාරුවක් ඇති කරවීම සඳහා තරුණයින් දිරිමත් කරන සංස්කෘතික හුවමාරුව සහ ගෝලීය පරිසරයන්ට නිරාවරණ වන අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

- **බුද්ධි ගලනයට නීතිමය සීමා:** මානව සම්පත් සංවර්ධන ආයතනය විසින් කාලානුරූපීව නියම කරන පරිදි රට තුළ හිඟයක් ඇති වෘත්තීන් හි වෘත්තීයවේදීන්ට මව්බිමට සේවය කළ යුතු අවම සේවා කාලයක් නියම කිරීම.

## ඒකාබද්ධ වැඩසටහන් සහ මූල පිරීම්

- තරුණ පිරිස් සඳහා අවශ්‍ය විවිධාකාර සහාය ලබා දීම සඳහා එක් එක් ආයතනයේ ශක්තීන් උපයෝගී කර ගන්නා ඒකාබද්ධ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- **උදාහරණය:** වෘත්තීය පුහුණුව සහ ආධුනිකත්ව අධ්‍යාපනය ඒකාබද්ධ කරමින් මිශ්‍ර ඉගෙනුම් අවස්ථා ලබා දීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය අතර ඒකාබද්ධ මූලපිරීමක් ඇතිකරවීම.

## පද්ධතිමය යළි පිහිටුවීම

- **ප්‍රතිපත්ති උපදේශනය:** තාරුණ්‍යය මුහුණ දෙන සුවිශේෂී අභියෝගවලට මුහුණ දෙන සහ ඔවුන්ගේ අවශ්‍යතා ජාතික ප්‍රමුඛතාවයක් බවට සහතික කරන ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීම.

- **පළමුව තාරුණ්‍යය කාර්ය සාධක බලකාය:** තාරුණ්‍යය සවිබල ගැන්වීමේ මූලපිරීම් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා කැප වූ කාර්ය සාධක බලකායක් පිහිටුවීම.

- **ප්‍රතිචාර පසුවිපරම:** ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳ ප්‍රතිචාර සැපයීම සඳහා තරුණ තරුණියන් සඳහා අවස්ථා නිර්මාණය කිරීම, අඛණ්ඩ ව එම අවස්ථා වැඩිදියුණු කිරීම.

# සංස්කෘතිය හා කලාව - 'පහන් පැල'

සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කර මතුපරපුරට දයාද කිරීම රාජ්‍යයේ ප්‍රමුඛ වගකීමක් බව පිළිගනිමින් සියලු පුරවැසියන්ගේ කලා කුසලතා ඔප් නංවා පෝෂණය කිරීම, නවෝත්පාදන සංස්කෘතියක් බිහි කිරීම සහ කලාව, සාහිත්‍ය සහ සංස්කෘතිය එදිනෙදා ජීවිතයට බද්ධ කිරීම මගින් ප්‍රීතිමත් සහ නිර්මාණශීලී දේශප්‍රේමී සතුටු දෑයක් බිහි කිරීම.

### ප්‍රජා කලා වැඩසටහන්

- **දේශීය කලා නිර්මාණ මූල පිරීම:** චිත්‍ර, සංගීතය, නැටුම්, රංග කලාව සහ අත්කම් ඇතුළු කලාත්මක ක්‍රියාකාරකම් සඳහා සියලුම වයස්වල පුරවැසියන්ට සහභාගි විය හැකි ප්‍රජාපාදක කලා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීම.
- **පොදු කලා ව්‍යාපෘති:** දේශීය සංස්කෘතිය සහ අනන්‍යතාවය පිළිබිඹු කරන බිතුසිතුවම්, මූර්ති සහ කැටයම් නිර්මාණය කිරීමට ප්‍රජාවන් සම්බන්ධ කර ගන්නා පොදු කලා ව්‍යාපෘති දියත් කිරීම.
- **පොදු ස්ථානයන්හි ප්‍රජා සහභාගිත්වයෙන් කලා කෘති නිර්මාණය:** සෑම කෙනෙකුටම ප්‍රවේශ විය හැකි පරිදි උද්‍යාන, පුස්තකාල සහ ප්‍රවාහන මධ්‍යස්ථාන වැනි පොදු ස්ථානයන්හි ප්‍රජා සහභාගිත්වයෙන් කලා කෘති නිර්මාණය කිරීම.

### කලා අධ්‍යාපනය සඳහා ප්‍රවේශය

- **පාසල්හි කලා අධ්‍යාපනය:** සියලුම පාසල් සිසුන්ට ඔවුන්ගේ කලා කුසලතා හඳුනාගැනීමට අවස්ථාව ඇති බව සහතික කරමින්, මුල් ළමාවියේ සිට ද්විතීයික අධ්‍යාපනය දක්වා පාසල් විෂය මාලාවට කලා අධ්‍යාපනය ඇතුළත් කිරීම.
- **විෂය බාහිර වැඩසටහන්:** පාසල්, ප්‍රජා මධ්‍යස්ථාන සහ මාර්ගගත වේදිකාවල විෂය බාහිර කලා වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම.
- **වැඩිහිටියන් සඳහා කලා අධ්‍යාපනය:** සවස පන්ති, සති අන්ත වැඩමුළු, සහ මාර්ගගත පාඨමාලා ආදී දෑ මගින් වැඩිහිටියන්ට කලාව පිළිබඳ අධ්‍යයනය කිරීමට අවස්ථා ලබා දීම.

### නැගී එන කලාකරුවන්ට අතහිත

- **කලාකරුවන්ට මූල්‍ය දිරිගැන්වීම:** කලාකරුවන්ගේ කුසලතා වර්ධනය කරගැනීමට සහ ඔවුන්ගේ කලා වෘත්තීන් දිරිමත් කිරීමට, විවිධ විෂය ක්ෂේත්‍රවල නැගී එන කලාකරුවන්ට උපකාර කිරීම සඳහා ප්‍රදානයන් සහ ශිෂ්‍යත්ව ලබා දීම.
- **උපදේශන වැඩසටහන්:** ජ්‍යෙෂ්ඨ කලාකරුවන් සහ නැගී එන කලාකරුවන් අතර සහයෝගිතාවය ගොඩනැගීමෙන් ප්‍රවීණයන්ට ආධුනිකයන්ට මගපෙන්වීම සඳහා අවස්ථාව සැලසීම.
- **කලාකරුවන්ගේ වාසස්ථාන:** කලාකරුවන්ට නව නිර්මාණ කිරීම සඳහා අවශ්‍ය කාලය, සම්පත් සහ පරිසරය සපයන කලාකරුවන්ගේ නේවාසික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### සංස්කෘතික මධ්‍යස්ථාන

- **නිර්මාණාත්මක මධ්‍යස්ථාන:** කලාකරුවන්ට සහයෝගයෙන් කටයුතු කිරීමට, සම්පත් බෙදා ගැනීමට සහ ඔවුන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය කිරීමට හැකි නිර්මාණාත්මක මධ්‍යස්ථාන සහ සංස්කෘතික මධ්‍යස්ථාන රට පුරා පිහිටුවීම.
- **නවෝත්පාදන විද්‍යාගාර:** කලාත්මක ප්‍රකාශනයන්හි නව ආකාරයන් ගවේෂණය කරන සංස්කෘතික නවෝත්පාදන විද්‍යාගාර ස්ථාපිත කිරීම සහ සාම්ප්‍රදායික කලාවන්හි සීමාවන් පුළුල් කිරීම සඳහා තාක්ෂණය භාවිත කිරීම.
- **සංස්කෘතික කලාප:** කලාගාර, සිනමාහල්, චිත්‍රාගාර සහ නිර්මාණාත්මක ව්‍යාපාර සඳහා සත්කාරකත්වය සපයන නගරවල සංස්කෘතික කලාප සංවර්ධනය කිරීම, කලාත්මක ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයන කලාගාර, සිනමාහල්, චිත්‍රාගාර මෙන්ම නිර්මාණාත්මක ව්‍යාපාරවලින්ද යුත් සංස්කෘතික කලාප පිහිටුවීම.

## ජාතික සංස්කෘතික උත්සව

- **ජාතික කලා උළෙලක් ඇති කිරීම:** ශ්‍රී ලාංකේය අනන්‍යතාවය සහිත සර්ව කලා කටයුතුවල විවිධත්වය සහ පොහොසත්කම සැමරීම සඳහා ජාතික කලා දිනයක් නම් කර එදින ජාතික කලා උළෙලක් මෙන්ම රටපුරා ප්‍රසංග, ප්‍රදර්ශන සහ වැඩමුළු පැවැත්වීම.
- **ප්‍රජා උත්සව:** ප්‍රාදේශීය කලා සහ සම්ප්‍රදායයන් ඉස්මතු කරන, ප්‍රජා සහභාගීත්වය සහ සංචාරක ව්‍යාපාරය දිරි ගන්වන දේශීය සංස්කෘතික උත්සව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.
- **ජාතික තරගාවලි සහ සම්මාන උළෙල සංවිධානය කිරීම:** කැපී පෙනෙන දක්ෂතා හඳුනාගෙන ත්‍යාග සහ සම්මාන පිරිනැමීම සඳහා විවිධ කලාත්මක විෂයයන් සඳහා ජාතික තරග සහ සම්මාන සංවිධානය කිරීම.

## ඩිජිටල් කලා සහ නවෝත්පාදන

- **ඩිජිටල් වේදිකා:** කලාකරුවන්ට ඔවුන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය කිරීමට සහ විකිණීමට, ප්‍රේක්ෂකයින් සමග සම්බන්ධ වීමට සහ ගෝලීය වශයෙන් අනෙකුත් කලාකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සබැඳි වේදිකා බිහි කිරීම.
- **ඩිජිටල් කලා අධ්‍යාපනය:** ග්‍රැෆික් නිර්මාණ, ඩිජිටල් ඡායාරූපකරණය, වීඩියෝ නිෂ්පාදනය සහ අනෙකුත් නව මාධ්‍ය කලාවන්හි කුසලතා උගන්වන ඩිජිටල් කලා අධ්‍යාපන වැඩසටහන් දියත් කිරීම.
- **නවීන ඩිජිටල් කලා නිර්මාණ අවස්ථා:** වර්චුවල් රියැලිටි සහ ඔග්මෙන්ටඩ් රියැලිටි වැනි නවීන ඩිජිටල් කලා නිර්මාණ බිහි කිරීමට සහ අත්විඳීමට ජනතාවට ඇති අවස්ථා පුළුල් කිරීම.

## කලාව ප්‍රවර්ධනය

- **මාධ්‍ය ප්‍රචාරණ:** සමාජය තුළ කලාව සහ සංස්කෘතියේ වැදගත්කම ප්‍රවර්ධනය කරන සහ ශ්‍රී ලාංකේය කලාකරුවන්ගේ ජයග්‍රහණ ඉස්මතු කරන ජාතික මට්ටමේ මාධ්‍ය ප්‍රචාරණ දියත් කිරීම.
- **සංස්කෘතික සංචාරක ව්‍යාපාරය:** ශ්‍රී ලංකාවේ කලාත්මක හා සංස්කෘතික ස්ථාන සහ ක්‍රියාකාරකම් වෙත සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට හැකි වන පරිදි සංස්කෘතික සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම තුළින් දේශීය ආර්ථිකයට සහාය වීම සහ සංස්කෘතික දැනුවත්භාවය පැතිරවීම.
- **ආයතනික හවුල්කාරිත්වයන්:** කලා වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා අනුග්‍රහය දැක්වීමට ව්‍යාපාර ආයතන පෙළඹවීම සඳහා රජය මැදිහත්වීම.

## දේශීය භාෂාවන්ට මුල්තැන

- සියලුම පුරවැසියන්ට තෝරාගත් රාජ්‍ය භාෂාවකින් ආණ්ඩුව සමග සන්නිවේදනය කිරීමට ඇති අයිතිය බලාත්මක කිරීම.
- දේශීය භාෂාවන් හා එහි උපකුලකයන් පිළිබඳ පර්යේෂණයන් සහ සංරක්ෂණයන් සිදුකරන භාෂා විද්‍යාගාර පිහිටුවීම.
- ආගමික සහ සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඩිජිටල්කරණය හරහා සංරක්ෂණය කර අනාගත පරපුරට දයාද කිරීම මෙන්ම මහජනතාවට පහසුවෙන් පරිශීලනය කිරීමට අවස්ථාව ලබා දීම.

# යුක්තිය - 'සැමට සම සේ'

නීතියේ ආධිපත්‍යය සවිමත් කර, මානව හිමිකම් සුරැකීම ප්‍රවර්ධනය කිරීමෙන් සෑම පුද්ගලයෙකුටම සම සේ සැලකීමත් නීතිමය රැකවරණයට සම අවස්ථා ලැබීමත් සහතික කිරීමෙන් සාධාරණ සමාජයක් බිහි කිරීම.

### අධිකරණයේ ස්වාධීනත්වය සහ විශ්වසනීයත්වය

- **ස්වාධීන අධිකරණය:** නීතියේ ආධිපත්‍යය අපක්ෂපාතීව ආරක්ෂා කිරීම සඳහා අධිකරණයේ ස්වාධීනත්වය සහ දේශපාලන සහ වෙනත් දේශීය හෝ විදේශීය බාහිර බලපෑම්වලින් තොර බව සහතික කිරීම.

- **විනිවිද භාවයෙන් යුතු පත්වීම්:** විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් පත් කිරීම කුසලතාවය මත පදනම් ව විනිවිද භාවයෙන් ක්‍රියාත්මක කරන බව සහතික කිරීම.

- **ස්වාධීන මහජන අභිචෝදක ධුරයක්:** අපරාධ නඩු පැවරීම දේශපාලනීයකරණයෙන් මුදගෙන ස්වාධීන කිරීම සඳහා අභිචෝදනා ගොනු කිරීම සඳහා ස්වාධීන මහජන අභිචෝදක ධුරයක් ස්ථාපිත කිරීම.

### සැමට යුක්තිය

- **නීති ආධාර සේවා:** සියලුම පුරවැසියන්ට, විශේෂයෙන් ම අඩු වරප්‍රසාද ලත් අයට, නීති නියෝජනය සහ උපදෙස් සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම සඳහා නොමිලේ නීති සහාය ලබාදීම විධිමත් සහ කාර්යක්ෂම කිරීම.

- සෑම නීතිඥයෙකුම සෑම විටම අවම වශයෙන් එක් නඩුවකට නොමිලේ පෙනී සිටින බවට නීති ආධාර කොමිෂන් සභාව හරහා නෛතිකව තහවුරු කිරීම.

- **ප්‍රජා නීති සායන:** නොමිලේ හෝ අඩු වියදම් නෛතික සේවා සැපයීම සඳහා රටපුරා ප්‍රජා නීති සායන පිහිටුවීම.

### මානව හිමිකම් ආරක්ෂාව

- **මානව හිමිකම් කොමිෂන් සභාව:** මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ඵලදායී ලෙස විමර්ශනය කිරීමට සහ විසඳීමට මානව හිමිකම් කොමිෂන් සභාව ශක්තිමත් කිරීම.

- **මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර:** පුරවැසියන් ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ඒවා ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුවත් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර පැවැත්වීම.

- **වෙනස් කොට සැලකීම වැළැක්වීමේ නීති:** ස්ත්‍රී පුරුෂ භාවය, ජන වර්ගය, කුලය, ආගම, ආබාධිතභාවය සහ වෙනත් ආරක්ෂිත ලක්ෂණ මත පදනම් ව වෙනස් කොට සැලකීම තහනම් කරන නීති බලාත්මක කිරීම සහ ශක්තිමත් කිරීම.

### නීතිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ

- **අපරාධ නීති ප්‍රතිසංස්කරණ:** සාධාරණ නඩු විභාග, රැඳවියන්ට මානුෂීය ලෙස සැලකීම සහ පුනරුත්ථාපනය කේන්ද්‍ර කරගත් නිවැරදි කිරීම් සහතික කිරීම සඳහා අපරාධ අධිකරණ පද්ධතියට ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම. දණ්ඩ නීති සංග්‍රහය යාවත්කාලීන කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවක් පිහිටුවීම.

- **සිවිල් නීති ප්‍රතිසංස්කරණය:** ප්‍රමාදයන් අවම කිරීම සහ සිවිල් යුක්ති පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා සිවිල් නඩු ක්‍රියාවලින් විධිමත් කිරීම.

- **විකල්ප ආරාවුල් විසඳීම:** ගැටුම් සාමකාමීව සහ කාර්යක්ෂම ව විසඳීම සඳහා මැදිහත්වීම සහ බේරුම්කරණය වැනි විකල්ප ආරාවුල් විසඳීමේ යාන්ත්‍රණයන් ප්‍රවර්ධනය කිරීම.

- යුක්තිය පසිඳලීම පමා වීම අවම කිරීම සඳහා විනිසුරුවරු, නීතිපති දෙපාර්තමේන්තු නිලධාරීන් සහ අධිකරණ වැඩි කිරීම.

- යුක්තිය පසිඳලීමේ පමාවෙන් ආර්ථිකයට ඇතිවන බලපෑම අවම කිරීම සඳහා වාණිජ අධිකරණ පද්ධතිය පුළුල් කිරීම.

- ද්විත්ව පුරවැසියන් සහ විදේශිකයන්, අමාත්‍යාංශ ලේකම්, රාජ්‍ය ආයතන ප්‍රධානී, තානාපති යන තනතුරු සහ දේශපාලන පක්ෂවල තනතුරු දැරීම නීතියෙන් තහනම් කෙරේ.

## සැමට සමානාත්මව නීතිය ක්‍රියාත්මක කිරීම

- **ප්‍රජා පොලිස්කරණය:** නීතිය ක්‍රියාත්මක කරන්නන් සහ ප්‍රජාවන් අතර විශ්වාසය සහ සහයෝගිතාව ගොඩනැගීම සඳහා ප්‍රජා පොලිස් සේවාව පුළුල් කිරීම.
- **පොලිස් පුහුණුව සහ සුබසාධනය:** මානව හිමිකම්, සංස්කෘතික සංවේදිතාව සහ ප්‍රචණ්ඩකාරී නොවන ගැටුම් නිරාකරණය පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට පුළුල් පුහුණුවක් ලබා දීම. පොලිස් නිලධාරීන්ට නිසි ත්‍යාග පිරිනමන බවටත්, ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා නවීන පහසුකම් සහ තාක්ෂණයන් සපයා ඇති බවටත් සහතික වීම.
- කුසලතා පදනම් වූ උසස් වීම් හඳුන්වා දීම.

## සැමට සම ඉඩක්

- **ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය:** ඉලක්කගත ප්‍රතිපත්ති සහ වැඩසටහන් හරහා අධ්‍යාපනය, රැකියා සහ දේශපාලන සහභාගිත්වය ඇතුළු සමාජයේ සියලුම ක්ෂේත්‍රවල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම.
- **අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා සහාය:** ළමුන්, වැඩිහිටියන්, ආබාධ සහිත පුද්ගලයින් සහ සුළුතර ප්‍රජාවන් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල විශේෂිත අවශ්‍යතා සපුරාලන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවර්ධනය කිරීම.
- **ආර්ථික සමානාත්මතාවය:** ආර්ථික විෂමතා අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ සියලුම පුරවැසියන්ට ආර්ථික ප්‍රගතිය සඳහා සම අවස්ථාවන් සහතික කිරීම.

## නීති අධ්‍යාපනය සහ උපදේශනය

- **නීති සාක්ෂරතා වැඩසටහන්:** පුරවැසියන් ඔවුන්ගේ නීතිමය අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා පාසල් විෂය නිර්දේශයට නීති අධ්‍යාපනය ඇතුළු කිරීම සහ ප්‍රජාව ඉලක්ක කර ගත් නීති වැඩමුළු පැවැත්වීම.
- **ප්‍රජාචාර අධ්‍යාපනය:** ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම සහ ක්‍රියාකාරී පුරවැසිභාවය පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා පාසල් විෂය මාලාවට ප්‍රජාචාරය එක් කිරීම.
- **සිවිල් සංවිධාන සහයෝගිතාව:** යුක්තිය සහ සාධාරණත්වය සඳහා ක්‍රියාකරන සිවිල් සමාජ සංවිධාන දිරිමත් කිරීම සහ ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

## ඩිජිටල් වේදිකා සහ තාක්ෂණය

- **ඩිජිටල් අධිකරණ සේවා:** කඩිනමින් යුක්තිය ඉටු වීම සඳහා මාර්ගගත ක්‍රම තුළින් නෛතික තොරතුරු, සේවාවන් සහ අධිකරණ සැසි පැවැත්වීමෙන් යුක්තිය පසිඳලීමේ සීමාවන් පුළුල් කිරීම.
- **ජංගම නීති යෙදුම්:** පුරවැසියන්ට නීති සේවා වෙත ප්‍රවේශ වීමට, පැමිණිලි ගොනු කිරීමට සහ ඔවුන්ගේ නඩුවල ප්‍රගතිය අධීක්ෂණයට ජංගම යෙදුම් සකස් කිරීම.
- **නීතිමය ක්‍රියාවලින් සඳහා කෘතිම බුද්ධිය:** වේගවත් හා වඩාත් නිවැරදි නෛතික ප්‍රතිඵල සඳහා නෛතික පර්යේෂණ, සිද්ධි කළමනාකරණයට කෘතිම බුද්ධි මෙවලම් භාවිත කිරීම.

# ක්‍රීඩාව - 'ගතට සිතට'

සෑම පසුබිමකින්ම දක්ෂයින් ක්‍රීඩාවට ආකර්ෂණය කර ගන්නා උසස් තත්ත්වයේ පුහුණුවක් සපයන සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ආරක්ෂාව සහ අවස්ථා ලබා දෙන ශක්තිමත් ක්‍රීඩා පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමෙන්, නිරෝගි සම්පන්න, විනය ගරුක, සාමූහිකව කටයුතු කරන ජාතියක් නිර්මාණය කිරීම තුළින් මව්බිම සන්නාමයක් ලෙස ක්‍රීඩාව තුළින් ඔසවා තැබිය හැකි ගෞරවනීය වෘත්තීය මාර්ගයක් බවට ක්‍රීඩාව පත්වන බව සහතික කිරීම.

## ප්‍රතිපත්ති සහ පාලනය

- **ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය:** ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනය සඳහා වූ දැක්ම, ඉලක්ක සහ උපාය මාර්ග දක්වා ඇති විස්තීරණ ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම.

- **ක්‍රීඩාව පාලනය:** සාධාරණත්වය, වග වීම සහ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රීඩා සංවිධානවල විනිවිදභාවයෙන් හා ඵලදායී පාලනයක් සහතික කිරීම.

## සෑමට ක්‍රීඩා

- වයස, ස්ත්‍රී පුරුෂභාවය හෝ වෙනත් කිසිම සමාජ බෙදීමකින් තොරව සමස්ත ජාතියම ක්‍රීඩාවට යොමුවන අයුරින් ක්‍රීඩාව රටපුරා ප්‍රචලිත කිරීම.

- ක්‍රීඩාවේ ජනතා සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා අවම පිරිවැයක් මෙන්ම අඩු ඉඩක් අවශ්‍ය වන වොලිබෝල් ක්‍රීඩාව ප්‍රචලිත කිරීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

## කුසලතා හඳුනාගැනීම සහ සංවර්ධනය

- **බිම් මට්ටමේ වැඩසටහන්:** ළමා කාලයේදී ම ක්‍රීඩා කුසලතාවයන් හඳුනාගැනීම සඳහා රාජ්‍ය මැදිහත්වීමෙන් ගම් මට්ටමින් ක්‍රීඩා සංසද බිහි කිරීම.

- සෑම පාසල් දරුවෙකුටම අවම වශයෙන් එක් ක්‍රීඩාවකට සහභාගි වීම අනිවාර්ය කිරීම.

- **රටපුරා විසුරුණු කුසලතාවයන් හඳුනාගැනීම:** අඩු වරප්‍රසාද ලත් සහ ග්‍රාමීය ප්‍රදේශවල සිටින දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන පෝෂණය කිරීම සඳහා පුළුල් කුසලතා හඳුනාගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- **ශිෂ්‍යත්ව සහ මූල්‍ය ආධාර:** දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මූල්‍ය දුෂ්කරතාවකින් තොරව තම ක්‍රීඩා දිවිය කරගෙන යා හැකි බව සහතික කිරීම සඳහා ශිෂ්‍යත්ව සහ මූල්‍යාධාර පිරිනැමීම.

## උසස් තත්ත්වයේ පුහුණුව

- **ක්‍රීඩා අධ්‍යයන ආයතන සහ පාසල්:** උසස් තත්ත්වයේ පුහුණුව, අධ්‍යාපනය සහ පහසුකම් සපයන විශේෂිත ක්‍රීඩා අධ්‍යයන ආයතන සහ පාසල් රට පුරා පිහිටුවීම.

- **ක්‍රීඩා විශ්වවිද්‍යාල:** ක්‍රීඩා විද්‍යාව, කළමනාකරණය සහ පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන විශේෂිත පුහුණුව, පුහුණු කිරීම් සහ අධ්‍යයන වැඩසටහන් සපයන ක්‍රීඩා විශ්වවිද්‍යාල බිහි කිරීම.

- **වෘත්තීය පුහුණුකරුවන්:** ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට හොඳම මග පෙන්වීම සහ සහාය ලැබෙන බව සහතික කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය පුහුණුකරුවන් බඳවා ගැනීම සහ පුහුණු කිරීම. පුහුණුකරුවන්ට සාර්ථක ලෙස වෘත්තිය කරගෙන යාමට අවශ්‍ය තාක්ෂණය සහ මූල්‍ය සහාය ලබාදීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.

- **ඉහළ කාර්යසාධන මධ්‍යස්ථාන:** තාක්ෂණික සහ පෝෂණ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ඉහළ තාක්ෂණයෙන් යුතු පුහුණු ආයතන පිහිටුවීම.

## ක්‍රීඩකයින්ට පරිපූර්ණ සහායක්

- **ක්‍රීඩා වෘත්තීය ප්‍රවර්ධනය:** ක්‍රීඩකයින් වෘත්තයමය ක්‍රීඩකයින් බවට පත් කරමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවාලීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- **වෘත්තීය සුරක්ෂිතතාව:** ක්‍රීඩාවෙන් විශ්‍රාම ගන්නා අය සඳහා අධ්‍යාපනය සහ වෘත්තීය සංක්‍රාන්ති වැඩසටහන් ඇතුළුව ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා වෘත්තීය සුරක්ෂිතභාවය සැපයීම.

- **සෞඛ්‍යය සහ යහපැවැත්ම:** ක්‍රීඩක ක්‍රීඩිකාවන් හොඳින් රැකබලා ගැනීම සහතික කිරීම සඳහා ශාරීරික හා මානසික සෞඛ්‍ය සහාය ඇතුළුව පුළුල් සෞඛ්‍ය සේවා පිරිනැමීම.

- **රක්ෂණ සහ ප්‍රතිලාභ:** ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ආරක්ෂාව සහ නිරවුල් මනසකින් ක්‍රීඩා කටයුතු සඳහා නිරත වීම සඳහා රක්ෂණ සහ අනෙකුත් ප්‍රතිලාභ ලබා දීම.

### ක්‍රීඩා යටිතල සහ අනෙකුත් පහසුකම්

- **නවීන පහසුකම්:** රට පුරා සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ප්‍රවේශ විය හැකි අති නවීන තාක්ෂණය හා ක්‍රීඩා පහසුකම් ගොඩනැගීමට සහ නඩත්තු කිරීමට ආයෝජනය කිරීම.

- **ප්‍රජා ක්‍රීඩා මධ්‍යස්ථාන:** ක්‍රීඩාවට පුළුල් ලෙස සහභාගී වීම දිරිමත් කිරීම සඳහා ප්‍රජා ක්‍රීඩා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සහ ප්‍රාදේශීය මට්ටමින් පුහුණු පහසුකම් සැපයීම.

### උසස්වීම් සහ දිරි දීමනා

- **මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර:** ක්‍රීඩාවේ වැදගත්කම ප්‍රවර්ධනය කිරීම සහ සියලුම වයස් කාණ්ඩ අතර සහභාගීත්වය දිරිගැන්වීම සඳහා ප්‍රචාරක ව්‍යාපෘති දියත් කිරීම.

- **විශිෂ්ටත්වය සඳහා දිරි දීමනා:** ක්‍රීඩකයින්ට අභිප්‍රේරණය සපයමින් ක්‍රීඩාවට සහභාගිත්වය වැඩි කරන ක්‍රියාමාර්ග යක් ලෙස ජයග්‍රහණ වර්ගීකරණය මත සම්මාන, මූල්‍ය ත්‍යාග සහ අනුග්‍රාහක අවස්ථා ඇතුළු ක්‍රීඩාවේ කැපී පෙනෙන කාර්යසාධනය පිළිගැනීමක් ඇති කිරීම.

- **ආයතනික හවුල්කාරිත්වයන්:** සෑම ක්‍රීඩාවක් උදෙසාම මූල්‍ය දයකත්වය දැරීමට සහ අමතර සම්පත් සැපයීමට පෞද්ගලික අංශය සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම.

### ජාත්‍යන්තර තරග සඳහා අවස්ථා

- **ජාත්‍යන්තර තරග:** ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර තරග සඳහා සහභාගී වීමට අවස්ථා සහ පහසුකම් සැලසීම රජය මගින් තහවුරු කිරීම. රට තුළ ක්‍රීඩාව ප්‍රචලිත කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ තරගාවලි පැවැත්වීම.

- **හුවමාරු වැඩසටහන්:** ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සහ පුහුණුකරුවන්ට ජාත්‍යන්තර ප්‍රමිතීන් ඉගෙන ගැනීමට අවස්ථාව සැලසීම සඳහා වෙනත් රටවල් සමඟ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# තාක්ෂණය - 'බිසෝකොටුවෙන් ඔබ්බට'

සියලු පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා තාක්ෂණය උපයෝගී කරගන්නා සුහුරු රටක් නිර්මාණය කරනු වස් ඩිජිටල් සංවර්ධනය ද ඇතුළුව තාක්ෂණය සහ විද්‍යාව දියුණු කරමින් නවෝත්පාදනයන් පෝෂණය කිරීම.

## නවෝත්පාදන සහ පර්යේෂණ

- පර්යේෂණ හරහා ගොඩනගනු ලබන නව දැනුම තීරණාත්මක බලයක් බවට පත්ව ඇති ගෝලීය සමාජ, ආර්ථික හා දේශපාලන වටපිටාව තුළ, නව දැනුම උත්පාදනය කිරීම සඳහා දේශීය පර්යේෂණ සංස්කෘතියක් ගොඩනැගීම සඳහා උපාය මාර්ගික ප්‍රවේශයක් ගැනීම.
- ඒ සඳහා දැනට රජයෙන් වෙන් කෙරෙන දේශීය දළ නිෂ්පාදිතයේ 0.12% ප්‍රයෝගික මට්ටමින් ක්‍රමික ව ඉහළ නැංවීමට කටයුතු කිරීම. මීට අමතරව තරගකාරී පදනමකින් විදේශීය පර්යේෂණ පුණ්‍යායතන හරහා පූර්ණ විනිවිද භාවයෙන් දිනාගන්නා පර්යේෂණ ප්‍රතිපාදන රට තුළට ගෙන ඒමේ සියලු බාධක ඉවත් කරනු ලැබේ.
- කෙසේ වුවද රජයේ පූර්ණ අනුග්‍රහය හරහා ගොඩනගනු ලබන මෙම ක්‍රියාදාමය තුළ පර්යේෂණ ආචාර ධර්මවලට ද එවැනිම ප්‍රමුඛත්වයක් දෙනු ලබන අතර, එම පර්යේෂණ දැනුම අපනයන ආර්ථිකයට හා සේවා සැපයුම් සඳහා බද්ධ කිරීමට කටයුතු කරනු ලැබේ.
- පර්යේෂණ ක්‍රියාදාමයේ සමස්ත චක්‍රය තුළ සියලුම පාර්ශ්වකරුවන්ගේ භූමිකාව සහතික කරනු ලැබේ. ඒ මගින් පර්යේෂණවල ප්‍රතිලාභ ජනතාවගේ සුභසිද්ධිය සඳහා කටයුතු යොදනු ලැබේ.
- **ජාතික නවෝත්පාදන මධ්‍යස්ථාන:** විශ්වවිද්‍යාල, කර්මාන්ත සහ ආණ්ඩුව අතර සහයෝගිතාවයෙන් රට පුරා නවෝත්පාදන මධ්‍යස්ථාන සහ පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම.
- **පර්යේෂණ සහ සංවර්ධන අරමුදල්:** ජෛව තාක්ෂණය, පුනර්ජනනීය බලශක්තිය, කෘතිම බුද්ධිය සහ අධි තාක්ෂණික නිෂ්පාදන වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල පර්යේෂණ සහ සංවර්ධන සඳහා ජාතික අයවැයෙන් නිශ්චිත මුදලක් වෙන් කිරීම.
- **විශ්වවිද්‍යාල හා ව්‍යවසායක හවුල්කාරිත්වය:** පර්යේෂණ නව්‍යකරණය සහ වාණිජකරණය සඳහා විශ්වවිද්‍යාල සහ ව්‍යවසායකයන් අතර හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම.

## ඩිජිටල් යටිතල පහසුකම්

- **රැහැන්වලින් තොර අන්තර්ජාල ප්‍රවේශය:** සැමට ඩිජිටල් පහසුකම් ලැබෙන බව සහතික කිරීම සඳහා ග්‍රාමීය සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශ කෙරෙහි අවධානය යොමු කරමින් අධිවේගී අන්තර්ජාල පහසුකම් රටපුරා ව්‍යාප්ත කිරීම.
- **සුහුරු නගර:** ප්‍රවාහනය, බලශක්ති කළමනාකරණය සහ පොදු සේවාවන් ඇතුළුව නාගරික ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණය උපයෝගි කරගන්නා සුහුරු නගර ඉදි කිරීම.
- **5G තාක්ෂණය:** උසස් තාක්ෂණික යෙදුම් සඳහා සහාය වීමට සහ සම්බන්ධතාව ඉහළ නැංවීමට 5G ජාල යෙදවීම වේගවත් කිරීම.

## ව්‍යවසායක යටිතල පහසුකම්

- **තාක්ෂණික ඉන්ක්‍යුබේටර් ස්ථාපිත කිරීම:** නව ව්‍යාපාර සඳහා ප්‍රමාණවත් තාක්ෂණික සහායක් ලැබෙන බව තහවුරු කිරීම පිණිස තාක්ෂණික ඉන්ක්‍යුබේටර් ස්ථාපිත කිරීම. දැනට ස්ථාපිත කර ඇති තාක්සණික ඉන්ක්‍යුබෝටර් උපරිම ඵලදායිව යොදගැනීමට පියවර ගැනීම.
- **බීජ ප්‍රාග්ධනය සහ අරමුදල් සැපයීම:** නවෝත්පාදන ව්‍යාපෘති සඳහා බීජ ප්‍රාග්ධනය ඇතුළු අරමුදල් සම්පාදනය සඳහා යාන්ත්‍රණයක් සැකසීම.
- **නවෝත්පාදන තරගාවලි පැවැත්වීම:** නිර්මාණශීලීත්වය දිරිගැන්වීමට සහ දැවෙන ගැටලු විසඳීමට නිර්මාණකරුවන් පෙළඹවීම සඳහා ජාතික මට්ටමින් නවෝත්පාදන අභියෝගාත්මක තරගාවලි සංවිධානය කිරීම සහ ඒවායෙන් සුදුසු නවෝත්පාදන ජාතික සංවර්ධන ක්‍රියාවලියට සජීවීව දයක කර ගැනීම.

### තාක්ෂණ කුසලතා ප්‍රවර්ධනය

- **විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිත අධ්‍යාපනය:** විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිතය යන විෂයයන් කුඩා කල සිටම ඉගැන්වෙන අයුරින් විෂය මාලාවට එක් කිරීම.
- **ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන්:** ඩිජිටල් ආර්ථිකයට අවශ්‍ය කුසලතාවලින් පුරවැසියන් සන්නද්ධ කිරීම සඳහා ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- **තාක්ෂණ ආධුනිකත්ව පුහුණුව:** ප්‍රායෝගික පුහුණුව සහ අත්දැකීම් ලබා දීම සඳහා තාක්ෂණික සමාගම් සමඟ හවුල්කාරිත්වයෙන් ආධුනිකත්ව වැඩසටහන් සංවර්ධනය කිරීම.

### ඊ-පාලනය සහ ඩිජිටල් සේවා

- **රාජ්‍ය සේවය ඩිජිටල්කරණය:** පොදු සේවාවන් විධිමත් කිරීමට, විනිවිදභාවය වැඩි කිරීමට සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමට විද්‍යුත් රාජ්‍ය වේදිකා ක්‍රියාත්මක කිරීම.
- **ඩිජිටල් හැඳුනුම්පත් පද්ධතිය:** රාජ්‍ය සේවා සහ මාර්ගගත ගනුදෙනු සඳහා ආරක්ෂිත සහ පහසු ප්‍රවේශය සඳහා සැම පුරවැසියෙකුටම උපතේදීම ඩිජිටල් හැඳුනුම්පතක් හඳුන්වා දීම.
- **තොරතුරු සඳහා පහසු ප්‍රවේශය:** විනිවිදභාවය වැඩි දියුණු කිරීමට මෙන්ම නවෝත්පාදනයන් පෝෂණය කිරීමට, දත්ත මත පදනම් වූ තීරණ ගැනීම සක්‍රිය කිරීමට තොරතුරු සඳහා සැමට පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම.

### සයිබර් ආරක්ෂාව සහ දත්ත ආරක්ෂාව

- **ජාතික සයිබර් ආරක්ෂණ උපාය මාර්ගය:** තීරණාත්මක යටිතල පහසුකම් සහ සංවේදී දත්ත ආරක්ෂා කිරීම සඳහා පුළුල් සයිබර් ආරක්ෂණ උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- **දත්ත ආරක්ෂණ නීති:** පුරවැසියන්ගේ තොරතුරුවල පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා දැඩි දත්ත ආරක්ෂණ නීති බලාත්මක කිරීම.
- **සයිබර් ආරක්ෂණ පුහුණුව:** දක්ෂ සයිබර් ආරක්ෂණ ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා පුහුණුව සහ සම්පත් සැපයීම.

### ගෝලීය සහයෝගිතාව

- **ජාත්‍යන්තර හවුල්කාරිත්වයන්:** දැනුම සහ සම්පත් බෙදාගැනීම සඳහා විද්‍යාව හා තාක්ෂණය තුළ ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් සහ සහයෝගිතාවයන් වර්ධනය කිරීම.
- **තාක්ෂණික රාජ්‍ය තාන්ත්‍රිකත්වය:** ගෝලීය තාක්ෂණික ක්ෂේත්‍රයේ ප්‍රධාන භූමිකාවක් ශ්‍රී ලංකාවට හිමිකර ගැනීමටත් විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමටත් රාජ්‍යතාන්ත්‍රික ව ක්‍රියාකිරීම.
- **ගෝලීය කුසලතා ආකර්ෂණය:** සුවිශේෂී තාක්ෂණික දැනුමෙන් හෙබි ලොව පුරා විසිර සිටින ශ්‍රී ලාංකිකයන් මව්බිමේ තාක්ෂණික අභිවෘද්ධිය සඳහා ආකර්ෂණය කර ගැනීමේ වැඩසටහනක් දියත් කිරීම.

# ජාතික සමගිය - 'එකම මුතු'

මව්බිමේ සහෘත්වය මත පදනම්ව සමාජ විවිධත්වයට ගරු කරන එකමුතු ජාතියක් ගොඩනැගීම.

## පොදු වටිනාකම් ප්‍රවර්ධනය

- **සංස්කෘතික අධ්‍යාපනය:** සිංහල බෞද්ධ මූලධර්ම සහ හරයන් පිළිබඳ ඉගැන්වීම් අධ්‍යාපන පද්ධතියට එකතු කරන අතර ම, සෙසු ආගම් හා සංස්කෘතීන් පිළිබඳ අවබෝධය ද ප්‍රවර්ධනය කිරීම.
- **මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර:** දයාව, කරුණාව, ඉවසීම, අන්‍යෝන්‍ය ගරුත්වය වැනි ආගමික ඉගැන්වීම්වල පොදු ගුණාංග පිළිබඳ දැනුවත් කිරීම.

## අන්තර් ආගමික හා අන්තර් සංස්කෘතික සංවාද

- **සංවාදශීලී වේදිකා:** අන්තර් ආගමික හා අන්තර් සංස්කෘතික සංවාද සඳහා වේදිකා ඇති කිරීමෙන් විවිධ ජනවර්ග හා ආගමික ප්‍රජාවන් අතර අන්‍යෝන්‍ය අවබෝධය මෙන්ම සහයෝගිතාව ඉහළ නැංවීම අපේක්ෂිතය.
- **අන්තර් ප්‍රජා සබඳතා:** විවිධ ප්‍රජා කණ්ඩායම් අතර නොයෙක් සාමූහික ක්‍රියාකාරකම්, සංස්කෘතික විවිධත්වය ඔප් නංවන උත්සව ආදිය සංවිධානය කිරීම මගින් අන්තර් සම්බන්ධතා වර්ධනය කිරීම.

## ජාතික අනන්‍යතාව

- **ජාතික සංකේත:** රටේ උරුමය පිළිබිඹු කරන්නා වූ ජාතික සංකේත හා සංකල්ප ප්‍රවර්ධනය කරනු ඇත. එමගින් එකී උරුමය පිළිබඳ ධනාත්මක හැඟීම් පුරවැසියන් තුළ ජනිත කිරීම.

## සංවර්ධනයේ ප්‍රතිලාභ සැමට

- **පොදු ප්‍රතිපත්ති:** සියලු ප්‍රජාවන්ට ස්වකීය වාර්ගික හෝ ආගමික පසුබිම මත වෙන් කිරීමකින් තොරව සම්පත් සහ අවස්ථා වෙනුවෙන් සාධාරණ ප්‍රවේශය සහතික කිරීම පිණිස ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ඇත.
- **ප්‍රාදේශීය සංවර්ධනය:** ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී විෂමතාවන්ට පිළියම් යෙදීම කෙරෙහි අවධානය යොමු කරමින් සෑම පළාතකම සංවර්ධනය සාපේක්ෂව සම මට්ටමකට ගෙන ඒමට කටයුතු කිරීම.

## ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම

- **සමථකරණ සේවා:** අන්තර් ආගමික සහෝදරත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ග්‍රාමීය මට්ටමෙන් අන්තර් ආගමික කමිටු පිහිටුවීම.
- **සාම අධ්‍යාපනය:** සාම අධ්‍යාපනය පාසල් විෂය මාලාවට ඇතුළත් කරනු ඇති අතර, එමගින් යොවුන් වියේ පටන්ම සමගියේ වැදගත්කම ඉගැන්වීම් සහ ගැටුම් නිරාකරණ දැනුම ලබාදීම සිදු වේ.

## සංස්කෘතික උරුමය ප්‍රවර්ධනය හා සංරක්ෂණය

- **සංස්කෘතික සංරක්ෂණ ව්‍යාපෘති:** ශ්‍රී ලංකාවේ ජීවත්වන සියලු ප්‍රජාවන්ට අයත් සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීම.
- **සංස්කෘතික හුවමාරු වැඩසටහන්:** විවිධ ප්‍රජාවන්ට අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාගේ සිරිත් විරිත් සහ සම්ප්‍රදායයන් ගැන දැනුවත්වීමට සහ බෙදු හදු ගැනීමට හැකි වන පරිදි සංස්කෘතික හුවමාරු වැඩසටහන් සඳහා පහසුකම් සැලැස්වීම.

## ජාතික උත්සව හා සැමරුම්

ප්‍රධාන ආගමික සහ සංස්කෘතික උත්සව සාමූහික ව සැමරීම දිරි ගැන්වීම.

# වැවිලි, කෘෂිකර්මය සහ පශු සම්පත් - 'ගොවිවරු'

සොබා සම්පත් තිරසර ලෙස භාවිත කරමින් ද නාස්තිය අවම කරමින් ද නැවුම් තාක්ෂණය මුසුකරමින් ද ගොවිජනතාවගේ ජීවන තත්ත්වය නංවාලමින් ද සැමට සැම දින නැවුම්, පිරිසිදු, පෝෂ්‍යදායි ආහාර සැපයීම.

## ප්‍රතිපත්තිමය ඒකාග්‍රතාවයක්

- විවිධ අමාත්‍යංශ, රාජ්‍ය ආයතන සහ නියෝජිත ආයතන අතර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය බෙදී විසිරී ගොස් ඇති හෙයින් එම විෂයට අයත් සියලු අංශ එක් අමාත්‍යාංශයක් යටතට ගෙන ඒම.
- **බැංකු ක්‍රමය:** යෝජිත සංවර්ධන බැංකුව යටතේ ගොවිජන සංවර්ධන බැංකුවක් ස්ථාපනය කිරීම.

## කෘෂි ව්‍යවසායකත්වය

- ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කෘෂි ව්‍යවසායකත්වය වෙත පරිවර්තනය කරමින් ශ්‍රී ලාංකික ගොවියා ව්‍යවසායකයෙකු 'ගොවිවිරු' - දැයක් නංවන වාරුව බවට පත් කෙරෙන වැඩපිළිවෙළක් ඇති කිරීමෙන් කෘෂි කර්මාන්තයෙන් වේගයෙන් ඉවත් වන තාරුණ්‍යයට, එය වඩාත් ඵලදායක හා ආකර්ෂණීය ක්ෂේත්‍රයක් බවට පත්කිරීම.
- සාමූහික ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමෙන්, ව්‍යාපාරයක පරිමාණය ඉහළ නැංවීමෙන් ලැබෙන ප්‍රතිලාභ අත්කර දීම සඳහා ග්‍රාමීය ආර්ථිකයේ හැකි සෑම ක්ෂේත්‍රයකම සමූපකාර ආකෘතියේ සමිති සමාගම් පිහිටුවීම.
- ජාතියට බත සපයන ගොවියාගේ ආදායම ඉහළ නැංවීම සඳහා රාජ්‍ය මැදිහත් වූ උපාය මාර්ගික වෙළෙඳපොළ මිල නියාමනයක් ඇති කිරීම.
- කුඹුරු යායක් එකතු කොට මහා පරිමාණ ගොවිතැන සඳහා සමුපකාර ආකෘතියේ සමාගම් පිහිටුවීම මගින් කුඹුරු සකස් කිරීමේ සිට සහල් නිපදවා ඇසුරුම් කොට තමන්ගේම යන්ත්‍ර සූත්‍ර භාවිත කරමින් සන්නාමයක් ලෙස වෙළෙඳපොළට ගෙන යාම මගින් ඔවුන්ගේ සාමූහික ප්‍රයත්නයට සුපිරි ලාභයක් ලබාගැනීමේ අවස්ථාව සලසා දීම.
- එළවළු, පලතුරු හෝ වෙනත් භෝග වැවීම සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිත කරමින් වෙළෙඳපොළ ඉල්ලුමට ගැළපෙන සැපයුමක් තහවුරු කිරීම සඳහා ජාතික භෝග වගා සැලැස්මක් හඳුන්වා දෙන අතර එය කළමනාකරණය කිරීම සඳහා ආයතනයක් ස්ථාපිත කරනු ලබන අතර එමගින් මෙතෙක් ඇති වූ අධි හෝ අව සැපයුම් තත්ත්වයන් දුරු කිරීම.
- අස්වැන්න නෙළා ගැනීමේදී සහ පසු අස්වනු හානිය අවම කර ගැනීම සඳහා ප්‍රාදේශීය ව එකතු කිරීමේ, ගබඩා කිරීමේ සහ අගය එකතු කිරීමේ සුහුරු මධ්‍යස්ථාන ඇති කිරීම.
- පස සරුකිරීම සඳහා 'පාංශු සෞඛ්‍යය නිර්ණය' භාවිත කිරීමෙන් වඩාත් කාර්යක්ෂමව පොහොර හෝ වෙනත් සංඝටක පසට එකතු කිරීමේ විද්‍යාත්මක වැඩපිළිවෙළක් සැකසීම. එමගින් අස්වැන්න මත පැටවෙන අනවශ්‍ය වියදම් කපා හැරීම සහ තිරසර පරිසර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
- සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍ර හා එක්ව ඒකාබද්ධ ආහාර ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීම මගින් කෘෂි ව්‍යවසායකයින් ඉහළට එසවීම.
- අන්තර්ජාතික 'සන්නාම' හා බැඳුණු සමාගම් හා එක්ව උපාය මාර්ගික වැඩපිළිවෙළක් ඔස්සේ ආර්ථික වශයෙන් වඩාත් ලාභදායි භෝගයන් ප්‍රවර්ධනය කිරීම සහ 'විශේෂ අගය එක්වීම්' මගින් ලැබෙන සුපිරි ලාභයේ කොටස්කාරයෙකු වීමට කෘෂි ව්‍යවසායකයින්ට අවස්ථාව සලසා දීම.
- දැනට පිහිටුවා ඇති කෘෂි පර්යේෂණ ආයතන, සමීක්ෂණ ආයතන, කෘෂි සංවර්ධන ආයතන සියල්ල ඒකාබද්ධ කර මධ්‍යගත ආයතනයක් පිහිටුවීම.
- දේශීය බීජ නිෂ්පාදනයට ප්‍රමුඛත්වය ලබාදීම හා ඕනෑම තත්ත්වයකට ඔරොත්තු දිය හැකි බීජ හඳුන්වාදීමට ප්‍රමුඛත්වය ලබා දීම.

### කෘෂිකර්ම නිෂ්පාදන හුවමාරුවක්

- පාරිභෝගිකයාට ද නිෂ්පාදකයාට ද සාධාරණ මිලක් මෙන්ම ඉහළ ප්‍රමිතියක් සහතික කරමින් විදේශීය තාක්ෂණික සහාය ලබාගෙන කොළඹ කොටස් වෙළෙඳපොළ වැනි ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන හුවමාරුව නමින් භාණ්ඩ හුවමාරුවක් (Commodity Exchange) ස්ථාපිත කෙරේ.

### කාබනික කෘෂිකර්මාන්තය

- ගෝලීය වශයෙන් විශාල ඉල්ලුමක් පවතින කාබනික කෘෂි නිෂ්පාදන විධිමත් ලෙස ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම.

### වාරි කර්මාන්තය

- ජල සම්පත සුරකිමින් ගඟ, ඔය, වැව්, ඇල-දෙළ, දෙපා, දියකඩිති, ළිං, පොකුණු සමස්තයක් ලෙස ගෙන ජාතික ඒකාබද්ධ වාරි කළමනාකරණ වැඩසටහනක් දියත් කිරීම.
- සභ්‍යත්වයේද කෘෂිකර්මාන්තයේද වැදගත් කොටසක් වූ අපේ වාරි ශිෂ්ටාචාරය නැවත පණ ගන්වමින් තිස්පන් දහසක් පමණ වූ වැව් පද්ධතිය සාමූහික දයකත්වය මත ප්‍රතිසංස්කරණය කිරීමෙන් ගමට පණ දීම.

### වැවිලි භෝග

- අපනයන භෝග සම්බන්ධයෙන් අලුත් සහ දියුණු වෙළෙඳපොළක් හඳුන්වා දෙමින් තම අස්වැන්න තම ගොවිපොළේ සිට උපරිම අගය එකතු කිරීම දක්වා ගෙන යාමත් 'ගොවියා' ව්‍යවසායකයෙකු බවට පරිවර්තනය කොට එමගින් උපරිම ලාභ ලැබීමටත් කටයුතු කිරීම.
- ඌන උපයෝගිතා ඉඩම් කාර්යක්ෂමව යොදගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම.
- අස්වනු ඉහළ නැංවීම සඳහා දියුණු ප්‍රභේද හඳුන්වා දීම.

### පශු සම්පත්

- මස්, කිරි, බිත්තර ගොවීන් පශු ව්‍යවසායකයින් බවට පත්කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම වෙනුවෙන් 'සමුපකාර' සංකල්පය යොද ගත් සමාගම් ප්‍රවර්ධනය කිරීම.
- මස් සහ බිත්තර සඳහා මාර්ගගත වෙන්දේසියක් ඇරඹීම තුළින් නිෂ්පාදකයින්ට සහ පාරිභෝගිකයින්ට සාධාරණ මිලක් ලබා දීම.
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නවීකරණය කොට බලගැන්වීම මගින් නිෂ්පාදන පිරිවැය අවම කිරීම සහ සැපයීමේ උච්ඡාවචනය නිසා ඇතිවන මිල වෙනස්වීම් වැනි තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

# නීල ආර්ථිකය - 'නිල්වන්'

සමුද්‍රීය සම්පත් තිරසර ලෙස භාවිත කරමින් ද ශ්‍රී ලංකාවේ භූමිය මෙන් සත් ගුණයක් විශාල අනන්‍ය ආර්ථික කලාපය, විසිතුන් ගුණයක් පමණ විශාල මහද්වීපික තඩාගය සතු මහා සාගර සම්පත් සහ ශ්‍රී ලංකාවේ සියලුම අභ්‍යන්තර ජලාශවල උපරිම උපයෝජනය මව්බිම වෙත දයාද කිරීම.

## නීල සම්පත් හඳුනාගැනීම සහ කළමනාකරණය

- අභ්‍යන්තර සහ සමුද්‍රීය ජලජ සම්පත් පිළිබඳ පූර්ණ විද්‍යාත්මක සමීක්ෂණයක් සිදුකිරීම තුළින් ධීවර අස්වැන්න සමුද්‍රීය ඛනිජ සම්පත් වැනි ස්වාභාවික සම්පත් හඳුනාගැනීමට මෙන්ම සංචාරක කර්මාන්තයේ අවස්ථාවන් පිළිබඳ පූර්ණ ඇගැයීමක් කිරීම.
- මහාද්වීපික තඩාගය සතු සම්පත්, මුහුද මත, මුහුද තුළ සහ මුහුද යට පවතින විභව සම්පත් උකහා ගැනීමට අවශ්‍ය තාක්ෂණය හා ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා සාගර සම්පත් අධිකාරියක් පිහිටුවීම.
- මෙම අනන්‍ය ආර්ථික කලාප ප්‍රසස්ථ උපයෝජනය තුළින් සිය ආර්ථික අභිලාශයන් ළඟාකරගෙන ඇති රාජ්‍යයන් සමග එක්ව ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම එම සම්පත් රාජ්‍යයේ දියුණුවට පාවිච්චි කිරීම සඳහා වැඩපිළිවෙළ සැකසීම.

## ධීවර සංවර්ධන අධිකාරිය

- ලංකා ධීවර සංස්ථාව හා ධීවර වරාය නීතිගත සංස්ථාව ඒකාබද්ධ කිරීමෙන් කාර්යක්ෂම ධීවර සංවර්ධන අධිකාරියක් බිහි කිරීම.

## ධීවර සම්පත් ආශ්‍රිතව අගය එකතුකිරීම සහ අපනයන ප්‍රවර්ධනය

- ධීවර අපනයන අංශයේ උසස් සන්නාම සංවර්ධනය සඳහා පිරිසැකසුම් ආදී ක්‍රම මගින් අගය එකතු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන, පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාමාර්ග ගැනීම.

## ධීවර ප්‍රජාව

- ධීවර ප්‍රජාවට සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළ සඳහා විශේෂ අරමුදලක් හඳුන්වා දීම.
- ධීවර ශ්‍රමිකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා නූතන විධිමත් පුහුණු පාඨමාලා හඳුන්වාදීම සහ ධීවරයන් පුහුණු කිරීම.

## මිරිදිය ධීවර කර්මාන්තය

- අපගේ දිවයින තුළ ඇති සියලු වැව්, ගංගා, ඇල-දෙළ භාවිත කරමින් වඩාත් සංවිධිත හා විද්‍යාත්මක 'මිරිදිය' මත්ස්‍ය ප්‍රවර්ධනයක් සඳහා පවතින පරිපාලන යාන්ත්‍රණය සුසමාදර්ශී වෙනසකට ලක් කිරීම.
- මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය අගය එක් කළ නිෂ්පාදනයක් බවට පත්කිරීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය ව සැකසුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම.
- මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සහ ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම.

## සාගර මත්ස්‍ය කර්මාන්තය

- ශ්‍රී ලංකාව දිවයිනක් වීම හේතුවෙන් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට නම් උපාය මාර්ගිකව අපගේ ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන්ම සුසමාදර්ශී වෙනසකට බඳුන් කළ යුතු වේ.
- එක්දින යාත්‍රා ධීවර කාර්මිකයින්ට ව්‍යවසායකත්ව මානසිකත්වය ගොඩනැගීමට හා නිෂ්පාදනවලට අගය එකතුකිරීමට අවශ්‍ය පුහුණුව, විධික්‍රම සහ අවශ්‍ය ප්‍රාග්ධනය සපයනු ඇත.

## බහු දින යාත්‍රා ධීවර කර්මාන්තය

- මෙම කර්මාන්තය දියුණු කිරීම සඳහා රජය මැදිහත්ව ඉතාමත් සහනදායි පොලියට ණය ලබා දෙමින් මෙම යාත්‍රා ප්‍රමාණය වැඩි කරන අතර, එම යාත්‍රා තුළ ඇති පයහසුකම් වර්ධනය කෙරේ.

## අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති

- දේශීය ජලජ ශාබ ඇතුළු සියලුම සමුද්‍රීය සම්පත් ඵලදායීව යොදා ගැනීම සඳහා තාක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම.
- ජල සම්පත් ආශ්‍රිත සංචාරක කර්මාන්තය වර්ධනය සඳහා පියවර ගැනීම.

# කර්මාන්ත - 'පන්නරය'

නවෝත්පාදනය හා ඉහළ ඵලදායීතාවය මත ගුණාත්මක රැකියා අවස්ථා බිහිකරමින් ශ්‍රී ලංකාව තුළ දේශීය නිෂ්පාදනය වැඩි කිරීම හා ආනයන මත යැපීම අවම කිරීම අරමුණු කරගෙන නව ආයෝජන සඳහා පරිසරය නිර්මාණය කරන ව්‍යවසායකත්ව රාජ්‍යය තුළ ප්‍රමුඛතාවය මත තෝරාගත් කර්මාන්ත සංවර්ධනය කිරීම.

## කර්මාන්ත ප්‍රතිපත්තිය

- දේශීය කර්මාන්ත දිරිගැන්වීම අරමුණු කරගත් සියලු අංශ ආවරණය කෙරෙන කර්මාන්ත ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුව සඳහා කෘෂිකර්මාන්තය, අධ්‍යාපනය, යටිතල පහසුකම් සහ මූල්‍ය ආදී විවිධ ක්ෂේත්‍රයන් හා සබැඳුණු පොදු උපාය මාර්ගික වැඩසටහනක් දියත් කිරීම.
- විදේශ විනිමය ඉපැයීම සහ ඉතිරි කරගැනීම සඳහා සියලු ඛනිජ සම්පත් නිස්සාරණය කොට අගය එකතු කිරීම සඳහා ජාතික මට්ටමේ මහා පරිමාණ කර්මාන්ත පද්ධතියක් සඳහා ආයෝජනය කිරීම.
- බදු සහන, නව තාක්ෂණය, ජාත්‍යන්තර සහාය සහ අරමුදල් ලබාදීමෙන් කර්මාන්ත සඳහා ආයෝජනය දිරිමත් කිරීම.
- නව නිර්මාණකරුවන් බිහිකිරීම, විශ්වවිද්‍යාල ඇතුළු පර්යේෂණ ආයතන සඳහා ලබා දෙන ප්‍රතිපාදන ඉහළ දැමීම තුළින් නව්‍ය උත්පාදන ක්‍රියාවලියකට කර්මාන්ත ක්ෂේත්‍රය යොමු කිරීම.

## ආනයන මත යැපීම අවම කිරීම

- **සැපයුම් දාම ශක්තිමත් කිරීම:** දේශීය සැපයුම් දාම ශක්තිමත් කිරීමට ආයෝජනය කිරීම හා විදේශ සැපයුම් දාම සමග සම්බන්ධතාවය වර්ධනය කිරීම.
- **කර්මාන්ත පුරවර පුළුල් කිරීම:** දේශීය හා ජාත්‍යන්තර ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා යටිතල පහසුකම් සහ නියාමනය සහිත දැවැන්ත කර්මාන්ත පුරවර බිහි කිරීම.
- **විශේෂ ප්‍රාගුණ්‍ය:** ශ්‍රී ලංකාවට උචිත කර්මාන්ත තෝරා වර්ධනය කිරීමට අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම.
- **තීරු බදු හා ආනයන ආදේශක:** දේශීය ව්‍යවසායකයන් ආරක්ෂා කිරීම සඳහා තීරු බදු විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ පැනවීම හා ආනයන ආදේශක ප්‍රවර්ධනය.

## ප්‍රාග්ධනය සහ ආයෝජන

- **මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ:** අඩු පොලී ණය සහ දිගු කාලීන මූල්‍ය පහසුකම් ලබාදීමෙන් කර්මාන්ත ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම.
- **බැංකු ක්‍රමය:** යෝජිත සංවර්ධන බැංකුව යටතේ කර්මාන්ත සංවර්ධනය කේන්ද්‍ර කරගත් අංශයක් ස්ථාපිත කිරීම තුළින් තරුණ කර්මාන්තකරුවන් දිරිගැන්වීම.
- **ආණ්ඩුව සහ ව්‍යවසායකයන් අතර හවුල්කාරීත්වය:** තරුණ ව්‍යවසායකත්ව අධිකාරියක් පිහිටුවමින් තරුණ ව්‍යවසායකයින් කර්මාන්ත ක්ෂේත්‍රයට ආකර්ශනය හා ආණ්ඩුව ප්‍රධානතම මිල දී ගන්නා ලෙස කටයුතු කරමින්, අවදානම් බෙදා ගැනීම සහ සම්පත් පොදුවේ භාවිත කිරීම මගින් කර්මාන්ත ක්ෂේත්‍රය දිරි ගැන්වීම.

## රැකියා කුසලතා ඉහළට

- **වෘත්තීය අධ්‍යාපනය:** නූතන තාක්ෂණික කර්මාන්ත සඳහා අවශ්‍ය වෘත්තීය අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ලංකාවේ සියලුම කාර්මික විද්‍යාල වෘත්තීය අධ්‍යාපන ආයතන, වෘත්තීය පුහුණු අධිකාරිය ඇතුළු රාජ්‍ය ආයතන හා එවැනි පෞද්ගලික ආයතන ඒකාබද්ධ කරමින් පස්අවුරුදු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- **ඉහළ කුසලතා අවශ්‍ය ක්ෂේත්‍ර ප්‍රවර්ධනය:** නැනෝ තාක්ෂණය, ජීව විද්‍යා තාක්ෂණය, තොරතුරු තාක්ෂණය වැනි ඉහළ වැටුප් ලබා ගත හැකි දියුණු තාක්ෂණික ක්ෂේත්‍රවල කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
- **පුහුණු ශ්‍රම ප්‍රතිපත්ති:** කුසලතා පරිපූර්ණ පුහුණු ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය.

### දුෂ්කර ප්‍රදේශ කාර්මීකරණය:

- **කෘෂි හා කාර්මික දෙමුහුන් පර්ෂද:** කෘෂිකර්මික නිෂ්පාදන මත පදනම් වූ කාර්මික නිෂ්පාදන ප්‍රාදේශීය ව නිෂ්පාදනය කිරීම මගින් රැකියා අවස්ථාවන් ජනිත කිරීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල කෘෂි හා කාර්මික දෙමුහුන් පර්ෂද බිහි කිරීම.
- **දුෂ්කර ප්‍රදේශවල කර්මාන්ත දිරිගැන්වීම:** දුෂ්කර ප්‍රදේශවල කර්මාන්ත බිහිකිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සහ බදු සහන යනාදිය ලබාදීමෙන් රාජ්‍ය සහාය තහවුරු කිරීම.

### කාර්මික තාක්ෂණය

- **ජාත්‍යන්තර සහයෝගිතාවය:** ජාත්‍යන්තර සහයෝගිතාවය හරහා කෘත්‍රිම බුද්ධිය (AI) ඇතුළු නවීන තාක්ෂණය ලංකාව තුළට ගෙන ඒමට අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම.
- **සුහුරු නිෂ්පාදන විද්‍යාගාර:** ත්‍රිමාණ මුද්‍රණය, IOT, රොබෝ තාක්ෂණය වැනි නූතන තාක්ෂණික ක්‍රමවේදයන්ගෙන් සන්නද්ධ වූ නිෂ්පාදන තාක්ෂණය ඉලක්ක කරගත් විද්‍යාගාර බිහිකිරීම තුළින් කුඩා පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදනයන්ට සහාය වීම.
- **බ්ලොක්චේන් තාක්ෂණය:** ලෝක වෙළෙඳපොළේ නව ප්‍රවණතාවයන්ට මුහුණ දීම සඳහා සැපයුම් ජාලය ක්‍රමවත්ව පවත්වාගෙන යෑමට බ්ලොක්චේන් තාක්ෂණය හඳුන්වා දීම.
- **කර්මාන්ත සඳහා බලශක්තිය:** කර්මාන්ත සඳහා සහන මිලට බලශක්ති සම්පාදනය.

### ඉදිකිරීම් කර්මාන්ත

- අමුද්‍රව්‍ය මිල පහත හෙළීම සඳහා ආනයනික අමුද්‍රව්‍ය දේශීය ව නිෂ්පාදනය කිරීම දිරිමත් කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.
- ඉදිකිරීම් කර්මාන්තය පසුබැසීමට හේතුවක් වන ප්‍රාග්ධන වියදම අඩුකිරීම සඳහා කාර්මික සහ නිවාස ඉදිකිරීම් සඳහා විශේෂ අඩුපොලී ණය පහසුකම් ලබා දීම.
- මහ පරිමාණ රාජ්‍ය ඉදිකිරීම් සඳහා දේශීය ඉදිකරන්නන් හට ප්‍රමුඛතාවය ලබා දීම.
- දේශීය ඉදිකරන්නන් යොදාගෙන කරන මහ පරිමාණ පෞද්ගලික ඉදිකිරීම් සඳහා බදු සහන ලබා දීම.
- දේශීය කර්මාන්තකරුවනට අවශ්‍ය තාක්ෂණික මගපෙන්වීම හා යටිතල පහසුකම් සමග AI තාක්ෂණය පහසුවෙන් ලබාගත හැකි මධ්‍යස්ථාන පළාත් මට්ටමින් පිහිටුවාලීමට පියවර ගනු ලැබේ.

# නාවික, ගුවන් සහ අභ්‍යන්තර ප්‍රවාහන යටිතල පහසුකම් - 'ජීව නාලිකා'

වරායන් සහ ගුවන් තොටුපොළ ආශ්‍රිතව බැඳුණු නාවික සහ ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රය නූතනකරණය කිරීම තුළින් හා උපාය මාර්ගික පිහිටීමේ උපරිම පල නෙලාගනිමින් ශ්‍රී ලංකාව සමෘද්ධිය සහ නාවික කේන්ද්‍රයක් බවට පත් කිරීම.

## වරාය නවීකරණය

- **වරාය යටිතල පහසුකම් සංවර්ධනය:** කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය ආදී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වරායයන් සංවර්ධනය කිරීමට ආයෝජනය කිරීම තුළින් බහාලුම් සහ නෞකා හැසිරවීමේ ධාරිතාවය වැඩි කිරීම.
- **සුහුරු වරාය තාක්ෂණය:** ස්වයංක්‍රිය භාණ්ඩ හැසිරවීම, ඩිජිටල් ආවේක්ෂණ පද්ධති, කෘතිම බුද්ධිය මත පදනම් වූ සැපයුම් පද්ධති වැනි සුහුරු වරාය තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම තුළින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

## නාවික සේවා

ව්‍යාපාර ක්ෂේත්‍රයක් ලෙස නාවික කර්මාන්ත සේවා සැපයීම සඳහා පොදු-පෞද්ගලික ව්‍යවසායකත්වයන් උනන්දු කෙරෙන සහ වඩාත් අවස්ථාවන් සැලසෙන අයුරින් කටයුතු කිරීම.

## ගුවන්තොටුපොළ

- **ගුවන්තොටුපොළ සංවර්ධනය:** නූතන ලෝකයට ගැළපෙන ලෙස සහ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ද ඇතුළු සංවර්ධන උපාය මාර්ගය ට උචිත පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පුළුල් කිරීම. මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ කරා ගුවන් සේවාවන් ආකර්ෂණය කර ගනිමින් පුළුල් ගුවන් මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම.
- **ප්‍රාදේශීය ගුවන්තොටුපොළ සංවර්ධනය:** ප්‍රාදේශීය ගුවන්තොටුපොළ සංවර්ධනය කිරීම තුළින් දේශීය ගුවන් ගමනාගමනය පුළුල් කිරීම.
- **ගුවන් ගමනාගමන කළමනාකරණය:** ශ්‍රී ලංකා ගුවන් අවකාශයෙහි ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ ධාරිතාව ඉහළ නැංවීම සඳහා නවීන තාක්ෂණයෙන් යුතු ගුවන් ගමනා ගමන කළමනාකරණ පද්ධති සඳහා ආයෝජනය කිරීම.
- **එකිනෙකට බැඳුණු ප්‍රවාහන පද්ධති:** වරාය, ගුවන්තොටුපොළ, අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග එකිනෙකට සම්බන්ධ කිරීම තුළින් අභ්‍යන්තරික ප්‍රවාහනය විධිමත් කිරීම.
- **ජාත්‍යන්තර සබඳතා:** ගෝලීය සැපයුම් සහ ගුවන් සමාගම් සමග උපාය මාර්ගික හවුල්කාරිත්වයක් ඇති කිරීම තුළින් වරාය සහ ගුවන්තොටුපොළ ජාත්‍යන්තර ප්‍රවාහන ක්ෂේත්‍රයට අනුබද්ධ කිරීම.

## මහාමාර්ග පද්ධතිය

- **ප්‍රධාන අධිවේගී මාර්ග:** උපාය මාර්ගිකව රටේ සියලුම ප්‍රදේශ ආවරණය වන අයුරින් සියලුම ප්‍රදේශ, ගුවන්තොටුපොළ, වරාය ආදී මර්මස්ථාන එකිනෙකට බැඳෙන ආකාරයෙන් අධිවේගී මාර්ග ජාලය පුළුල් කිරීම.
- **මහාමාර්ග සහ ග්‍රාමීය මාර්ග:** මගී පහසුව මෙන්ම ව්‍යවසායකත්වයන් දිරිමත් වන ආකාරයෙන් රට තුළ ධනය ගලා යෑමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට නිෂ්පාදන හා සේවා මෙන්ම පුද්ගල ඵලදායිතාවය ඉහළ නැංවීම වෙනුවෙන් රටපුරා ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා ව්‍යාපෘතියක් ඇරඹීම.

# ප්‍රවාහනය - 'ගතට සතුට'

නවීන තාක්ෂණය මුසුකරමින් කාර්යක්ෂම, තිරසර, සුවපහසු, ආරක්ෂිත ප්‍රවාහන සේවයක් දැරිය හැකි මිලකට ලබා දීම.

### මගී ප්‍රවාහනය

- දුම්රිය, බස්, බෝට්ටු සහ කුලී රථ සේවා ඒකාබද්ධ කරමින් ප්‍රවාහන සැලැස්මක් නිර්මාණය කිරීම.
- නවීන තාක්ෂණය යොදා ගැනීම සහ අතිරේක ආදායම් ජනිත කරගැනීමෙන් දුම්රිය සේවය ලාභදායි ව්‍යාපාරයක් බවට පත්කිරීම.
- රට පුරා විහිදී යන පරිදි දුම්රිය සේවය ව්‍යාප්ත කිරීම.
- දුම්රිය යටිතල පහසුකම් කාර්යක්ෂමව යොදාගැනීම සඳහා විද්‍යාත්මකව සැකසුණු යාන්ත්‍රණයක් සැකසීම.
- දිගු ගමන් බස් සේවා වඩාත් සුවපහසු කිරීමේ අරමුණින් පොදු ප්‍රවාහනය සහ පෞද්ගලික ප්‍රවාහනය සඳහා 'ප්‍රමිතිගත' වාහන පමණක් භාවිත කරනු ඇත.
- රාජ්‍ය බහුතර කොටස් අයිතිය සහිත රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් තුළින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සම්පූර්ණයෙන් ප්‍රතිව්‍යුහගත කරමින් නවීකරණය කෙරෙනු ඇත.
- පෞද්ගලික බස් ප්‍රවාහන සේවයේ ව්‍යවසායකත්වය දියුණු කිරීමට රජයේ අඛණ්ඩ සහාය තහවුරු කරනු ඇත.
- බස් සහ දුම්රිය නැවතුම්පොළ නවීකරණය සහ අලංකරණය කරමින් මගීන්ගේ සුවපහසුව තහවුරු කිරීම සඳහා පෞද්ගලික ව්‍යවසායකත්වයේ සහාය ලබා ගැනීම.

### නාගරික සහ කෙටි ගමන් ප්‍රවාහනය

- කොළඹ නගරයට රාජකාරි හා අනෙකුත් අවශ්‍යතා සඳහා පැමිණෙන මගී ජනතාවගේ දුෂ්කරතා හා පීඩා සමනය කොට ඔවුනගේ පහසුව ඇති කරන විදුලියෙන් ධාවනය කෙරෙන, වායුසමනය කරන ලද නවීන 'මෙට්රෝ' පන්නයේ දුම්රිය සේවාවක් පවතින යටිතල පහසුකම් උපයෝගි කර ගනිමින් කොළඹ අවට තදසන්න කළුතර, පොල්ගහවෙල, මීගමුව, රඹුක්කන හා අවිස්සාවේල්ල යන නගරවල සිට කඩිනමින් ආරම්භ කිරීම.
  මේ සඳහා අවශ්‍ය වන ප්‍රාග්ධනය කොළඹ කොටස් වෙළෙඳපොළ හරහා කඩිනමින් ණයකර නිකුත් කිරීම මගින් සම්පාදනය කරගැනීම.
- නාගරික ප්‍රවාහනය දියුණු කිරීම සඳහා උපාය මාර්ගික ලෙස කොළඹ ඇතුළු ප්‍රධාන නගර ආවරණය වන ලෙස නගරය තුළ 'චක්‍රාකාරී' බස් මාර්ග හඳුන්වා දෙනු ඇති අතර, ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් නිශ්චිත කාල සටහනකට බස් ධාවනය කරනු ලබන අතර, එමගින් ඕනෑම අයෙකුගේ ජංගම දුරකථනයකින් ධාවන වේලාවන් දැනගැනීමට පහසුව සැලසීම.
- ගොඩවීමේ හා ගොඩබැසීමේ පහසුව, ප්‍රමාද අවම කරගැනීම සහ ආබාධිත පුද්ගලයින්ගේ පහසුව තහවුරු කිරීමට පහත් තට්ටුවකින් යුත් බස් යෙදවීම තුළින් ක්‍රමානුකූලව දැනට ඇති බස් ඉවත් කිරීම.
- වාහන තදබදය අවම කර ගැනීම සඳහා සතියේ තෝරා ගත් දිනයන් හිදී උපරිම මගීන් ගෙන යන ත්‍රිරෝද යතුරුපැදි ඇතුළු පෞද්ගලික වාහන සඳහා ප්‍රමුඛතා මං තීරුවක් ඇති කරනු ඇත.
- නාගරික ප්‍රදේශවල පාපැදි භාවිතය ප්‍රචලිත කිරීම.
- ත්‍රිරෝද රථ හිමියන්ට සහන ණය මත මෝටර් රථ ලබාදෙමින් ත්‍රිරෝද රථ භාවිතය ක්‍රමානුකූලව ඉවත් කිරීම.

# බලශක්තිය - 'බලයෙන් බලවත්'

දැරිය හැකි මිලකට සැමට සැම විට බලශක්තිය සපයමින් බලශක්ති සුරක්ෂිතභාවය තහවුරු කිරීම.

## බලශක්ති කේන්ද්‍රයක් බවට පත් කිරීම

ශ්‍රී ලංකාවේ පිහිටීමේ සුවිශේෂත්වය උපයෝගී කරගනිමින් බොරතෙල් ආනයනය කර බනිජ තෙල් නිෂ්පාදන අපනයනය කරමින් ද ඉන්ධන ගබඩා පහසුකම් සැපයීමෙන් ද හරිත හයිඩ්‍රජන් අපනයනය කරමින් ද නැව් සහ ගුවන් යානාවලට ඉන්ධන සපයමින් ද ශ්‍රී ලංකාව ආසියාවේ බලශක්ති කෙන්ද්‍රය ලෙස සංවර්ධනය කිරීම.

## පුනර්ජනනීය ප්‍රභවයන් සඳහා ආයෝජනය

- බලශක්ති මිශ්‍රණය විවිධාංගීකරණය කිරීමට සහ පොසිල ඉන්ධන මත යැපීම අවම කිරීම, සූර්ය, සුළං, ජල හා ජෛව ස්කන්ධ වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සඳහා ආයෝජනය ඉහළ නැංවීම.
- විවිධ හේතු මත අඩපණ වී ඇති පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සක්‍රිය කිරීම.
- 2035 වන විට විදුලිබල පද්ධතියේ 70%ක් පුනර්ජනනීය බලශක්තිය මත පදනම් වීම සඳහා ආයෝජන සිදුකිරීම.

## ප්‍රජාපාදක පුනර්ජනනීය ව්‍යාපෘති

- ජාතික හා ආර්ථික ප්‍රතිලාභ ලබා දෙමින් ප්‍රාදේශීය ප්‍රජාවන්ට තම බලශක්ති උත්පාදනය කිරීමට සහ කළමනාකරණය කිරීමට ඉඩ සලසන ප්‍රජා පාදක පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම.

## පුනර්ජනනීය බලශක්ති සඳහා දිරිගැන්වීම

- පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය අනුගමනය කිරීම සඳහා ව්‍යාපාර සහ කුටුම්භ සඳහා හුරුකරවාලන්නට දිරිදෙමින් සහනාධාර සහ ප්‍රදාන ලබා දීම.

## බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය

- ජාතික බලශක්ති කාර්යක්ෂමතා සැලැස්ම නේවාසික, වාණිජ, කාර්මික ඇතුළු සියලු අංශ හරහා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා පුළුල් ජාතික සැලැස්මක් දියත් කිරීම.
- **බලශක්ති ඉදිකිරීමේ තාක්ෂණය:** එල්ඊඩී ආලෝකකරණය, බලශක්ති කාර්යක්ෂම උපකරණ සහ ස්මාර්ට් මීටර් වැනි බලශක්ති ඉදිකිරීමේ තාක්ෂණය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම.

## දේශීය ප්‍රභවයන් භාවිත කිරීම

- දැනට තහවුරු වී ඇති ස්වාභාවික වායු සම්පත විදුලි නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා තෙවසරක කඩිනම් වැඩසටහනක් දියත් කිරීම.
- මන්නාරම් මුහුදේ සුළං බලශක්ති ශක්‍යතාව භාවිත කර හරිත හයිඩ්‍රජන් නිපදවීමට විදේශීය ආයෝජකයින් සමග හවුල් ව්‍යාපාර ඇරඹීම.
- මන්නාරම් සහ කාවේරි ද්‍රෝණිවල බනිජ තෙල් ගවේෂණයට විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට ප්‍රචාරක ව්‍යාපෘතියක් දියත් කිරීම.
- ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණ කඩිනමින් අලුත්වැඩියා කර භාවිතයට ගැනීම.

## මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර

- බලශක්ති සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීම සහ බලශක්ති පරිභෝජනය අඩු කරන්නේ කෙසේද යන්න පිළිබඳව උපදෙස් සැපයීම සඳහා ව්‍යාපාර දියත් කිරීම.

- **ජාතික බලශක්ති ප්‍රතිපත්තිය:** විවිධ රජයන් විවිධ අවස්ථාවන්හිදී විවිධ හේතූන් නිසා විටින් විට ප්‍රදර්ශනාත්මකව කරනු ලබන ප්‍රතිපත්ති වෙනස්කම් නැවැත්වීම පිණිස ප්‍රායෝගික ජාතික බලශක්ති ප්‍රතිපත්තියක් සකස් කොට පනතක් ලෙස සම්මත කර ගනු ඇත.
- **දැරිය හැකි විදුලිබලය:** දීර්ඝකාලීන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙතින් අඩු මිල විදුලිබල ජනනය සිදු වන තුරු අන්තර්කාලීන බලශක්ති විකල්ප ද්‍රවීකෘත (LNG) ස්වාභාවික වායු, වහාම භාවිතය අරඹනු ඇත.

## පුනර්ජනන බලශක්ති ප්‍රවර්ධනය

- **ජාතික බලශක්ති කාර්යක්ෂමතා සැලසුම:** ගෘහස්ත වාණිජ හා කාර්මික සියල්ලම ආවරණය වන පරිදි බලශක්ති කාර්යක්ෂමතාව සඳහා ජාතික ප්‍රතිපත්තියක් විධිමත් ජාතික සැලැස්මක් හඳුන්වා දෙනු ඇත.
- කාර්යක්ෂම විදුලි උපාංග හා පරිභෝජන ක්‍රමෝපායන් භාවිතය හඳුන්වා දීම සහ හුරු කිරීම.
- **සුහුරු විදුලිබල පද්ධතීන්:** විදුලිබල පද්ධතිය කාර්යක්ෂම සහ විශ්වසනීයත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා සුහුරු පද්ධති තාක්ෂණයන් සඳහා ආයෝජනය කරනු ඇත.
- **බලශක්ති ගබඩා කිරීමේ විසඳුම:** ජලය පොම්ප කර ගබඩා කිරීම සහ විදුලිකෝෂ ආදියෙහි විදුලිබලය ගබඩා කරමින් අපතේ යැම වළක්වාලීමට සහ විශ්වාසවන්ත ලෙස බලශක්තිය සැපයීම සඳහා බලශක්ති ගබඩා කිරීම.
- **යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම:** විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම අතර සිදුවන අනවශ්‍ය අපතේ යැම් වළක්වා ගැනීම සඳහා සමස්ත විදුලිබල පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කරගැනීමට විදුලිබල පද්ධතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

# දේශපාලන ප්‍රතිසංස්කරණ - 'උඩු ගං බලා'

ප්‍රජාතන්ත්‍රවාදී අගයයන් ඔප් නැංවන, දේශපාලකයින් විසින් ප්‍රායෝගික පොරොන්දු ජනතාවට ලබා දෙන, දුන් පොරොන්දු ඉටු කරන වගවීමේ දේශපාලන සංස්කෘතියක් බිහි කිරීම.

### නව ව්‍යවස්ථාව

- ජනාධිපති විධායකයේ ප්‍රධානියා ද කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා ද සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක ද වේ. ආරක්ෂක ඇමති ධූරය එතුමා විසින් දැරිය යුතුය. අන් සියලු අමාත්‍ය ධූර සඳහා අගමැතිගේ එකඟතාව මත පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පත් කළ යුතුය.
- විධායක ජනාධිපති ධූරය පාර්ලිමේන්තුවට වග කියන අධිකරණයට යටත් ධූරයක් බවට පත් කිරීම.
- ජනාධිපතිවරයාට එරෙහිව නඩු පැවරීම සඳහා අධිකරණයේ පූර්ව අවසරය ලබා ගැනීමත් ජනාධිපති පෞද්ගලිකව අධිකරණයේ පෙනී සිටීමට අවශ්‍ය නොවීමත් යන කොන්දේසිවලට යටත්ව ජනාධිපතිවරයාට ලබා දී ඇති මුක්තිය සම්පූර්ණයෙන් ඉවත් කිරීම.
- ජනාධිපතිවරයාගේ කටයුතුවලට පාර්ලිමේන්තුවේ දී පිළිතුරු ලබා දෙන ජනාධිපති කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ධූරයක් ඇති කිරීම.
- ජනාධිපති කටයුතු අධීක්ෂණය කරන ආංශික කාරක සභාවක් ස්ථාපිත කිරීම සහ ජනාධිපති ලේකම්, කාරක සභාව සෑහීමකට පත්වන අයුරින් පිළිතුරු ලබා දීමට අසමත් වන විට ජනාධිපතිවරයා කාරක සභාවට කැඳවිය හැකි වීම.
- ජනාධිපති කටයුතු පිළිබඳ මාස තුනකට වරක් පාර්ලිමේන්තුවේ විවාදයක් පවත්වන අතර එහි පිළිතුරු කතාව සඳහා ජනාධිපති පෞද්ගලික ව සහභාගි වීම.
- මැතිවරණ වියදම සහ ප්‍රචණ්ඩත්වය අවම කරන ජනතාවට සෘජුව වග කියන මහජන නියෝජිතයින් බිහි කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකටම වෙන් වී ඇති මන්ත්‍රීවරුන්ගෙන් 70%ක් කොට්ඨාශ මට්ටමින් ද 30%ක් සමානුපාතික ක්‍රමයට ද තෝරා ගන්නා අයුරින් නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම.

### යුතුකම් පිළිබඳ නව පරිච්ඡේදයක්

- ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය, ඒ අයිතිවාසිකම් භුක්ති විඳින රටවැසියාගේ යුතුකම් පිළිබඳ පරිච්ඡේදයකින් ඌණපූර්ණය කරනු ලැබේ. එය අපගේ මව්බිමෙන් ලෝකයට කෙරෙන මඟ පෙන්වීමක් ද වනු ඇත.

### දේශපාලන වගවීම

- ජනාධිපති අපේක්ෂකයා විසින් වසර පහකට බෙදූ වැඩසටහනක් ලෙස සිය මැතිවරණ ප්‍රකාශනය එළි දැක්විය යුතු වීම.
- සෑම වියදම් යෝජනාවකටම ඒ සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගන්නා ආකාරය ද දක්වා තිබිය යුතු වීම.
- ආණ්ඩුව විසින් සිය මැතිවරණ ප්‍රකාශනය නිසි පරිදි ක්‍රියාත්මක කරන බවට අධීක්ෂණය කිරීම සඳහා අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් ද වෘත්තීයවේදීන්, විද්වතුන් සහ ව්‍යවසායකයින් සාමාජිකත්වය දරන ජාතික පසුවිපරම් සභාව පිහිටුවීම.
- ඒ ඒ අමාත්‍යාංශය විසින් එක් එක් වසරේ දී ඉලක්ක සැපිරීමේ ප්‍රගතිය දැක්වෙන වාර්ෂික ප්‍රගති වාර්තාවක් පසුවිපරම් සභාව විසින් නිකුත් කිරීම. යම් අමාත්‍යාංශයකට යම් ඉලක්කයක් ළඟා කර ගැනීමට නොහැකි වීමට සාධාරණ හේතු ඇත්නම් එකී හේතු ද ප්‍රගති වාර්තාවේ දැක්විය යුතුය. යම් අමාත්‍යාංශයක් සාධාරණ හේතු නොමැතිව යම් වගකීමක් පැහැර හැර ඇත්නම් ඊට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට ජනතාවට අවස්ථාව තිබිය යුතුය.
- වාර්ෂික ප්‍රගති වාර්තාවේ සෑම අමාත්‍යාංශයක්ම ශ්‍රේණිගත කළ යුතු අතර යම් අමාත්‍යාංශයක් වසර තුනක් අඛණ්ඩව අවසන් ස්ථානයට පැමිණ ඇත්නම් එකී අමාත්‍යාංශය භාර ඇමතිවරයා සහ ලේකම්වරයා ඉවත් කළ යුතුය.

### අමාත්‍යාංශ බෙදීම

- තාර්කික ක්‍රමවේදයකට විෂයයන් බෙද උපරිම වශයෙන් කැබිනට් අමාත්‍ය ධුර 25ක් සහ නියෝජ්‍ය අමාත්‍ය ධුර 35ක් දක්වා සීමා කිරීම.
- සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ට ම විධායකයට සම්බන්ධ විය හැකි අයුරින් සෑම අමාත්‍යවරයෙකු ට ම උපදෙස් ලබාදීමට විධායක කාරක සභා බිහි කිරීම.
- මන්ත්‍රීවරයෙකු පක්ෂය මාරු කිරීම හෝ පක්ෂයේ මතයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීම හෝ සිදු කළහොත් මන්ත්‍රීවරයා කොට්ඨාශයක නියෝජිතයෙක් නම් ඔහුගේ ස්ථාවරයට මහජන අනුමැතිය ලබාගැනීම සඳහා අතුරු මැතිවරණයක් පැවැත්වීම. මන්ත්‍රීවරයා සමානුපාතික නියෝජනය / ජාතික ලැයිස්තුව මත පත්වූවෙක් නම්, ඔහුට තමා ගත් ස්ථාවරය මැතිවරණ ප්‍රතිඥාවලට එකඟ බව අධිකරණයේදී පෙන්වා සිටීමට හැකිවිය යුතුය.

### සම්මත වූ පනත් අධිකරණය හමුවට

- පාර්ලිමේන්තුව විසින් සම්මත කළ සෑම පනතක් නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීම හෝ ව්‍යවස්ථාවට පටහැනි වීම හෝ මත අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කිරීමට ජනතාවට අවස්ථාව සැලසෙන අයුරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

### පළාත්පාලන ආයතන

- **බලාත්මක කිරීම:** තෝරාගත් පළාත් සභා විෂයයන් පළාත් පාලන ආයතනවලට පැවරීමෙන් එම ආයතන තවදුරටත් බලාත්මක කිරීම.
- **ස්ථාවර කිරීම:** පවතින මැතිවරණ ක්‍රමයෙන් අස්ථාවර පළාත් පාලන ආයතන බිහිවන බැවින් කොට්ඨාශ ක්‍රමයට පත්වන මන්ත්‍රීවරුන් ගණන 60% සිට 70% දක්වා ඉහළ නැංවීමෙන් ද පළාත් පාලන බලසීමාව තුළ වැඩිම ඡන්ද ලබාගත් දේශපාලන පක්ෂයට ප්‍රසාද මන්ත්‍රී ධුරයක් පිරිනැමීමෙන් ද පළාත් පාලන ආයතනයේ පාලනය ස්ථාවර ව කිරීම.
- **මන්ත්‍රී ධුර ගණන අඩුකිරීම:** විශාල පළාත් පාලන මන්ත්‍රීවරුන් ගණන් සිටීම රටට බරක් වී ඇති බැවින් එම මන්ත්‍රී ධුර ගණන පන්දහස දක්වා අඩු කිරීම.

### වගවීම

- දේශපාලන පක්ෂවල නිලධාරීන්, මාධ්‍ය ආයතන හිමියන්, මාධ්‍යවේදීන්, ජාතික මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන සහ වෘත්තීය සමිති නායකයින් සිය වත්කම් සහ බැරකම් වාර්ෂිකව ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර එම වගකීම පැහැර හරින අය ප්‍රසිද්ධ කිරීම සහ නීතියෙන් දඬුවම් කිරීම.
- සෑම දේශපාලන පක්ෂයක්ම විගණනය කරන ලද සිය ගිණුම් සය මසකට වරක් ප්‍රසිද්ධ කිරීම.

### මාධ්‍ය නිදහස

- ආණ්ඩුකරණය පිළිබඳව හා රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳව පාරදෘශ්‍යභාවයෙන් යුතුව සියලු තොරතුරු ජනතාවට නිරාවරණය කර ගැනීමට ඇති අයිතිය රජය විසින් පිළිගනු ලැබේ. ඒ අනුව සියලු ආකාරයේ මාධ්‍යයන්ට හා මාධ්‍යවේදීන්ට රාජ්‍යයේ ආරක්ෂාව භෞමික අඛණ්ඩතාවය, රාජ්‍යයේ පැවැත්ම අභියෝගයට ලක්වන තොරතුරු, රාජ්‍ය රහස් හැර වෙනත් ඕනෑම තොරතුරක් සද්භාවයෙන් යුතුව වාර්තා කිරීමට, පරිහරණය කිරීමට, විවේචනය කිරීමට ඇති භාෂණයේ නිදහස අප විසින් පිළිගනිමින් තහවුරු කරනු ලැබේ.

# ණය කළමනාකරණය

කෙටිකාලීනව ආර්ථිකයට බරක් නොවන අයුරින් ණය සකසා ගනිමින් ආදායම ඉහළ නැංවීම සහ සකසුරුවම හරහා ණය ගන්නා ජාතියක් නොව ණය දෙන ජාතියක් ලෙස පරිවර්තනය වීම.

### බහුපාර්ශ්වික, ද්විපාර්ශ්වික, විදේශීය වාණිජ සහ සහතික කළ විදේශීය ණය

- අද වනවිට සමස්ථ විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 37ක් වන අතර ඉන් බිලියන 12ක් බහුපාර්ශ්වීය ණය වන අතර බිලියන 10ක් ද්විපාර්ශ්වීය ණය වේ. සෙසු බිලියන 15 ස්වෛරී බැඳුම්කර මූලික වූ වාණිජ ණය වේ.

  දැනටමත් බහුපාර්ශ්වීය හා ද්විපාර්ශ්වීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ එක් අංගයක් ලෙස ණය ගෙවීම සඳහා කල් ලබාගැනීමට සාකච්ඡා කරමින් පවතින තත්ත්වයක් තුළ එමගින් මතුවිය හැකි යථාර්ථය වන්නේ යම් හෙයකින් එවැනි දිගුවක් ලබාගතහොත් එම මුළු කාලය තුළම මේ ණය මත පොලිය එක්වීමෙන් තව තවත් ණය බර වැඩිවීමයි.

  එසේම වාණිජ ණය නොහොත් දැනටමත් කල් ඉකුත් වී ඇති සහ ඉදිරියේදී කල් ඉකුත් වීමට නියමිත අන්තර්ජාතික ස්වෛරී බැඳුම්කර සම්බන්ධව ප්‍රාග්ධනයෙන් කොටසක් බැඳුම්කර හිමියන්ගේ එකඟතාවයෙන් යම් ණය ප්‍රතිශතයක් කපා හැරීමට සාකච්ඡා සිදු වෙමින් පවතී.

  ඉතිරි ඩොලර් බිලියන 57 දේශීය ව ගත් වාණිජ ණය වන අතර ඉතිරි බිලියන 4 සහතික කළ විදේශීය ණය වේ. මෙම ණය පිළිබඳ කටුක යථාර්ථයක් වන්නේ මෙම පොලිය සහ ප්‍රාග්ධනය ගෙවීමට කටයුතු කිරීමේ දී, ශ්‍රී ලාංකික ජනතාව මත ඉහළ බදු පනවමින් එක් අතකින් ඔවුන්ගේ ජීවන මට්ටම පහත දමන අතර විශේෂයෙන්ම අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා වෙන් කිරීමට ඇති මුදල් කප්පාදු කිරීමට සිදුවීමයි. (රජයේ ආදායමෙන් 65%ක පමණ මුදලක් වෙන් වන්නේ ණය මත ඇති පොලිය ගෙවීමට වේ.)

### විදේශ ණය කළමනාකරණය

- ආනයනයට සාපේක්ෂ ව අපනයන ආදායම වැඩි කිරීම සඳහා ආනයනය මත රඳා පවතින පාරිභෝජන අවශ්‍යතාවයන් ඉටු වන අයුරින් ජගත් ප්‍රමිතියේ දේශීය ආදේශක හඳුන්වා දීමට පියවර ගැනීම.
- ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළි ගොඩනැගීමට දයකත්වයක් දැක්විය හැකි අපනයන වෙළෙඳපොළක් ඇති, විදේශ විනිමය ගෙන ඒමට ඉහළ ශක්‍යතාවක් ඇති රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායකත්වයන් හඳුනාගෙන අපනයන වෙළෙඳපොළ ජයගැනීමට අවශ්‍ය සියලු ආකාරයේ දිරිමත් කිරීම් සහ රැකවරණ ලබා දීමට අවශ්‍ය වැඩපිළිවෙළක් හඳුන්වා දීම.
- අපනයන භාණ්ඩ සහ වෙළෙඳපොළ විවිධාංගීකරණයෙන් ද අපනයන භාණ්ඩවල එකතු කළ අගය ඉහළ නැංවීමෙන් ද අපනයන ආදායම ඉහළ නැංවීම සහ ස්ථාවර කිරීම.
- අපනයනය මගින් ලැබෙන විදේශ විනිමය එලෙසම රට වෙත ලැබෙන පාරදෘශ්‍ය ක්‍රමවේදයක් සඳහා ඩිජිටල් තාක්ෂණය යොද ගැනීම සහ අපනයනකරුවන් සිය ආදායම නිශ්චිත කාලයක් තුළ රට තුළට ගෙන එන බව තහවුරු කර ගැනීම සඳහා නීති හඳුන්වා දීම.
- සේවා ආර්ථික කටයුතු මගින් රටට ලැබෙන විදේශ විනිමය වැඩි කර ගැනීම සඳහා විශේෂ බදු සහන සහ වරප්‍රසාද හඳුන්වා දීම.
- ශ්‍රී ලාංකික විදේශ රැකියා සංයුතිය වැඩි ප්‍රතිශතයක ඇති නුපුහුණු ශ්‍රමයේ සිට වඩාත් පුහුණු ශ්‍රමය, ඉහළ තාක්ෂණ සහ විද්වත් වෘත්තීන් ලෙස වෙනස් කිරීමට කටයුතු කිරීම.
- විදේශ රැකියා මගින් දැනට ලැබෙන ප්‍රේෂණ වැඩිකර ගැනීමට මව්බිමට ලැදි ශ්‍රී ලාංකිකයින් උත්තේජනය කිරීමට සංවේදී සන්නිවේදන ව්‍යාපෘතියක් දියත් කරන අතර, වෙනත් සුවිශේෂ ක්‍රමවේදයන් හා වරප්‍රසාද ක්‍රම භාවිත කිරීම.
- තීක්ෂණ ව සැකසූ උපාය මාර්ගික වැඩපිළිවෙළක් තුළ 'ශ්‍රී ලංකා සන්නාමය' ස්ථානගත කිරීම තුළින් ඉහළ වියදමක් දැරිය හැකි සංචාරකයින් ආකර්ෂණය කිරීම මගින් දැනට පවතින සංචාරක යටිතල පහසුකම් කාර්යක්ෂම ව භාවිත කොට ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය වැඩි කර ගැනීම.

- ප්‍රමුඛතාවයක් ලෙස සලකා රටට ඍජු විදේශ ආයෝජන ලබාගැනීම සඳහා රාජ්‍ය-පෞද්ගලික ව්‍යවසායකත්වයන්, විදේශ ව්‍යවසායකත්වයන් සහ විදේශ-දේශීය හවුල්කාර ව්‍යවසායකත්වයන් දිරිමත් කිරීම සඳහා වඩාත් සුමට ක්‍රමවේදයක් ඇතුලු ආයෝජන හිතකාමී පරිසරයක් නිර්මාණය කර ගැනීමට වහා කටයුතු කිරීම.

## දේශීය ණය සහ සහතික කළ දේශීය ණය කළමනාකරණය

- රාජ්‍ය බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් ලෙස රජය ලබා ගත් ණය ප්‍රමාණය ඩොලර් බිලියන 53ක් වන අතර මෙය මහ බැංකුව, රාජ්‍ය හා පෞද්ගලික වාණිජ බැංකු සහ ප්‍රාථමික තැරැව්කාර සමාගම් හරහා ලබා ගෙන තිබේ. මෙයින් මහ බැංකුව සතු ණය දැනටමත් ප්‍රතිව්‍යුහගතකරණයට යොමුකර තිබුණ ද සෙසු දේශීය ණය එසේ ප්‍රතිව්‍යුහගත කර නොමැති තත්ත්වයක් තුළ එම ණය ද සමාන ක්‍රමවේදයක් හරහා ප්‍රතිව්‍යුහගතකරණයකට යෝජනා කරනු ලැබේ. එමගින් රජයේ වියදම මත ඇති ණය පොලිය අඩුකර ගැනීමට අපේක්ෂා කෙරේ.

- රාජ්‍ය ආදායම: ප්‍රාථමික ගිණුම් ශේෂය වැඩි කර ගැනීම අරමුණින් රාජ්‍ය ආදායම ඉහළ දැමීම සඳහා ජනතාවට දැඩි බරක් නොදෙන එහෙත් කාර්යක්ෂම හා පාරදෘශ්‍ය ක්‍රමවේදයක් භාවිත කරන අතර, ප්‍රමුඛතාවයෙන් පහළ අගයක් ඇති සියලු වියදම් පාලනයට කටයුතු කිරීම මගින් මෙම දේශීය ණය ගෙවීමට ඇති ශක්‍යතාවය ඉහළ දැමීමට කටයුතු කරනු ඇත.

සර්වජන
බලය

சர்வசன அதிகாரம் • SARVAJANA BALAYA

නො. 11, උද්‍යාන පාර, කොළඹ 08, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 7 344 321 WhatsApp: +94 770 139 139
E-mail: connect@mjp.lk

sarvajanabalaya.com

දිලිත් ජයවීර
திலித் ஜயவீர
**Dilith Jayaweera**